

2022

වාර්ෂික වාර්තාව


ஆண்டறிக்கை

ANNUAL REPORT













UCIARS

කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

கொழும்புப் பல்கலைக்கழக கமத்தொழில் தொழில்நுட்பவியல் மற்றும் கிராமிய விஞ்ஞானங்களுக்கான நிறுவனம்

University of Colombo Institute for Agro-Technology and Rural Sciences

වාර්ෂික වාර්තාව

2022

අපගේ දැක්ම

ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කරමින් ව්‍යවසායකත්ව කෘෂිකර්මය පෝෂණය කිරීම සඳහා කැප වූ ඉතා සුවිශේෂී විශිෂ්ඨ ආයතනයක් බවට පත් වීම

<u>අපගේ මෙහෙවර</u>

අතිශයින්ම ඵලදායී වන පර්යේෂණ
තොරතුරු ජනනය කිරීම සහ
නිර්මාණශීලී ව්‍යවසායකත්වයක්
සඳහා වන උපායමාර්ගික,
සහභාගීත්ව සහ සාධනීය සමාජයක්
උදෙසා මනාව හැඩගැස්වූ සහ
ස්ථිරසාර වූ විශිෂ්ඨ අධ්‍යාපනික
ක්‍රමවේදයක් තිරසාර ස්වභාවික
සම්පත් කළමනාකරණයක් තුලින්
නිර්මාණය කිරීම.

අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය:



මෙම ආයතනය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2000 වර්ෂයේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ කොට හම්බන්තොට වැලිගත්ත ප්‍රදේශයේ මාගම්පුර කෘෂි තාක්ෂණ හා ප්‍රජා සේවා මධ්‍යස්ථානය ලෙස ප්‍රථමයෙන් ස්ථාපනය කර ඇත. මෙම මධ්‍යස්ථානය 1998 වසර තරම් ඈතක දිගු ඉතිහාසයකට හිමිකම් කියන අතර විශ්ව විද්‍යාල පර්යේෂකයන් මෙම කාලය පුරා ප්‍රජාව සමග සම්බන්ධව, ඔවුන්ට තාක්ෂණය සහ දැනුම ලබා දීම සහ කලාපයේ කෘෂිකර්මය හා කෘෂි කර්මාන්තයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා සහයෝගයෙන් කටයුතු කර ඇත.

මෙම මධ්‍යස්ථානය 2008 දී කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය (UCIARS) ලෙස නම් කරන ලද අතර ශ්‍රී ලංකාවේ පුරෝගාමී ආයතනයක් ලෙස කෘෂිකාර්මික හා කෘෂි පාදක කර්මාන්තවල නියැලෙන්නන් මෙන්ම උසස් පෙළ සමත් වූ සිසුන් සඳහා කෘෂිකර්මාන්තය පදනම් කරගත් උපාධිය (කෘෂි තාක්ෂණවේදී උපාධිය) පිරිනැමීම සඳහා උසස් කරන ලදී. සියලුම පාඩම් අන්තර්ගතයන් මාර්ගගත ඉගෙනුම් කළමනාකරණ පද්ධතියේ පවතින අතර දේශන සඳහා මිශ්‍ර ඉගෙනුම් ප්‍රවේශයන් යෙදීමෙන් ප්‍රායෝගික හා ක්ෂේත්‍ර චාරිකා සංරචක සඳහා ශිෂ්‍ය දායකත්වය සැලකිය යුතු ලෙස වැඩි වී තිබේ. අපගේ අධ්‍යයන වැඩසටහන් සැලසුම් කර ඇත්තේ ගැටළු විසඳීම, විශ්ලේෂණාත්මක කුසලතා මෙන්ම ලිවීමේ හා සන්නිවේදන කුසලතා වැඩි දියුණු කිරීම සඳහා සිසුන් පුහුණු කිරීම සඳහා ය. එබැවින් ශ්‍රී ලංකාවේ අනෙකුත් රාජ්‍ය විශ්ව විද්‍යාල වලින් බිහිකරනු ලබන කෘෂිකාර්මික උපාධිධාරීන් හා සසඳන විට අපගේ සිසුන්ට වඩා හොඳ ප්‍රායෝගික දැනුමක් හා නිපුණතාවයක් ඇත.

ගොවිපල ඵලදායීතාව ඉහළ නැංවීමේ අරමුණින් කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය (UCIARS) මඟින් උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය ගොවි ප්‍රජාව වෙත සපය යි (එනම් උසස් තත්ත්වයේ පටක රෝපණය කළ කෙසෙල් පැල, දෙමුහුන් තුඹ කරිවිල පැල ආදිය). UCIARS හි තවත් වැදගත් සන්ධිස්ථානයක් වන්නේ ගොවි ප්‍රජාවේ ආදායම වැඩි දියුණු කිරීම මගින් දරිද්‍රතාවය තුරන් කිරීමේ රජයේ ප්‍රයත්නය ශක්තිමත් කිරීම සඳහා කෙසෙල්, අඹ සහ බිම්මල් වගාව ප්‍රවර්ධනය කිරීමේ තාක්ෂණික දායකත්වයයි. මෙම ආයතනයට අක්කර 40 ක බෝග හා පශු සම්පත් ආකෘති කිහිපයක් සහිත ගොවි බිම් ඇති අතර එමගින් සිසුන්ගේ ක්ෂේත්‍ර ප්‍රායෝගික හා සිසුන්ගේ හා කාර්ය මණ්ඩලයේ පර්යේෂණ සඳහා ඉඩ ප්‍රස්ථාව ලබා දේ.

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ (UCIARS) අධ්‍යක්ෂ ලෙස ‘පළමුව ගුණාත්මකභාවය' යන ආදර්ශ පාඨය අනුගමනය කරමින් අප තැබූ සෑම පියවරකදී ම අපගේ උපකුලපතිවරයා, කළමනාකරණ මණ්ඩලය සහ දැඩි කැපවීමෙන් වැඩ කළ කාර්යමණ්ඩලය විසින් ලබා දුන් විශිෂ්ඨ සහයෝගය සහ මාර්ගෝපදේශනය සිහිපත් කරමින් මගේ හෘදයාංගම කෘතඥතාව පුද කර සිටිමි. කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ (UCIARS) අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා නන් අයුරින් සහයෝගය දැක්වූ සියළු දෙනා වෙත ද මගේ ස්තුතිය පිරිනම මි.

මහාචාර්ය අසංග ඩී. අම්පිටියාවත්ත
අධ්‍යක්ෂ
කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

පටුන

පිටු අංක

1. සමාලෝචනය

1.1 හැඳින්වීම 01
1.2 කළමනාකරණ මණ්ඩලය 02
1.3 ශාස්ත්‍රීය මණ්ඩලය 03
1.4 විගණන කමිටුව 04
1.5 මූල්‍ය කමිටුව 05
1.6 ආයෝජන කමිටුව 05
1.7 සංවිධාන ව්‍යුහය 06

2. සමස්ත කාර්යසාධනය

2.1 අධ්‍යයන වැඩසටහනේ කාර්යසාධනය 11
2.2 පැළ තවාන්/ විද්‍යාගාර කාර්යසාධනය 19

3. පර්යේෂණ සහ නවෝත්පාදන 25

4. පුහුණු, වැඩමුළු සහ කාර්ය මණ්ඩල සංවර්ධනය 31

5. නවීකරණය කිරීම් සහ ඉදිකිරීම් ව්‍යාපෘති 32

6. මූල්‍ය

6.1 මූල්‍ය ප්‍රගතිය 33

පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර
ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර
ව්‍යාපෘති වියදම් පිළිබඳ (දේශීය/විදේශීය අරමුදල් සපයන) විස්තර
මූල්‍ය ප්‍රගතිය (ඉපැයූ ආදායම) පිළිබඳ විස්තර
2022 මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය

6.2 ලෝක බැංකුව අරමුදල් සපයන ව්‍යාපෘති

7. තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව 38

8. 2022 මූල්‍ය ප්‍රකාශන 41

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ අරමුණු සහ ඉලක්ක

අරමුණු		ඉලක්කයන්	උපක්‍රමයන්
අරමුණ 1	**අත්‍යවශ්‍ය ගුණාංගයන්ගෙන් හෙබි උපාධිදාරීන් බිහි කිරීම ඉහළ නැංවීම**	• දැනට පවත්නා උපාධි පාඨමාලාව සහ නව උපාධි පාඨමාලා සඳහා බඳවා ගන්නා ප්‍රමාණය වාර්ෂිකව 10% කින් වැඩි කිරීම.	• පවතින උපාධිය සඳහා ද්විත්ව ඇතුළත් වීමේ ක්‍රමවේදය හඳුන්වා දීම
		• තොරතුරු තාක්ෂණය (IT), ඉංග්‍රීසි, මෘදු කුසලතා (soft skills) සංවර්ධනය සඳහා වැඩි අවකාශයක් සහිතව (10%) විෂය මාලාව සංවර්ධනය කිරීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම.	• මෘදු කුසලතා වැඩි දියුණු කිරීමට සහාය වන විෂයයන් සමඟ විෂය මාලාව වැඩිදියුණු කිරීම
		• ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම සහ ප්‍රතිඵල මූලික අධ්‍යාපනය සහ ඇගයීම ක්‍රමයක් හඳුන්වා දීම.	• තාක්ෂණය හරහා විෂය මාලාව සහ දේශන බෙදාහැරීමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම
		• ශිෂ්‍යයින් සහ උපාධිදාරීන් විසින් බිහි කරන කෘෂි ව්‍යාපාර ප්‍රමාණය වැඩි කිරීම.	• ව්‍යවසායකත්වය සහ කෘෂි ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ සිසුන්ගේ දැනුම වැඩි දියුණු කිරීම
		• අධ්‍යයන සම්පත් සහ පුහුණු පහසුකම් වැඩි කිරීම.	• සිසුන්ගේ කුසලතා සහ ප්‍රායෝගික දැනුම වැඩිදියුණු කිරීම
අරමුණ 2	**වැඩි දියුණු කළ ව්‍යාපාරිකමය හවුල් සම්බන්ධතා සහ අන්තර්ජාතික සහයෝගීතාවය**	• පුහුණුව සහ පර්යේෂණ සහයෝගීතාව සඳහා කර්මාන්තය සමඟ අන්‍යෝන්‍ය වශයෙන් ක්‍රියාත්මක සම්බන්ධතා ඇති කිරීම.	• විවිධ ආයතන අතර සම්බන්ධතා වැඩි දියුණු කිරීම
		• කර්මාන්තයේ “චලනයන් සහ සොලවන්නන් (movers and shakers)” සහ ප්‍රාජේක්ෂ්‍ය ව්‍යවසායකයින් (promising entrepreneurs), ආරාධිත කාර්ය මණ්ඩලය ලෙස පත් කිරීම.	• නවෝත්පාදන පිළිබඳ නව තාක්ෂණයන් සහ දැනුම ලබා ගැනීම
		• රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය (PPP) පිහිටුවීම	• ඒ **සඳහා** (PPP) පහසුකම් සහ අවස්ථා ලබා දීම
අරමුණ 3	**වැඩි දියුණු කළ ශාස්ත්‍රීය පැතිකඩ (academic profile) සහ පර්යේෂණ හා ව්‍යාප්තියේ බලපෑම**	• වර්ෂ 2024 වන විට කාර්ය මණ්ඩලයෙන් 80% සඳහා පශ්චාත් උපාධි පුහුණුව ලබා දීම.	• පහසුකම් වැඩි දියුණු කිරීම සහ පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා උනන්දුවක් ඇති කිරීම
		• වර්ෂ 2022 වන විට නව අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා, 50% දක්වා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.	• ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සහ උසස්වීම් ප්‍රතිශතය වැඩි කිරීම
		• කලාපීය කේන්ද්‍රීයකරණයක් සහිත ඉහළ බලපෑම් පර්යේෂණ සිදු කිරීම සහ සුවිගත කරන ලද (indexed journals) සඟරා වල එකී සොයා ගැනීම් ප්‍රකාශයට පත් කිරීම.	• උසස් පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම සඳහා පහසුකම් පුළුල් කිරීම සහ ජාල ගොඩනැගීම

		• පර්යේෂණ සොයා ගැනීම් වාණිජකරණය කිරීම සහ තාක්ෂණ හුවමාරුව සඳහා පහසුකම් සැපයීම.	• නව තාක්ෂණය පිළිබඳ විශේෂිත දැනුම වැඩිදියුණු කිරීම සඳහා දේශීය හා ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගීතා සහ සම්බන්ධ වැඩසටහන් ආරම්භ කිරීම
		• තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හරහා ප්‍රජාවට නව තාක්ෂණ හා තොරතුරු සේවා සැපයීම.	• ප්‍රජාව සමඟ යහපත් සන්නිවේදන සබඳතාවයන් ගොඩනැංවීමට හැකි වන පරිදි තාක්ෂණය වැඩිදියුණු කිරීම
අරමුණ 4	**වැඩි දියුණු කළ යටිතල පහසුකම් හා පහසුකම්**	• අධ්‍යයන යටිතල පහසුකම් වාර්ෂිකව 20% කින් වැඩි දියුණු කිරීම හා පුළුල් කිරීම.	• නව තාක්ෂණය හරහා අධ්‍යයන පහසුකම් වැඩිදියුණු කිරීම • කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම
		• වාර්ෂිකව පර්යේෂණ පහසුකම් 20% කින් වැඩි දියුණු කිරීම හා පුළුල් කිරීම.	• පහසුකම් වැඩි දියුණු කිරීම සහ පර්යේෂණ කටයුතු සඳහා උනන්දුවක් ඇති කිරීම
		• **2024** වන විට නවාතැන් පහසුකම් **50%** කින් වැඩි කිරීම.	• නවාතැන් පහසුකම් පුළුල් කිරීම
		• හරිත අවකාශය/ හරිත තාක්ෂණය	• හරිත පරිසරය වැඩිදියුණු කිරීම
අරමුණ 5	**වැඩිදියුණු කළ පාලනය සහ මූල්‍ය කළමනාකරණය සහ විනය**	• අධ්‍යයන, පරිපාලන හා තාක්ෂණික කාර්ය මණ්ඩලයේ ශක්‍යතාවය වර්ධනය	• අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිපුණතා සහ ඵලදායී කළමනාකරණ පද්ධතිය ශක්තිමත් කිරීම • සේවා උසස්වීම් සඳහා අවස්ථා ලබා දීම
		• 2025 වර්ෂය වන විට පූර්ණ පරිගණකගත ඒකාබද්ධ කළමනාකරණ තොරතුරු පද්ධතියක් හඳුන්වා දීම	• සම්පූර්ණ පරිගණකගත ඒකාබද්ධ කළමණාකරණ තොරතුරු පද්ධතිය සමඟ සියලුම අංශ සම්බන්ධ කිරීම
		• වාර්ෂිකව 10% කින් විගණන විමසුම් අඩු කිරීම සහ වගවීම වැඩි කිරීම.	• පරිපාලන රෙගුලාසි, මූල්‍ය රෙගුලාසි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ ප්‍රාග්ධන කටයුතු පිළිබඳ සියලුම කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම.
		• සකසුරුවම්කම, කාර්යක්ෂමතාව සහ සඵලදායීතාවය වැඩි දියුණු කිරීම (**3Es)**	• සම්පත් (භෞතික, මානව සහ මූල්‍ය) බෙදාගැනීම, බාහිරින් ලබා ගැනීම සහ තාර්කිකකරණය .
		• පුහුණුව, උපදෙස්, උපදේශන, තොරතුරු සේවා, පේටන්ට් බලපත්‍ර, බලපත්‍ර, ප්‍රභූ රෝපණ ද්‍රව්‍ය විකිණීම සහ ගොවිපල හරහා ශුද්ධ ආදායම වැඩි කිරීම	• ආදායම් උත්පාදන කටයුතු හරහා ශුද්ධ ආදායම වැඩි කිරීම

1. සමාලෝචනය

1.1 හැඳින්වීම

මෙම ආයතනය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2000 වර්ෂයේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ කොට හම්බන්තොට වැලිගත්ත ප්‍රදේශයේ මාගම්පුර කෘෂි තාක්ෂණ හා ප්‍රජා සේවා මධ්‍යස්ථානය ලෙස ප්‍රථමයෙන් ස්ථාපනය කර ඇත. මෙම මධ්‍යස්ථානය 1998 වසර තරම් ඈතක දිගු ඉතිහාසයකට හිමිකම් කියන අතර විශ්ව විද්‍යාල පර්යේෂකයන් මෙම කාලය පුරා ප්‍රජාව සමග සම්බන්ධව, ඔවුන්ට තාක්ෂණය සහ දැනුම ලබා දීම සහ කලාපයේ කෘෂි කර්මය හා කෘෂි කර්මාන්තයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා සහයෝගයෙන් කටයුතු කර ඇත. මෙම ආයතනයේ නිර්මාතෘ වන්නේ කොළඹ විශ්ව විද්‍යාලයේ හිටපු උපකුලපතිනි සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හිටපු සභාපතිනී වන මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම මැතිණිය යි.

1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 24 'අ' වගන්තිය සහ 2008 අංක 02 දරණ කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන **නියමාවලිය** යටතේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය ස්ථාපිත කරන ලදී. මෙම **නියමාවලිය** 2008 අගෝස්තු මස 23 වැනි දින සිට බලාත්මක වන්නේය.

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය, කෘෂි තාක්ෂණික උපාධිය පාඨමාලාව පිරිනමනු ලබයි. කොළඹ විශ්ව විද්‍යාලීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන මෙම පාඨමාලාව ගොවි ප්‍රජාව තුළ අධ්‍යයන පරිසරයක් නිර්මාණය කිරීමේ ප්‍රධාන බාධා වන වයස, ඉඩ ප්‍රස්ථාව, කාලය සහ අධ්‍යයන **පරිසරය යන සාධක මහ හරවමින්** සාර්ථකව දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය යටතේ ඉහත කී අධ්‍යාපන අවස්ථාවන් ලබා දීමට කටයුතු කර ඇත. මෙම ආයතනය කෘෂි තාක්ෂණය හා ග්‍රාමීය විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනය ලබාදීම තුළින්, වර්තමානයේ කෘෂි තාක්ෂණය සහ කෘෂි කර්මාන්තය පිළිබඳ ව ප්‍රජාව අතර ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සිදුකර ඇත. එය ගොවි ප්‍රජාවගේ උසස් අධ්‍යාපනයට දොරටු විවෘත කිරීමේ සිහිනය සැබෑ කරමින් ඔවුන්ගේ නිවසටම දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය ඔස්සේ අධ්‍යාපනය ගෙන යමින් පුද්ගල වෙනස්කම් සිදු කිරීමට හා සමාජීය අවශ්‍යතා ඉටු කිරීමට සමත් වන්නේය. නමුත් ඔවුන්ගේ උසස් අධ්‍යාපනයට ඇති කැමැත්ත හෝ බලාපොරොත්තුව ඔවුන්ගේ පෞද්ගලික, ආර්ථික හෝ පවුල් පසුබිම හේතුවෙන් ගිලිහී යන අවස්ථාවන් දක්නට ඇත. මෙම ආයතනය ක්‍රියාත්මක කරන පාඨමාලා තෝරා ගැනීමට හා ඒවාට ප්‍රවේශ වීමේ නම්‍යශීලීත්වය නිසා දුප්පත් ග්‍රාමීය ගොවි ප්‍රජාවගේ වැඩිදුර අධ්‍යාපනය ලබන්නන්ට, නවීන තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිත කරමින් ඔවුන්ගේ අධ්‍යාපන යථාර්තය හා වෘත්තීය සමාජ අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම සඳහා සුදුසු තෝතැන්නක් බවට පත්කර ඇත.

එපමණක් නොව මෙම ආයතනය විවිධ වැඩසටහන්වලට අමතරව ඉතාමත් සාධාරණ මිලකට දේශීය ගොවි ප්‍රජාවට පටක රෝපණ කෙසෙල් පැළ නිෂ්පාදන ලබා දීමට කටයුතු කරමින් ආයතනයේ ආදායම් උත්පාදනය කිරීමට ද සමත් වී ඇත. මෙම ආයතනය දිවයින පුරා විසිරී සිටින ග්‍රාමීය ගොවි ජනතාවට පටක රෝපණ කෙසෙල් **පැළ නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය** සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු සහ සම්මන්ත්‍රණ විශාල ප්‍රමාණයක් පවත්වා ඇත. එසේම ග්‍රාමීය විද්‍යාවන්ට සම්බන්ධ නව තාක්ෂණය ගැන ගොවි ජනතාව දැනුවත් කිරීම සඳහා එම සම්පත් භාවිත කරමින් විවිධ ජාතික මට්ටමේ ප්‍රදර්ශන සඳහා සහභාගී වී ඇත.

1.2 කළමනාකරණ මණ්ඩලය

2008 අංක 02 දරණ කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලියේ 05 වන වගන්තිය ප්‍රකාරව කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය තම කළමනාකරණ මණ්ඩලය පිහිටුවා ඇති අතර උක්ත නියමාවලියේ 10 වගන්තිය ප්‍රකාරව එකී කළමනාකරණ මණ්ඩලය, ආයතනයේ අධ්‍යයන සහ විධායක මණ්ඩලය වන අතර එය පහත සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

වගු අංක 01: 2022 වර්ෂයේ කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය

නිල බලයෙන් පත්වූ සාමාජිකයින් (නියමාවලියේ දක්වා ඇති පරිදි)		
1	අධ්‍යක්ෂ- සභාපති	මහාචාර්ය ඒ. ඩී. අම්පිටියාවත්ත අධ්‍යක්ෂ (2022.03.02 දින සිට) ආචාර්ය එන්.පී.විදානපතිරණ වැඩ බලන අධ්‍යක්ෂ (2022.03.01 දක්වා)
2	නියෝජ්‍ය අධ්‍යක්ෂ	නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරක් අනුමත කර නොමැත
3	උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ලේකම් හෝ විෂයභාර ලේකම් හෝ එකී අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන විෂය සම්බන්ධයෙන් නම් කරන ලද සාමාජිකයෙකු	ටී.කේ.ඩබ්.ටී.පී.ප්‍රේමරත්න මහත්මිය සහකාර අධ්‍යක්ෂ (ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය), අධ්‍යාපන අමාත්‍යාංශය
4	කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ලේකම් හෝ එකී අමාත්‍යාංශය විසින් නම් කරන ලද සාමාජිකයෙකු	ආචාර්‍ය ඩබ්.එල්.ජී. සමරසිංහ අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ), කෘෂිකර්ම අමාත්‍යාංශය
5	මූල්‍ය විෂයභාර අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ලේකම් හෝ එකී අමාත්‍යාංශය විසින් නම් කරන ලද සාමාජිකයෙකු	-
6	විද්‍යා පීඨයේ පීඨාධිපති/ කොළඹ විශ්ව විද්‍යාලය	මහාචාර්ය ඩී.යූ.ජේ. සොන්නාදර
7	තාක්ෂණ පීඨයේ පීඨාධිපති/ කොළඹ විශ්ව විද්‍යාලය	මහාචාර්ය ජේ.කේ.ඩී.එස්. ජයනෙත්ති
8	ආයතනයේ අධ්‍යයන අංශ ප්‍රධානීන්	ආචාර්ය එන්.පී. විදානපතිරණ, කෘෂි තාක්ෂණ දෙපාර්තමේන්තුව
9	කොළඹ විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ එකඟතාවය සහිතව විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ ශාක විද්‍යා අධ්‍යයන අංශයේ අංශ ප්‍රධාන හෝ ඔහු හෝ ඇය විසින් නම් කරන ලද සාමාජිකයෙකු	ආචාර්ය එච්.එස්. කත්‍රිආරච්චි
අනිකුත් සාමාජිකයින් (නියමාවලියේ දක්වා ඇති පරිදි)		
1	කෘෂි ව්‍යාපාර කර්මාන්ත හා කෘෂි තාක්ෂණය නියෝජනය කිරීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන සාමාජිකයින් දෙදෙනෙක්	මහාචාර්ය එම්.පී.එස්. මාගමගේ කෘෂි පීඨය, සබරගමුව විශ්ව විද්‍යාලය සභාපති, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
		නීතීඥ නිරන්ජන් කෝලිත ද සිල්වා
2	පාලක සභාවේ සාමාජිකයින් අතරින් පත් කරගන්නා සාමාජිකයින් දෙදෙනෙක්	මහාචාර්ය එස්. කරුණාරත්න
		මහින්ද මඩිහේවා මහතා
3	හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් හෝ ඔහු විසින් නම් කරන ලද සාමාජිකයෙකු	එච්.පී. සුමනසේකර මහතා
4	ශාස්ත්‍රීය මණ්ඩලයේ සාමාජිකයන් අතරින් පත්කර ගන්නා සාමාජිකයෙකු	එස්.ඒ.පී. නෙල්කා මහත්මිය පාඨමාලා සම්බන්ධීකාරක
5	උපකුලපති තුමා නිර්දේශ කරනු ලබන කෘෂිකර්මය පිළිබඳ විශේෂඥයින් දෙදෙනෙක්	-

කළමනාකරණ මණ්ඩලයේ ලේකම්		
	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	එස්.ඒ.එස්. ප්‍රියදර්ශනී මහත්මිය

අධ්‍යයන හා පරිපාලන කටයුතු සමාලෝචනය කිරීම සඳහා ආයතනයේ කළමනාකාරීත්ව මණ්ඩලය වර්ෂය තුළ නිතිපතා රැස්විය. 2022 වර්ෂය තුළ කළමනාකරණ මණ්ඩලය දොළොස් (12) වතාවක් රැස්වී ඇත.

1.3 ශාස්ත්‍රීය මණ්ඩලය

ආයතනයේ අධ්‍යයන කටයුතු පිළිබඳව විමසා බැලීම සඳහා සහ එකී කටයුතු පිළිබඳව කළමනාකරණ මණ්ඩලයට නිර්දේශ කිරීම සඳහා 2021 වර්ෂයේ දී ආයතනය සඳහා ශාස්ත්‍රීය මණ්ඩලයක් පිහිටුවන ලදී. කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2008 අංක 02 දරණ නියමාවලියේ 13 (1) වගන්තියට අනුව, ශාස්ත්‍රීය මණ්ඩලයේ සාමාජික සංයුතිය පහත පරිදි වේ;

වගු අංක 02 : 2022 වර්ෂයේ ශාස්ත්‍රීය මණ්ඩලයේ සංයුතිය

1	අධ්‍යක්ෂ - සභාපති	මහාචාර්ය ඒ. ඩී. අම්පිටියාවත්ත අධ්‍යක්ෂ (2022.03.02 දින සිට) ආචාර්ය එන්.පී.විද්‍යානපතිරණ වැඩ බලන අධ්‍යක්ෂ (2022.03.01 දක්වා)
2	අධ්‍යයන දෙපාර්තමේන්තු වල ප්‍රධානීන්	ආචාර්ය එන්.පී.විද්‍යානපතිරණ කෘෂි තාක්ෂණික අධ්‍යයන අංශයේ අංශ පධාන
3	කෘෂිකර්ම හා වාරිමාර්ග අමාත්‍යාංශ වල අදාළ ලේකම්වරුන් විසින් නම් කරන ලද එකී අමාත්‍යාංශ නියෝජනය කරන නිලධාරීන් දෙදෙනකු	ආචාර්ය ඩබ්.එල්.ජී. සමරසිංහ අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ), කෘෂිකර්ම අමාත්‍යාංශය වාරිමාර්ග අමාත්‍යාංශයෙන් නිලධාරියෙකු නියෝජනය කර නොමැත.
4	එක් එක් අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් නම් කරන ලද සාමාජිකයෙකු	ආචාර්ය එස්.එස්.වීරසිංහ මහත්මිය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය (2022.08.01 දක්වා) ආචාර්ය ඩී.එම්. සී.සී. ගුණතිලක මහතා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය (2022.08.02 සිට)
5	එක් එක් අධ්‍යයන පාඨමාලාවේ සම්බන්ධීකාරකවරුන්	එස්.ඒ.පී. නෙල්කා මහත්මිය, පාඨමාලා සම්බන්ධීකාරක එස්.එල්. නවරත්න මහත්මිය, පාඨමාලා සම්බන්ධීකාරක
6	එක් එක් අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු, මහාචාර්යවරු සහ ආශ්‍රිත මහාචාර්යවරු	-
7	ඉගැන්වීමේ නියැලී සිටින ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලය අතරින් තේරී පත් වූ සාමාජිකයින් දෙදෙනෙකු, ඉහත (6) තුළට අයත් නොවන සාමාජිකයන්	එල්.එම්. රිෆ්නාස් මහතා, කථිකාචාර්ය (පරිවාස) කේ.ජී.කෙටිපෙආරච්චි, කථිකාචාර්ය (පරිවාස)
ශාස්ත්‍රීය මණ්ඩලයේ ලේකම්		
	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	එස්.ඒ.එස්. ප්‍රියදර්ශනී මහත්මිය

අධ්‍යයන කටයුතු සමාලෝචනය කිරීම සඳහා ආයතනයේ ශාස්ත්‍රීය මණ්ඩලය පිහිටුවීමෙන් පසු වර්ෂය තුළ නිතිපතා රැස් විය. ශාස්ත්‍රීය මණ්ඩලය 2022 වර්ෂය තුළ දොළොස් (12) වාරයක් රැස්වී ඇත.

1.4 විගණන කමිටුව

ආයතනයේ විගණන කමිටුව යනු අභ්‍යන්තර විගණන වාර්තා සහ බාහිර (රජයේ) විගණන වාර්තාවල කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා ආයතනයේ කළමනාකරණ මණ්ඩලයට සහාය වන අනු කමිටුවකි. විගණන කමිටුවේ සභාපතිත්වය දරනු ලබන්නේ කළමනාකරණ මණ්ඩලයේ නම් කරන ලද සාමාජිකයෙකු විසිනි. අධ්‍යක්ෂ, කෘෂි තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධාන, සහකාර මූල්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී කමිටුවේ ආරාධිතයන් වන අතර රැස්වීමේ කැඳවුම්කරු වන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරයාය. විගණන කමිටුවේ රැස්වීම් සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයින්ට සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අභ්‍යන්තර විගණකවරයාට ආරාධනා කෙරේ.

ආයතනයේ විගණන කමිටුව සෑම වර්ෂයකම කාර්තුමය වශයෙන් රැස් වේ.2022 වර්ෂය තුල විගණන කමිටුව හතර (04) වරක් රැස් වී ඇත.

2022 වර්ෂය තුල විගණන කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

වගු අංක 03: 2022 වර්ෂය තුල විගණන කමිටුවේ සංයුතිය

1	සභාපති/කළමණාකරණ මණ්ඩලයේ නම් කරන ලද සාමාජිකයකු	නීතීඥ එන්.කේ.ද සිල්වා
2	කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් අතුරෙන් නම් කරන ලද අනෙකුත් සාමාජිකයින්	ආචාර්ය ඩබ්.එල්.ජී. සමරසිංහ අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ), කෘෂිකර්ම අමාත්‍යාංශය මහාචාර්ය ඩී.යූ.ජේ. සොන්නාදර විද්‍යා පීඨයේ පීඨාධිපති/ කොළඹ විශ්ව විද්‍යාලය
3	භාණ්ඩාගාර නියෝජිත	ඩබ්.ජී.එන්. අබේවික්‍රම මහතා, ප්‍රධාන ගණකාධිකාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ හම්බන්තොට
4	විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිත	ඩබ්.ඒ.ඒ. අනුරුද්ධ මහතා විගණන අධිකාරී, රජයේ විගණන අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ හම්බන්තොට
5	විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිත	ජානක බෝගමුව මහතා අභ්‍යන්තර විගණක/විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6	කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ නියෝජිතයන්	මහාචාර්ය ඒ. ඩී. අම්පිටියාවත්ත අධ්‍යක්ෂ (2022.03.02 සිට) ආචාර්ය එන්.පී.විදානපතිරණ වැඩ බලන අධ්‍යක්ෂ (2022.03.01 දක්වා) ඒ.ඩී.පී.දි සොයිසා මහත්මිය සහකාර මූල්‍යාධිකාරී/UCIARS එස්.ඒ.එස්. ප්‍රියදර්ශනී මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
8	**විගණන කමිටුවේ ලේකම්**	කේ.ඊ.ඩබ්ලිව් ජයසිරී මහතා/එස්.පී.ජී.නිහාල් ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක, කොළඹ විශ්වවිද්‍යාලය

1.5 මූල්‍ය කමිටුව

මූල්‍ය කමිටුව යනු ආයතනයේ මූල්‍ය ක්‍රියාකාරකම් විධිමත් කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පිහිටුවන ලද උපදේශක කමිටුවක් සහ අනුකමිටුවකි. ආයතනය සඳහා මූල්‍ය කමිටුව පිහිටුවීම සඳහා 2008 අංක 02 දරන කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ නියමාවලියෙහි ප්‍රතිපාදන නොමැති බැවින්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අභ්‍යන්තර විගණන චක්‍රලේඛ 2021.10.06 දිනැති ලිපි අංක 01/2021 ප්‍රකාරව කළමනාකරණ මණ්ඩලය 2022.05.27 දින පැවති එහි 96 වැනි රැස්වීමේදී UCIARS සඳහා පහත සාමාජික සංයුතිය සහිතව කළමනාකරණ මණ්ඩලයේ අනු කමිටුවක් ලෙස මූල්‍ය කමිටුවක් පිහිටුවීමට නිර්දේශ කර ඇත (සාමාජික ධුර කාලය පත් කළ දින සිට වසර තුනක කාලයකි). පාලක සභාව 2022.07.20 දින පැවති 597 වැනි රැස්වීමේදී මූල්‍ය කමිටුව පිහිටුවීමට කළමනාකරණ මණ්ඩලයේ තීරණය තවදුරටත් නිර්දේශ කළ අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2022.10.06 දින පැවති 1087 වැනි රැස්වීමේදී ඒ සඳහා අනුමැතිය ලබා දී ඇත.

වගු අංක 04: 2022 වර්ෂය තුල මූල්‍ය කමිටුවේ සංයුතිය

1	අධ්‍යක්ෂ - සභාපති	මහාචාර්ය ඒ. ඩී. අම්පිටියාවත්ත
2	කළමණාකරණ මණ්ඩලයේ සාමාජිකයන් අතුරෙන් නම් කරන ලද සාමාජිකයින් දෙදෙනෙක් (අදාල වේ නම් මූල්‍යකරණය පිළිබඳ විශේෂඥ දැනුම ඇති එක් නියෝජිතයක් සමග)	1. එම්. මඩිහහේවා මහතා 2. ටී.කේ.ඩබ්.ටී.පී. ප්‍රේමරත්න, අධ්‍යාපන අමාත්‍යාංශය
3	ආයතනයේ සියලුම අධ්‍යයන දෙපාර්තමේන්තු වල අංශ ප්‍රධානීන්	ආචාර්ය එන්.පී. විදානපතිරණ, අංශ ප්‍රධාන - කෘෂි තාක්ෂණ දෙපාර්තමේන්තුව
4	ආයතනයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/සහකාර ලේඛකාධිකාරී (අදාල පරිදි)- සාමාජික	එස්.ඒ.එස්. ප්‍රියදර්ශනි මහත්මිය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
5	ආයතනයේ නියෝජ්‍ය මූල්‍යාධිකාරී/ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී /සහකාර මූල්‍යාධිකාරී (අදාල පරිදි) -සාමාජික සහ කැඳවුම්කරු	ඒ.ඩී.පී. දි සොයිසා මහත්මිය, සහකාර මූල්‍යාධිකාරී
6	ආයතනය අනුයුක්ත කර ඇති විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය අභ්‍යන්තර විගණක/ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක/සහකාර අභ්‍යන්තර විගණක - නිරීක්ෂක	කේ.ඊ්.ඩබ්ලිව් ජයසිරී මහතා/එස්.පී.ජී.නිහාල් ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක, කොළඹ විශ්වවිද්‍යාලය
7	නිරීක්ෂක ලෙස කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරිගේ නියෝජිතයකු	කේ.එස්.ටී.එස්. ජයසූරිය මහත්මිය, මූල්‍යාධිකාරී/කොළඹ විශ්වවිද්‍යාලය

ආයතනයේ මූල්‍ය කමිටුව පළමු රැස්වීම 2022.09.13 වන දින පවත්වන ලදි. 2022 වර්ෂය තුලදී කමිටුව දෙවරක් (02) පවත්වා ඇත.

1.6 ආයෝජන කමිටුව


ආයතනයේ ආයෝජනවලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා පහත සඳහන් සාමාජික සංයුතිය සහිතව කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය සඳහා ආයෝජන කමිටුවක් පිහිටුවීමට කළමනාකරණ මණ්ඩලය අනුමත කරන ලදී.

වගු අංක 05: 2022 වර්ෂය තුල ආයෝජන කමිටුවේ සංයුතිය

1	අධ්‍යක්ෂ - සභාපති	මහාචාර්ය අසංග ඩී. අම්පිටියාවත්ත
2	කළමනාකරණ මණ්ඩලයෙන් නම් කරන ලද සාමාජිකයකු	එම්. මඩිහහේවා මහතා
3	කොළඹ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීගේ නියෝජිතයකු	ටී.ඩී.ඩී. පතිරණගේ මහත්මිය, නියෝජ්‍ය ලේඛකාධිකාරී, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
4	කොළඹ විශ්වවිද්‍යාලයේ මුල්‍යාධිකාරීගේ නියෝජිතයකු	ජී.එච්. ගාමිණි මහතා, නියෝජ්‍ය මූල්‍යාධිකාරී, මූල්‍ය අංශය, කොළඹ විශ්වවිද්‍යාලය
5	ආයතනයේ නියෝජ්‍ය මූල්‍යාධිකාරී/ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී /සහකාර මූල්‍යාධිකාරී (අදාල පරිදි) -සාමාජික සහ කැඳවුම්කරු	ඒ.ඩී.පි. ද සොයිසා මහත්මිය, සහකාර මූල්‍යාධිකාරී

ආයතනයේ ආයෝජන කමිටුවේ පළමු රැස්වීම 2022.09.28 දින පවත්වන ලදි. 2022 වර්ෂය තුලදී ආයෝජන කමිටුව එක් වරක් (01) රැස්වී ඇත.

1.7 සංවිධාන ව්‍යුහය



ප්‍රවාහ සටහන් 1 - සංවිධාන ව්‍යුහය

2. **සමස්ත කාර්යසාධනය**


ආයතනයේ ප්‍රමුඛ කාර්යභාරය වනුයේ කෘෂි තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව ක්‍රියාත්මක කිරීම, පටක රෝපණ කෙසෙල් පැළ, කෝමාරිකා පැළ, කහ පැළ නිෂ්පාදනය සහ අනෙකුත් ගොවිපොළ නිෂ්පාදන වල නිරත වීමයි.

2022 වර්ෂය තුළ දී ආයතනයේ කෘෂි තාක්ෂණික අධ්‍යයන අංශය හරහා අධ්‍යයන ක්‍රියාකාරකම් ද පැළ තවාන් හා විද්‍යාගාර භාවිතයෙන් පටක රෝපිත පැළ නිෂ්පාදනය ද සිදුකරන ලදී.

67 දෙනකුගෙන් යුතු කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව ආයතනය සිය ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට කටයුතු කරන ලදී. කාර්ය මණ්ඩලයෙන් 3% ක් පරිපාලන, 13.4% ක් අධ්‍යයන/අධ්‍යයන සහායක (ස්ථිර), 13.4% ක් අධ්‍යයන (පැවරුම්/තාවකාලික) සහ 70.1% ක් අනධ්‍යයන (ස්ථිර/පැවරුම්) කාර්යමණ්ඩලයෙන් සමන්විත වේ (වගු අංක 04 සහ රූප සටහන අංක 01). 2022.12.31 දිනට ආයතනයේ අනුමත තනතුරු සහ දැනට පවතින තනතුරු සංඛ්‍යාව පිළිබඳව වගු අංක 05 විස්තර කරයි.

වගු අංක 06 : 2022 වර්ෂයේ ආයතනයේ කායීය මණ්ඩලය

කායීය මණ්ඩල වර්ගීකරණය	**සේවක සංඛ්‍යාව**
පරිපාලන	3
අධ්‍යයන/අධ්‍යයන සහායක (ස්ථිර)	8
අධ්‍යයන (පැවරුම්/තාවකාලික)	9
අනධ්‍යයන	47
මුළු කාර්ය මණ්ඩලය	**67**



රූප සටහන 01 : 2022 වර්ෂයේ ආයතනයේ කායීය මණ්ඩලය

වගු අංක **07 : 2022.12.31** දිනට ආයතනයේ අනුමත තනතුරු සහ දැනට පවතින තනතුරු සංඛ්‍යාව

තනතුරු නාමය		සේවා ගණය	ශ්‍රේණිය	වැටුප් ක්‍රමය	සේවා මට්ටම	ක.සේ.දෙපා.අනුමත තනතුරු සංඛ්‍යාව			දැනට පවතින තනතුරු සංඛ්‍යාව			
						ස්ථිර	කොන්ත්‍රාත්	අතිරේක	ස්ථිර	කොන්ත්‍රාත්	අතිරේක	පැවරුම්
1	අධ්‍යක්ෂ	අධ්‍යයන		U-AC 5	ජ්‍යෙෂ්ඨ මට්ටම	1			1			
2	මහාචාර්ය	අධ්‍යයන		U-AC 5	ජ්‍යෙෂ්ඨ මට්ටම	8			0			
3	ආශ්‍රිත මහාචාර්ය	අධ්‍යයන		U-AC 4	ජ්‍යෙෂ්ඨ මට්ටම				0			
4	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/කථිකාචාර්ය/කථිකාචාර්ය (පරිවාස)	අධ්‍යයන		U-AC 3	ජ්‍යෙෂ්ඨ මට්ටම				8			
5	විද්‍යාත්මක සහකාර	අධ්‍යයන සහායක		U-AS 1	තෘතීක මට්ටම	1			1			
6	තාවකාලික ශිල්ප ප්‍රදර්ශක	කොන්ත්‍රාත්		U-AC 1 (ස්ථාවර)	තෘතීක මට්ටම		4			4		
7	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	UA & FS	II/I	U-EX 2	ජ්‍යෙෂ්ඨ මට්ටම	1			1			
8	සහකාර මුල්‍යාධිකාරී	UA & FS	II/I	U-EX 1	තෘතීක මට්ටම	1			1			
9	ගොවිපොළ කළමනාකරු	Dept.	II/I	U-EX 1	තෘතීක මට්ටම	1			0			
10	උප ශාලාධිපති	Dept.	III/II/I	U-MN 3	ද්විතීක මට්ටම	1			1			
11	තාක්ෂණික නිලධාරී (තොරතුරු තාක්ෂණය)	UTS	III/II/I	U-MT 1	ද්විතීක මට්ටම	1			0			
12	තාක්ෂණික නිලධාරී	UTS	III/II/I	U-MT 1	ද්විතීක මට්ටම	2			0			
13	ක්ෂේත්‍ර පරිපාලක		III/II/I	U-MT 1	ද්විතීක මට්ටම	1			1			
14	කළමනාකරණ සහකාර	UMAS	III/II/I	U-MN 1	ද්විතීක මට්ටම	8			5			
15	කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු)	UMAS	III/II/I	U-MN 1	ද්විතීක මට්ටම	2			1			
16	කළමනාකරණ සහකාර (පොත් තැබීම්)	UMAS	III/II/I	U-MN 1	ද්විතීක මට්ටම	1			0			
18	රියදුරු	UDS	III/II/I/Spl	U-PL 3	ප්‍රාථමික මට්ටම	2			2			
19	විදුලි කාර්මික	Dept.	III/II/I/Spl	U-PL 3	ප්‍රාථමික මට්ටම	1			0			
20	විද්‍යාගාර සහායක	Dept.	III/II/I/Spl	U-PL 2	ප්‍රාථමික මට්ටම	26			21			
21	ට්‍රැක්ටර් ක්‍රියාකරු	Dept.	III/II/I/Spl	U-PL 2	ප්‍රාථමික මට්ටම	1			0			
22	පැළ තවාන්කරු	Dept.	III/II/I/Spl	U-PL 1	ප්‍රාථමික මට්ටම	2			0			
23	වැඩ සහායක	UWAS	III/II/I/Spl	U-PL 1	ප්‍රාථමික මට්ටම	19			15			

**	**පැවරුම් පදනම මත දැනට සිටින සේවකයින් (අනුමත තනතුරු නොමැතිව)**											
	පාඨමාලා සම්බන්ධීකාරක											5
	පරිගණක ක්‍රියාකරු සහ තොරතුරු තාක්ෂණ විද්‍යාගාර කාර්මික											1
එකතුව						**80**	**4**	**0**	**57**	**4**	**0**	**6**

වගු අංක 08 : 2022.12.31 දිනට ආයතනයේ පරිපාලන කාර්ය මණ්ඩලය

අනු අංකය	නම	තනතුර
1	මහාචාර්ය අසංග ඩී. අම්පිටියාවත්ත ආචාර්ය එන්.පී.විදානපතිරණ	අධ්‍යක්ෂ (2022.03.02 සිට) වැඩ බලන අධ්‍යක්ෂ (2022.03.01 දක්වා)
2	එස්.ඒ.එස් . ප්‍රියදර්ශනී මිය	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
3	ඒ.ඩී.පී.ද සොයිසා	සහකාර මූල්‍යාධිකාරී

වගු අංක 09 : 2022.12.31 දිනට ආයතනයේ පරිපාලන/මූල්‍ය අංශ වල අනධ්‍යයන කාර්ය මණ්ඩලය

අනු අංකය	නම	තනතුර
1	කේ.ජී.එම්.සමරවික්‍රම මහත්මිය	උප ශාලාධිපති (පූර්ණ කාලීන)
2	ඩබ්.කේ.කේ රාජිකා නිලංගනී මහත්මිය	කළමනාකරණ සහකාර ශ්‍රේණිය lll
3	ආර්.වී.පී.එන්.පී. කුමාර මහතා	කළමනාකරණ සහකාර ශ්‍රේණිය lll
4	ආර්.ඒ.එම්.දිල්හාරි මහත්මිය	විද්‍යාගාර සහයක ශ්‍රේණිය lll
5	යූ.එම්.ඒ.ඒ.එම්. ද සිල්වා මහත්මිය	කළමනාකරණ සහකාර ශ්‍රේණිය lll
6	ජේ.ඒ.යූ.එස්. ජයවර්ධන මහතා	කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු)
7	එම්.ජී.ජේ.පී.එස්. සඳරුවන් මහතා	වැඩ සහායක ශ්‍රේණිය lll
8	කේ.ඩී.සී. ආරියසේන මහත්මිය	පරිගණක යෙදවුම් සහකාර
9	එන්.ඒ.අයි. දිල්හාරා මහත්මිය	කළමනාකරණ සහකාර (පොත් තබන්නා)
10	ඩබ්.එච්.යූ. කෞෂල්‍යා	විද්‍යාගාර සහයක ශ්‍රේණිය lll
11	පී.බී.දර්ශන මහතා	වැඩ සහායක ශ්‍රේණිය lll
12	කේ.එස්.ආර්.සම්පත් මහතා	වැඩ සහායක ශ්‍රේණිය lll
13	ඩබ්.එම්.චමින්ද මහතා	වැඩ සහායක ශ්‍රේණිය lll
14	බී.ජී.එස්.කුමාර මහතා	විද්‍යාගාර සහයක ශ්‍රේණිය lll
15	එස්.වී.උපාලි මහතා	රියදුරු ශ්‍රේණිය ll
16	ඩබ්.ඩබ්.කේ.ප්‍රියංකර මහතා	රියදුරු ශ්‍රේණිය l

2022 වර්ෂයේ කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ විශේෂ සිදුවීම්/වැඩසටහන්

1. පූර්ණ කාලීන සිවිවන අධ්‍යක්ෂවරයා රාජකාරි භාර ගැනීම

   ආයතනයේ හිටපු අධ්‍යක්ෂ මහාචාර්ය සුදර්ශන් සෝමසුන්දරම් මහතාගේ සේවා කාලය අවසන් වූ පසු නව අධ්‍යක්ෂ වරයා ලෙස සබරගමුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ පීඨයේ හිටපු පීඨාධිපති ආචාර්ය අසංග ඩී. අම්පිටියාවත්ත මහතා වැඩ බාරගන්නා ලදි.

2. ශිෂ්‍ය පොදු වැඩසටහන් (Social events)

- රාමසාන් උත්සවය සැමරීම

  ආයතනයේ ශිෂ්‍ය ප්‍රජාව අතර සංහිදියාව, සංස්කෘතිය හා සමගිය ඇති කරනු වස් රාමසාන් උත්සවය 2022 අප්‍රේල් 28 දින ආයතනයේ අධ්‍යක්ෂ, සියලුම කාර්යය මණ්ඩලය හා සිසුන්ගේ සහභාගීත්වයෙන් සමරන ලදී.

- ඇඩප්ට් (ADEPT) සංස්කෘතික වැඩසටහන 2022

  ඇඩප්ට් 2022 වාර්ෂික සංස්කෘතික වැඩසටහන 2022 ජුනි මස 03 වන දින ආයතනයේදි පවත්වන ලදි. සිසුන්ගේ දක්ෂතා එළිදැක්වීම හා විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා සිසුන් පෙළඹවීමේ අරමුණින් 12 වන ශිෂ්‍ය කණ්ඩායමේ පුර්ණ කාලීන (Group A) සිසුන් විසින් මෙය සංවිධානය කරන ලදි.

- ගිණි රාත්‍රිය

  11 වන ශිෂ්‍ය කණ්ඩායමේ පූර්ණ කාලීන සිසුන් විසින් 2022 ජුනි 24 වන දින ගිනිමැලය සංවිධානය කරන ලදි. මෙහි තේමාව වුයේ මිත්‍රත්වයයි. විනෝද ජනක හා සෞන්දර්යාත්මක ඉසව් වලින් මෙම වැඩසටහන සංවිධානය වී තිබු අතර එය ඉතාමත් ප්‍රියතාවයක් දක්වන ලදි.

- ක්‍රිකට් තරගාවලිය

  ආයතනයේ සිසුන් ගේ සංවිධානයෙන් සිසුන් අතර සුහදතාවය වර්ධනය කර ගැනීමේ අරමුණින් 11 වන හා 12 වන ශිෂ්‍ය කණ්ඩායම් අතර මෙම සුහද ක්‍රිකට් තරගය පවත්වන ලදි.

- පොසොන් පෝයදා දන්සල

  2022 ජුනි මස 14 වන දින පොසොන් පෝය දිනය නිමිති කරන ආයතනයේ සියලුම සිසුන්ගේ සංවිධාන ශක්තියෙන් හම්බන්තොට - වැල්ලවාය ප්‍රධාන මාර්ගයේ වැලිගත්ත මංසන්දියේ දන්සලක් පවත්වන ලදි.

- නවරාත්‍රී සංස්කෘතික උත්සවය 2022

  2022 ඔක්තෝම්බර් 06 වන දින නවරාත්‍රී උත්සවය ආයතන පරිශ්‍රයේදි සමරන ලදී. ආයතනයේ අධ්‍යයන කටයුතු සිදුකරන දෙමළ සිසුන් ආයතනයේ අනිකුත් සිසුන්ගේ ද සහයෝගයෙන් මෙම උත්සවය සංවිධානය කරන ලදි. නවරාත්‍රී පූජා වැඩසටහනක් සංවිධානය කර තිබු අතර එය ඉතාමත් වර්ණවත් හා ආකර්ෂනීය අවස්ථාවක් උදාකරන ලදි.

3. ප්‍රජා මූලික වැඩසටහන්

2022 මාර්තු 31 වන දින ගොවින් වෙනුවෙන් කාබනික ගොවිතැන පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් ආයතන පරිශ්‍රයේදි පවත්වන ලදි. වැඩසටහන සඳහා සහභාගී වුවන් වෙනුවෙන් කාබනික ගොවිතැනෙහි මූලධර්ම හා කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳව සිද්ධාන්ත පැය 20 ක් හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් පැය 30 ක දැනුම මෙම වැඩසටහන තුලින් ලබාදෙන ලදි. මෙය මෙම වැඩසටහන සාර්ථකව නිම කරන ලද දෙවන කණ්ඩායම වේ.

4. ජල පිරිපහදු කිරීමේ පද්ධතියක් ස්ථාපනය කිරීම (RO System)

   රුපියල් 1,579,600.00 ක මුදලක් වැය කරමින් ආයතනයේ සිසුන්ගේ හා කාර්යය මණ්ඩලයේ පිරිසිදු පානීය ජල අවශ්‍යතාවය සපුරාලීමේ අරමුණින් පැයකට ලීටර් 500 ක ධාරිතාවයකින් යුත් ජල පිරිපහදු පද්ධතියක් ස්ථාපිත කරන ලදි.

5. මහජන බැංකුවේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් (ATM Machine) විවෘත කිරීම

   මහජන බැංකුවේ අලුතින් ස්ථානපය කරන ලද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය 2022.07.28 වන දින ආයතන පරිශ්‍රයේදි මහජන බැංකුවේ හම්බන්තොට ශාඛාවේ ප්‍රාදේශීය කළමණාකරුගේ සහ ආයතනයේ අධ්‍යක්ෂකතුමා සමග කාර්යය මණ්ඩලය හා සිසුන්ගේ සහභාගීත්වයෙන් විවෘත කරන ලදි.

2.1 අධ්‍යයන වැඩසටහනේ කාර්යසාධනය

කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය කෘෂිකර්මයට සම්බන්ධ කෘෂිකර්මය පදනම් කර ගත් කර්මාන්ත වල නියැලෙන්නන් මෙන්ම උසස් පෙළ සමත් සිසුන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත කරන ලද කෘෂිකර්මය පාඨක කර ගත් කෘෂි තාක්ෂණවේදී උපාධිය ප්‍රදානය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පුරෝගාමී ආයතනයක් ලෙස 2008 වර්ෂයේ දී පිහිටුවන ලදී. සියලුම පාඩම් අන්තර්ගතයන් මාර්ගගත ඉගෙනුම් කළමනාකරණ පද්ධතියේ (LMS) ඇති අතර එබැවින් දේශන සඳහා මිශ්‍ර ඉගෙනුම් ප්‍රවේශයන් යෙදීමෙන් ප්‍රායෝගික සහ ක්ෂේත්‍ර චාරිකා සංරචක සඳහා සිසුන්ගේ සහභාගීත්වය සැලකිය යුතු ලෙස වැඩි කොට ඇත. උපාධිය සම්පූර්ණ කළ සිසුන් කාණ්ඩ හතක් සිටින අතර ඔවුන් ජාතික ආර්ථිකයට සෘජු යෙදවුම් සපයමින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා කැපී පෙනෙන දායකත්වයක් සපයයි. දැනට උපාධි පාඨමාලාව හදාරන සිසුන් සංඛ්‍යාව 1000ක් පමණ වේ.

කෘෂි තාක්ෂණික උපාධි පාඨමාලාවේ දළ සටහන (course outline)

කෘෂි තාක්ෂණික උපාධි පාඨමාලාවේ කාලසීමාව වසර 04 කි.

'අධ්‍යයන වර්ෂයක්' සති 15 බැගින් වූ අධ්‍යයන සමාසික 02 කින් සමන්විත වන අතර අධ්‍යයන වැඩසටහන පදනම් වී ඇත්තේ 'පාඨමාලා සම්මාන ඇගයීම් ක්‍රමය' මත වන අතර එහිදී සිසුන් සමාසිකය පුරාම අඛණ්ඩව ඇගයීමට ලක් කරනු ලැබේ (එනම් සැකැස්ම) සහ අවසාන සමාසිකය ඇගයීම (එනම් සාරාංශය) නම් කරන ලද පාඨමාලා සඳහා සමාසිකය අවසානයේ පැවැත්වේ. එක් එක් පාඨමාලා ඒකක ආරම්භයේ දී අඛණ්ඩ ඇගයීම් සිදුකරන ක්‍රමවේදය සහ කාලසීමාවන් පිළිබඳව සිසුන්ට දැනුම් දෙනු ලැබේ.

කෘෂිතාක්ෂණවේදී ගෞරව උපාධිය සඳහා සුදුසුකම් ලැබීම සඳහා, අදාල ශිෂ්‍යයා විසින් අවසාන ශ්‍රේණියට දායක වන සම්මාන අගයන් (GPA course units) 120 ක් උපයා ගත යුතු අතර එසේම අවසාන ශ්‍රේණියට දායක නොවන (12 Non-GPA course units) පාඨමාලා ඒකකයන් ද ඇතුලත්ව සියලු පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කළ යුතු ය.

පාඨමාලා එක් එක් වසර සඳහා බණ්ඩනය කිරීම පහත පරිදි සාරාංශගත කර ඇත:

(පළමු වසර) - අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 30ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (Non-GPA course units) 04ක් උපයා ගත යුතුය

(දෙවන වසර) - අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 30ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් 03ක් උපයා ගත යුතුය (සමුච්චිත වශයෙන් දෙවන වසර අවසානයේ දී අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 60ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් 07ක් උපයා ගත යුතුය)

(තෙවන වසර) - අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 32ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් 03ක් උපයා ගත යුතුය (සමුච්චිත වශයෙන් දෙවන වසර අවසානයේ දී අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 92ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් 10ක් උපයා ගත යුතුය)

(හතරවන වසර) - අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 28ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් 02ක් උපයා ගත යුතුය (සමුච්චිත වශයෙන් දෙවන වසර අවසානයේ දී අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 120ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් 12ක් උපයා ගත යුතුය)

පාඨමාලා ඒකකයක් හඳුනා ගැනීම සඳහා ඇල්ෆා සංඛ්‍යා කේතයක් (alpha numeric code) භාවිතා කරයි. කේතය 'කෘෂි තාක්ෂණය' යන වචන දැක්වීමට මුලට යොදන ලද AT නමැති අකුරු දෙකක් සහ ඉලක්කම් හතරකින් සමන්විත වේ.

එහි පළමු ඉලක්කම මගින් පාඨමාලා ඒකකය පිරිනමන 'වර්ෂය' ද දෙවන ඉලක්කම මඟින් පාඨමාලා ඒකකය පිරිනමන 'සමාසිකය' ද දක්වයි. තෙවන ඉලක්කම මඟින් පාඨමාලා ඒකකය සඳහා පවරා ඇති 'අනුක්‍රමික අංකය' දක්වයි (වගුව 10).

කෘෂි තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාවේ විෂය මාලාව (Curriculum)

විෂය මාලාව සංශෝධනය කරන ලද අතර එය 2018.01.30 දින පැවති සනාථන සභාවේ 426 වන රැස්වීම් වාරයේ දී නිර්දේශ කරන ලදී.

වගු අංක 10 : පාඨමාලා අන්තර්ගතය

T:Theory (න්‍යාය), P: Practical (ප්‍රායෝගික), IL:Individual Learning through LMS (LMS ඔස්සේ තනි පුද්ගල ඉගෙනුම)

විෂය කේතය	විෂයේ නම	සම්මාන අගය (GPA)	සම්මාන නොවන අගය (NGPA)	අධ්‍යයන කාලය (පැය) T:P:IL
Level 3 පළමු වසර පළමු සමාසිකය				
AT1101	ශෂ්‍ය විද්‍යා හා උද්‍යාන විද්‍යා මූලධර්ම.	3	-	15:60:90
AT1102	ශාක ජීව විද්‍යා මූලධර්ම.	2	-	15:30:60
AT1103	ජල සම්පාදනය හා ජල සම්පත් ඉංජිනේරු විද්‍යාව.	3	-	15:60:60
AT1104	ගොවිපල සතුන්ගේ ව්‍යුහ විද්‍යාව හා කායික විද්‍යාව	2	-	15:30:60
AT1105	කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපෘතියේ මූලධර්ම.	2	-	15:30:60
AT1106	පාංශු විද්‍යා මූලධර්ම.	2	-	15:30:60
AT1107	කෘෂි කාලගුණ විද්‍යාව.	1	-	00: 30:60
AT1108	ඉංග්‍රීසි	0	2	15:30:90
මූලු සම්මාන අගයන්		**15**	**2**	**105:300:540**
Level 3 පළමු වසර දෙවන සමාසිකය				

AT1201	එළවලු හා ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය හා කලමණාකරණය.	2	-	15:30:60
AT1202	පලිබෝධ හා රෝග කලමණාකරණය.	2	-	15:30:90
AT1203	ගොවිපල සතුන් කළමණාකරණය.	3	-	15:60:60
AT1204	ගොවිපල බල හා යාන්ත්‍රීකරණය.	2	-	15:30:60
AT1205	වාණිජ මල් වගාව.	2	-	15:30:60
AT1206	පාංශු හා ශාක පෝෂණ කළමණාකරණය	2	-	15:30:90
AT1207	ආහාර හා පෝෂණ විද්‍යාව හැදින්වීම	2	-	15:30:90
AT1208	තොරතුරු සන්නිවේදන තාක්ෂණය	0	2	00:30:30
මුලු සම්මාන අගයන්		**15**	**2**	**105:270:540**
Total Credits at Level 3		**30**	**4**	**210:570:1080**
Level 4 දෙවන වසර පළමු සමාසිකය				
AT2101	වැවිලි බෝග නිශ්පාදනය හා කළමණාකරණය.	3	-	15:60:90
AT2102	බෝග වැඩිදියුණු කිරීම හා ජෛව තාක්ෂණය.	2	-	15:60:90
AT2103	පළතුරු බෝග නිෂ්පාදනය හා කළමණාකරණය.	2	-	15:30:60
AT2104	පසු අස්වනු කළමණාකරණය හා ආහාර තාක්ෂණය.	2	-	15:30:90
AT2105	තෘණ විද්‍යාව සහ තෘණ බිම් කළමණාකරණය.	2	-	15:30:60
AT2106	කෘෂි ව්‍යාපාර කළමණාකරණය.	2	-	15:30:60
AT2107	මූලික සංඛ්‍යානය.	2	-	15:30:60
AT2108	පරිගණක ආශ්‍රිත භාෂා අධ්‍යනය.	0	2	15:30:90
මුලු සම්මාන අගයන්		**15**	**2**	**120:270:600**
Level 4 දෙවන වසර දෙවන සමාසිකය				
AT2201	අපනයන කෘෂිකර්ම බෝග නිශ්පාදනය හා කළමණාකරණය.	2	-	15:30:90
AT2202	ආරක්ෂිත බෝග වගාව.	2	-	15:30:60
AT2203	සත්ත්ව අභිජනනය හා පට්ටි පාලනය.	3	-	15:60:60
AT2204	ගොවිපල සැලසුම්කරණය.	2	-	15:45:90
AT2205	කෘෂි ව්‍යාප්ති විද්‍යාව හා සන්නිවේදන තාක්ෂණය.	2	-	15:30:90
AT2206	ජල ජීවී විද්‍යා නිශ්පාදන තාක්ෂණය.	2	-	15:30:60
AT2207	ශාක පටක රෝපණ තාක්ෂණය.	2	-	15:30:60
AT2208	ජීවන කුසලතා සංවර්ධනය.	0	1	00:30:30
Total Credits		**15**	**1**	**105:285:540**
Total Credits at Level 4		**30**	**3**	**225:555:1140**
Level 5 තෙවන වසර පළමු සමාසිකය				
AT3101	උද්‍යාන අලංකරණය.	3	-	30:60:90
AT3102	කෘෂි පාරිසරික විද්‍යාව.	2	-	15:30:60
AT3103	සත්ත්ව නිෂ්පාදන සැකසුම් තාක්ෂණය.	2	-	15:30:60

AT3104	ආහාර සැකසුම හා අගය එකතු කිරීම.	2	-	15:30:90
AT3105	ශාක වැඩිදියුණු කිරීමේ හා පෛව තාක්ෂණයේ යෙදවුම්.	2	-	15:30:90
AT3106	ඖෂධ පැළෑටි නිෂ්පාදනය හා කළමණාකරණය.	2	-	15:30:60
AT3107	කෘෂි වන වගාව.	2	-	15:30:60
AT3108	මානව හා සමාජ විද්‍යා මූලධර්ම.	0	2	15:30:60
මූලු සම්මාන අගයන්		**15**	**2**	**135:270:570**
Level 5 තෙවන වසර දෙවන සමාසිකය				
AT3201	ශාක නිෂ්පාදන පුහුණුව.	4	-	00:120:90
AT3202	සත්ත්ව නිශ්පාදන පුහුණුව.	3	-	00:90:90
AT3203	කෘෂි ඉංජිනේරු විද්‍යා පුහුණුව.	2	-	00:60:90
AT3204	විද්‍යුත් වාණිජ කෘෂිකර්මාන්තය.	2	-	30:30:60
AT3205	නිරපේක්ෂ කෘෂිකර්මාන්තය.	2	-	30:30:60
AT3206	ව්‍යවසායකත්වය හා ව්‍යාපාර සැලසුම්කරණය.	2	-	30:60:90
AT3207	සිද්ධි අධ්‍යනය.	2	-	30:30:60
AT3208	ඉදිරිපත් කිරීමේ කුසලතා	0	1	
මූලු සම්මාන අගයන්		**17**	**1**	**120:420:540**
Total Credits at Level 5		**32**	**3**	**255:690:1110**
Level **6 සිව්වන වසර පළමු සමාසිකය**				
AT4101	පර්යේෂණ ක්‍රමවේදය සහ යෝජනා සංවර්ධනය	2	-	15:30:90
AT4102	කෘෂිකාර්මික පරීක්ෂණ පැවැත්වීම සහ දත්ත විශ්ලේෂණය	3	-	15:60:90
AT4103	කෘෂිකාර්මික ව්‍යාපෘති විශ්ලේෂණය හා කළමනාකරණය	2	-	15:30:90
AT4104	කෘෂිකාර්මික අපද්‍රව්‍ය කළමනාකරණය	2	-	15:30:90
AT4105	බලශක්ති පද්ධති නැවත ආරම්භ කිරීම	2	-	15:30:60
AT4106	භෝග ආකෘති	2	-	15:30:60
AT4107	විද්‍යුත් කෘෂිකර්මයේ භාවිතයන්	2	-	30:30:60
AT4108	ජීව සාරධර්ම	1	-	15:00:60
AT4109	ඉංග්‍රීසි	0	-	15:30:60
Total Credits		**16**	**2**	**150:270:660**
Level **6 සිව්වන වසර දෙවන සමාසිකය**				
AT4201	කෘෂි තාක්ෂණික පර්යේෂණ ව්‍යාපෘතිය	12	0	0
Total Credits		**12**	**0**	**0**
Total Credits at Level 6		**28**	**2**	**150:270:660**

වෛකල්පිත විෂයන්

වගු අංක 11 : T:Theory (න්‍යාය), P: Practical (ප්‍රායෝගික), IL:Individual Learning through LMS (LMS ඔස්සේ තනි පුද්ගල ඉගෙනුම)

විෂය ක්ෂේත්‍රය	විෂයේ නම	සම්මාන අගය (GPA)	සම්මාන නොවන අගය (NGPA)	අධ්‍යයන කාලය (පැය) T:P:IL
AT1109	වෘත්තීය මාර්ගෝපදේශනය සහ සංවර්ධනය	2	-	15:30:60
AT1209	කෘෂි සංචාරක ව්‍යාපාරය	2	-	15:30:60
AT2109	කෘෂිකර්මයට අදාළ විද්‍යුත් සහ උපකරණ සැකසීම	2	-	15:30:60
AT2209	ආපදා කළමනාකරණය	2	-	15:30:60
AT3109	කාර්මික පුහුණුව	2	-	00:60:60
AT3209	සත්ව සුභසාධනය සහ සාරධර්ම	2	-	15:30:60
AT4209	වනජීවී කළමනාකරණය	2	-	15:30:60

ග්‍රාමීය ගොවි ප්‍රජාව කෘෂිකාර්මික ව්‍යවසායකයින් ලෙස සංවර්ධනය කිරීමේ දී මෙම වැඩසටහනට ඇතුළත් කොට ඇති ප්‍රායෝගික ක්‍රියාකාරකම්, පැවරුම්, සිද්ධාන්තමය කරුණු හා ආධුනිකව අධ්‍යයනය ලබන්නන් හට දෙනු ලබන සහය සේවාවන් වැනි සියලුම සංරචක ඔවුනගේ පෞද්ගලික සහ වෘත්තීය සංවර්ධනය කෙරෙහි ප්‍රශස්ත අන්දමින් ඉවහල් වී ඇත.

තවද, මෙම උපාධි පාඨමාලාව, තරුණ පරපුර තුළ ඉහල සමාජීය පිළිගැනීමක් ලබමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ රැඳී සිටීමට විශාල අභිප්‍රේරණයක් ඇති කර තිබේ.

අධ්‍යයන වැඩසහටන්වලට ඇතුළත් වීම සඳහා සපුරා ලිය යුතු සුදුසුකම්

ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත්වල ප්‍රකාශයට පත් කෙරෙන පුවත්පත් දැන්වීමක් තුළින් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් අයදුම්පත් කැඳවීම මගින් බඳවා ගැනීම සිදු කෙරේ.

1. අ.පො. ස. (උසස් පෙළ) විභාගය කෘෂිකාර්මික විද්‍යාව හෝ ජෛව පද්ධති තාක්ෂණය හෝ ගණිත විෂයන්ගෙන් සම්මාන 03ක් සහිතව සමත් වීම

හෝ

2. අවම වශයෙන් වසර 03ක කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පළපුරුද්ද (අදාළ පදිංචි ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක සහ කෘෂිකර්ම මධ්‍යස්ථානයේ සංවර්ධන නිලධාරී විසින් සහතික කළ යුතුයි) සහ අ.පො. ස. (උසස් පෙළ) විභාගය ඉහත වගන්ති 1 සඳහන් විෂය ධාරාවන්ගෙන් හැර වෙනත් විෂය ධාරාවකින් සම්මාන 03ක් සහිතව සමත් වීම

හෝ

3. අවම වශයෙන් වසර 05ක කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පළපුරුද්ද (අදාළ පදිංචි ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක සහ කෘෂිකර්ම මධ්‍යස්ථානයේ සංවර්ධන නිලධාරී විසින් සහතික කළ යුතුයි) සහ අ.පො. ස. (සා. පෙළ) විභාගය ගණිතය සහ විද්‍යාව විෂයන් සහිතව සමත් වීම

හෝ

4. කොළඹ විශ්ව විද්‍යාලයේ සනාථන සභාව විසින් පිළිගන්නා වෙනත් ඕනෑම සමාන සුදුසුකම්

හෝ

5. පිළිගත් ආයතනයකින් කෘෂිකර්මය පිලිබඳ ඩිප්ලෝමාව (NVQ 5 මට්ටම) හෝ උසස් ඩිප්ලෝමාව (NVQ 6 මට්ටම) සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්ට, සම්මානිත අගයන් 30කින් සමන්විත පාඨමාලාව (30 credits bridging course) සම්පූර්ණ කිරීමෙන් පසු පිලිවෙලින් කෘෂි තාක්ෂණික උපාධි පාඨමාලාවේ දෙවන හෝ තෙවන වසර සඳහා ඇතුලත් විය හැකිය.

සුදුසුකම්ලත් අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා අභියෝග්‍යතා පරීක්ෂණයකට කැඳවනු ලැබේ. අභියෝග්‍යතා පරීක්ෂණයේ ප්‍රතිඵලවලට අනුව, සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව අයදුම්කරුවන් ලියාපදිංචි කෙරේ.

වගු අංක 12 : 2022 වර්ෂයේ දී කෘෂි තාක්ෂණවේදී උපාධිය හදාරන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව

අධ්‍යයන වර්ෂය (කාණ්ඩායම/වසර)	බඳවා ගත් වර්ෂය (අධ්‍යයන වර්ෂය)	සිසුන් සංඛ්‍යාව		
		පිරිමි	ගැහැණු	එකතුව
පළමු වසර (12/13 කණ්ඩායම්)	2020/2021-2021/2022	122	151	273
2 වන වසර (11/12/13 කණ්ඩායම්)	2019/2020-2020/2021-2021/2022	94	124	218
3 වන වසර (8/9/10/11/12/13 කණ්ඩායම්)	2016/2017-2017/2018-2018/2019-2019/2020-2020/2021-2021/2022	179	166	345
4 වන වසර (7 / 8 / 9 / 10 වන කණ්ඩායම්)	2015/2016-2016/2017-2017/2018-2018/2019	60	31	91

වගු අංක 13 :පසුගිය වසර 4 තුළ සිසුන් බඳවා ගැනීම සහ සමත් වූ සිසුන්

වසර	බඳවා ගත් සිසුන් සංඛ්‍යාව	සමත් වූ සිසුන් සංඛ්‍යාව
2022	246	75**
2021	323	-
2020	343	-
2019	267	32*

* 2012/2013 සහ 2013/2014 ශිෂ්‍ය කණ්ඩායම් වල සමත් වූ සිසුන් (4 සහ 5 කණ්ඩායම්)
** 2014/2015 සහ 2015/2016 ශිෂ්‍ය කණ්ඩායමේ සමත් වූ සිසුන් (6 සහ 7 කණ්ඩායම)

කෘෂි තාක්ෂණ දෙපාර්තමේන්තුව

2008 අංක 02 ආඥා පනතේ සඳහන් පරිදි දෙපාර්තමේන්තු තුනක් පිහිටුවීමට අවශ්‍ය අනුමැතිය තිබුණද කාර්ය මණ්ඩල හිගය හේතුවෙන් දැනට ක්‍රියාත්මකව පවතිනුයේ මෙම දෙපාර්තමේන්තුව පමණි. කෘෂි තාක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ගෞරව උපාධි වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

2022.12.31 දිනට අධ්‍යයන වැඩසටහනේ කාර්ය මණ්ඩලය පහත දැක්වේ.

වගු අංක 14 : අධ්‍යයන කාර්ය මණ්ඩලය (ස්ථිර)

අනු අංකය	නම	තනතුර
1	ආචාර්ය එන්.පී. විදානපතිරණ මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය , අංශ ප්‍රධාන, කෘෂි තාක්ෂණික අධ්‍යයන අංශය
2	ආචාර්ය සුජාතා වීරසිංහ මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය (2022.08.01 දක්වා)
3	ආචාර්ය ඩී.එම්.සී.සී.ගුණතිලක මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය (පරිවාස)
4	එල්.එම්.රිෆ්නාස් මහතා	කථිකාචාර්ය (පරිවාස)
5	කේ.ජී.කෙටිපෙආරච්චි මෙනවිය	කථිකාචාර්ය (පරිවාස)
6	ඒ.ජේ.එම්.සී.එම්.සිරිවර්ධන මහතා	කථිකාචාර්ය (පරිවාස)
7	යූ.ආර්.චන්දිමාලා මෙනවිය	කථිකාචාර්ය (පරිවාස)
8	බී.එස්.බන්ධුසේකර මහතා	කථිකාචාර්ය (පරිවාස)

වගු අංක 15 : අධ්‍යයන (පැවරුම් පදනම මත)/අධ්‍යයන (තාවකාලික)/අධ්‍යයන සහායක (ස්ථිර) කාර්ය මණ්ඩලය

අනු අංකය	නම	තනතුර
1	එස්.ඒ.පී. නෙල්කා මිය	පාඨමාලා සම්බන්ධීකාරක
2	එස්.එල්. නවරත්න මිය	පාඨමාලා සම්බන්ධීකාරක
3	එච්.කේ.ආර්.එස්. කුමාර මහතා	පාඨමාලා සම්බන්ධීකාරක
4	ටී.ජී.බී.ධනුෂ්ක මහතා	පාඨමාලා සම්බන්ධීකාරක
5	බී.පී. සිරිවර්ධන මහතා	පාඨමාලා සම්බන්ධීකාරක
6	එච්.රෝහණධීර මහතා	විද්‍යාත්මක සහකාර
7	බී.පී.දිලිනි හේමාලි	තාවකාලික ශිල්ප ප්‍රදර්ශක (2022.07.17 දක්වා)
8	එම්.යූ.එන්.ගුණවර්ධන	තාවකාලික ශිල්ප ප්‍රදර්ශක (2022.07.04 දක්වා)
9	ටී.වී.ආර්.සී.පෙරේරා	තාවකාලික ශිල්ප ප්‍රදර්ශක (2022.06.08 දක්වා)
10	පී.එස්. සන්දමාල් මහතා	තාවකාලික ශිල්ප ප්‍රදර්ශක (2022.11.06 දක්වා)
11	ඩබ්.සී.එම්.එස්. මධුශංක මහතා	තාවකාලික ශිල්ප ප්‍රදර්ශක (2022.08.15 සිට)
12	එම්.ආර්. ප්‍රතිභානි මෙනවිය	තාවකාලික ශිල්ප ප්‍රදර්ශක (2022.11.07 සිට)
13	ඒ.ඕ.ටී. තත්සරණි මෙනවිය	තාවකාලික ශිල්ප ප්‍රදර්ශක (2022.12.15 සිට)

වගු අංක 16 : අනධ්‍යයන කාර්ය මණ්ඩලය

අනු අංකය	නම	තනතුර
1	ඒ.ජී.යූ.වසන්ති මිය	කළමනාකරණ සහකාර III ශ්‍රේණිය
2	එස්.ඒ.ආර්.ලක්මාල් මහතා	පරිගණක ක්‍රියාකරු සහ තොරතුරු තාක්ෂණ විද්‍යාගාර කාර්මික
3	ඩබ්ලිව්.අයි.වතුමලි මිය	වැඩ සහායක III ශ්‍රේණිය

- රජයේ ගුරුවරයකු මෙන්ම UCIARS හි හිටපු සහකාර පාඨමාලා සම්බන්ධීකාරකවරයකු ලෙස සේවය කළ එච්.ආර්. වාමර මහතා, තොරතුරු තාක්ෂණ නිලධාරියකු ලෙස අර්ධ කාලීන පැවරුමක් මත 2022 වසර සඳහා සේවය ලබා දී ඇත.

- එක් එක් විෂය ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ දැනුම ලබා දීම සඳහා මෙන්ම පාඨමාලාවන්හි ප්‍රමිතිය පවත්වා ගැනීමේ අරමුණින් කොළඹ විශ්ව විද්‍යාලයේ සනාථන සභාව විසින් UCIARS කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය සහිතව අධ්‍යයන වැඩසටහන්වල ඇතැම් පාඨමාලා සඳහා විෂය ප්‍රවීණයින් පත් කර ඇත.

ගොවිපොල පුහුණු පාඨමාලාව

තෙවන වසරේ ඉගෙනුම ලබන උපාධි අපේක්ෂක සිසුන් සඳහා විශේෂයෙන් බෝග පාලනය, සත්ව පාලනය සහ කෘෂිකර්ම ඉංජිනේරු විද්‍යාව සම්බන්ධයෙන් ඔවුන්ගේ ප්‍රායෝගික සංරචකය සපුරාලීම සඳහා ගොවිපල පුහුණු පාඨමාලාව පැවැත්වීම අත්‍යවශ්‍ය කරුණකි. 2022 ජුනි 27 වන දින 2018/2019 පූර්ණ කාලීන සිසුන් සඳහා ඔවුන්ගේ අධ්‍යයන වැඩසටහනේ කොටසක් ලෙස ගොවිපල පුහුණු පාඨමාලාව ආරම්භ කරන ලදි.

2022 වසරේ කෘෂි තාක්ෂණික අධ්‍යයන අංශය තුළ සිදු වූ විශේෂ සිදුවීම්

1. නව සිසුන් කණ්ඩායමක් බඳවා ගැනීම

   2022 අප්‍රේල් 22 වන දින අලුතින් බඳවා ගන්නා ලද 13 වන ශිෂ්‍ය කණ්ඩායම ආයතනයට සාදරයෙන් පිළිගන්නා ලදි. ආයතනයේ අධ්‍යක්ෂතුමා, ආචාර්ය මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ සිසුන්ගේ ප්‍රධානත්වයෙන් සංස්කෘතික අංගවලින් සමන්විත ආකර්ශණීය උත්සවයක් සංවිධානය කරන ලදි.

2. ගොවිපල යන්ත්‍රෝපකරණ පුහුණු පාඨමාලාව

බ්‍රවුන්ස් සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන සිසු නැණ පහන අධ්‍යාපනික වැඩසටහන යටතේ සිසුන්ට ප්‍රායෝගික දැනුම ලබා දීම සඳහා බ්‍රවුන්ස් සහ සමාගම විසින් 3 වන වසර ගොවිපල පුහුණු පාඨමාලාව සඳහා ගොවිපල යන්ත්‍රෝපකරණය පිළිබඳ පුහුණුවක් 2022 අගෝස්තු 25 සහ 26 යන දිනයන්හිදී ආයතනයේදි පවත්වන ලදි. හෙට දිනන දරුවන් නව දැනුමෙන් පෝෂණය කිරීම හා නවීන තාක්ෂණයෙන් යුත් කෘෂිකාර්මික උපකරණ භාවිතය සහ නඩත්තු කිරීම පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම මෙම පුහුණු වැඩසටහනෙහි අරමුණ විය.

3. ජාතික අතථ්‍ය සම්මන්ත්‍රණය 2022 (National Virtual Symposium)

“ඒකාබද්ධ පර්යේෂණ තුලින් තිරසාර කෘෂිකාර්මාන්තය පිළිබඳ ගවේෂණය කිරීම” යන මැයෙන් ජාතික අතථ්‍ය සම්මන්ත්‍රණයක් 2022 ජුනි 28 වැනි දින පැවැත්විණි. NSATRS 2022 හි ප්‍රධාන ඉලක්කය වූයේ කෘෂි තාක්ෂණයෙහි විවිධ පර්යේෂණවල අභියෝග සහ අනාගත දිශානතීන් සාකච්ඡා කිරීමට සංසදයක් සැපයීමයි. මෙම සම්මන්ත්‍රණයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්.ඩී. කරුණාරත්න මහතා සහභාගී විය. Fiji ජාතික විශ්වවිද්‍යාලයේ මහාචාර්ය පෝල් ඉෂී සහ පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය උපාලි සමරජීව මහතා ප්‍රධාන දේශකයන් ලෙස සහභාගී විය. NSATRS-2022 ජාතික අතථ්‍ය සම්මන්ත්‍රණයේදි පර්යේෂණ ලිපි 31 ක් ප්‍රකාශයට පත් කරන ලදි. පර්යේෂකයන්, සිසුන් සහ ගොවි ප්‍රජාව සඳහා කෘෂි තාක්ෂණයට අදාළ දැනුම, අත්දැකීම් සහ නවීන තාක්ෂණය හුවමාරු කර ගැනීමටත් ජාතික කෘෂිකර්මාන්තය දිරිමත් කිරීමටත් විශාල අවස්ථාවක් සලසා දී ඇත.

4. 10 වන කණ්ඩායමේ පූර්ණ කාලීන සිසුන් සඳහා ගොවිපල පුහුණු පාඨමාලාව

2022 ජුන 27 වන දින 3 වන වසරේ 2 වන සමාසිකයේ අධ්‍යයන කටයුතු සිදු කරන සිසුන් සඳහා ගොවිපල පුහුණු පාඨමාලාව ආරම්භ කරන ලදි.

5. 6 වන සහ 7 වන කණ්ඩායම් වල සිසුන්ගේ උපාධි ප්‍රදානෝත්ස්වය

6 වන කණ්ඩායමේ පැරණි විෂය නිර්දේශය යටතේ කෘෂි තාක්ෂණ උපාධි පාඨමාලාව සම්පූර්ණ කරන ලද සිසුන් 42 ක් 2022 ජුලි 23 වන දින BMICH හිදි පැවැති සාමාන්‍ය උපාධි ප්‍රදානෝස්වයේදි උපාධිය ලබා ගන්නා ලදි.

7 වන කණ්ඩායමේ පැරණි විෂය නිර්දේශය යටතේ කෘෂි තාක්ෂණ උපාධි පාඨමාලාව සම්පූර්ණ කරන ලද සිසුන් 33 ක් 2022 දෙසැම්බර් 14 වන දින BMICH හිදි පැවැති සාමාන්‍ය උපාධි ප්‍රදානෝස්වයේදි උපාධිය ලබා ගන්නා ලදි.

6. යටිතල පහසුකම් සංවර්ධනය හා ගොවිබිම් සංවර්ධනය

A. ස්මාර්ට් දේශගුණික අනුවර්තන

වගාව තුල Micro Irrigation Systems සවිකර ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධති ස්ථාපති කර ඇත. මෙම නවීන තාක්ෂණය භාවිතා කිරීමෙන් සීමිත ජල ප්‍රමාණයක් කාර්යක්ෂව සහ අවශ්‍ය ස්ථානයට පමණක් ජලය සැපයීමට උපකාරී වී ඇත. මෙම ක්‍රමය තුලින් ක්ෂේත්‍රයේ ස්ථාපිත භෝගවල හොඳ කාර්යක්ෂතාවයක් ලබා ගැනීමට සුදුසු වේ. මෙම කාර්යක්ෂම Micro Irrigation Systems පද්ධතිය වැඩ බලන ගොවිපල කළමණාකරු ටී.ජී.බී. ධනුෂ්ක මහතා ඇතුළු කණ්ඩායම විසින් ආයතනය තුල ස්ථාපනය කරන ලදි.

B. තණබිම් පුනරුත්ථාපනය කිරීම

පශු සම්පත් ඒකකයේ සිටින ගවයින්ගේ සහ එළුවන්ගේ ආහාර අවශ්‍යතාවය සපුරාලීම සඳහා පවතින තණබිම් ප්‍රතිසංස්කරණය කර ඇත. මෙම ක්‍රියාකාරකම් පිළිබඳව සම්බන්ධීකරණය කරන ලද්දේ වැඩබලන ගොවිපල කළමනාකරු ටී.ජී.බී. ධනුෂ්ක මහතා සහ ආයතනයේ අධ්‍යයන අංශයේ කාර්යය මණ්ඩල සාමාජික එච්.කේ.ආර්.එස් කුමාර මහතා විසිනි.

7. විශ්ව විද්‍යාල අතර පවත්වනු ලැබූ Startup තරඟාවලියේ ප්‍රථම ස්ථානය

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ ශිෂ්‍යයෙකු වන කැලුම් ප්‍රසාද් සමරසිංහ මහතා විසින් විශ්වවිද්‍යාල අතර පවත්වන ලද නවෝත්පාදන තරඟාවලියේදී ප්‍රථම ස්ථානය දිනා ගන්නා ලදි. 2022 ගෝලීය ව්‍යවසායකත්ව සතිය සැමරීම සඳහා AHEAD ව්‍යාපෘතිය සහ ICTA ආයතනය මගින් මෙම තරඟාවලිය සංවිධානය කරන ලදි. වලවේ කෘෂි නිෂ්පාදන නමින් මෙම තරඟාවලියට ඉදිරිපත් වූ අතර තරගය 2022.11.15 වන දින අන්තර්ජාලය හරහා පවත්වන ලදි. කොළඹ විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් UCIARS ආයතනයට ජාතික මට්ටමින් ජයග්‍රහණයක් ලැබීමට අවස්ථාව උදා වූ අතර ජෛව කාසි නමින් නව නිපැයුමක් ඉදිරිපත් කිරීමට හැකියාව ලැබුණි. මෙම ජයග්‍රහණය UCIARS ඉතිහාසයේ විශිෂ්ට සංධිස්ථානයක් වනු ඇත.

1.2 පැළ තවාන්/ විද්‍යාගාර කාර්යසාධනය

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලිය අනුව 2008 වර්ෂයේ දී කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය ආරම්භ කළ ද, කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘතියක් ලෙස 1998 දී දුප්පත් ග්‍රාමීය ගොවි ජනතාව ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ සමාජ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම උදෙසා පටක රෝපණ ඒකකය ආරම්භ කරන ලදී. 2001 වර්ෂයේ දී, කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ පැළෑටි විද්‍යා අංශය (Department of Plant Science) මගින් ආදර්ශනයක් ලෙස මෙම ආයතනය සඳහා පටක රෝපණ කෙසෙල් හා කිරි අල පටක රෝපණය කිරීම හඳුන්වා දෙන ලදී. 2003 වර්ෂයේ සිට මෙම ආයතනය කොළඹ විශ්ව විද්‍යාලයේ මහ පෙන්වීම හා අධීක්ෂණය යටතේ ආයතනයේම නිෂ්පාදනයක් ලෙස පටක රෝපණ කෙසෙල් පැළ නිෂ්පාදනය කර ගෙනයාමට සමත් විය. වගු අංක 15 න් පෙන්නුම් කරන්නේ 2022 වර්ෂයේ ශාක විද්‍යාගාරයේ සහ තවානෙහි සුමට ක්‍රියාකාරිත්වය සඳහා කාර්ය මණ්ඩලය දායක වූ ආකාරයයි.

වගු අංක 15 : 2022.12.31 වන විට පැළතවාන් සහ විද්‍යාගාර කාර්ය මණ්ඩලය

අනු අංකය	නම	තනතුර
1	එච්.රෝහණධීර මහතා	විද්‍යාත්මක සහකාර (අංශ ප්‍රධාන-නිෂ්පාදන)
2	එච්.කේ.එස්. ඉෂාර මහතා	ක්ෂේත්‍ර සුපරීක්ෂක (අංශ ප්‍රධාන-පැළ තවාන් අංශය)
3	ඒ.එන්. අබේගුණවර්ධන මිය	විද්‍යාගාර සහායක
4	එච්.කේ. සමන්ති නිලිනි කුමාරි මිය	විද්‍යාගාර සහායක
5	එම්.ජී.සී. සුදර්ශනී මිය	විද්‍යාගාර සහායක
6	ඒ. ප්‍රියංගා සුදර්ශි මිය	විද්‍යාගාර සහායක
7	යූ. අනුෂා රුවනි මිය	විද්‍යාගාර සහායක
8	ඩබ්.එච්. දිස්නා සඳමාලි මිය	විද්‍යාගාර සහායක
9	ඕ.පී. නිලූකා සුභාෂිනී මිය	විද්‍යාගාර සහායක
10	ඩී. ඉෂාදි නිමල්ගා මිය	විද්‍යාගාර සහායක
11	කේ.පී. උදේනි නිසංසලා මිය	විද්‍යාගාර සහායක
12	එන්.එස් .පෙරේරා මිය	විද්‍යාගාර සහායක
13	එස්.එම්.වීරසූරිය මිය	විද්‍යාගාර සහායක
14	එච්.ආර්.ඒ.මධුමාලි මිය	විද්‍යාගාර සහායක
15	පී.එම්.ටී.පියුමාලි මිය	විද්‍යාගාර සහායක
16	ඩබ්.එච්.කල්පනී මිය	විද්‍යාගාර සහායක

17	කේ.එල්.ඒ.ඒ. තත්සරණි මිය	විද්‍යාගාර සහායක
18	අයි.සී.දොඩම්පේ මෙනවිය	විද්‍යාගාර සහායක
19	අයි.ඩී.ජී.එන්.කුමාරි මිය	විද්‍යාගාර සහායක
20	ඩබ්.කේ.එම්.එස්.සෙව්වන්දි මිය	විද්‍යාගාර සහායක
21	එන්.එස්.ප්‍රදීප් මහතා	වැඩ සහායක
22	ටී.ඒ.කේ.වයි.ඉදුනිල් මහතා	වැඩ සහායක

2022 වර්ෂයේ කාර්යසාධනය

2022 වර්ෂය තුළ පටක රෝපණ පැළ නිෂ්පාදනය සහ විකුණුම් කාර්ය සාධනය පහත වගු සහ සංඛ්‍යා වලින් දක්වා ඇත.

වගු අංක 18 : පටක රෝපණ විද්‍යාගාරයේ පැළ නිෂ්පාදන වාර්තා (සංඛ්‍යාව)


මාසය	කෙසෙල් පැළ
ජනවාරි	15,027
පෙබරවාරි	15,129
මාර්තු	15,013
අප්‍රේල්	2,513
මැයි	13,447
ජූනි	2,659
ජූලි	0
අගෝස්තු	20,011
සැප්තැම්බර්	17,655
ඔක්තෝබර්	23,566
නොවැම්බර්	13,464
දෙසැම්බර්	11,422
එකතුව	**149,906**

වගු අංක 19 : පසුගිය වසර හත සඳහා කෙසෙල් පැල නිෂ්පාදනය සංසන්දනය කිරීම (සංඛ්‍යාව)

මාසය	2016	2017	2018	2019	2020	2021	2022
ජනවාරි	20,594	20,386	18,826	25,628	7,861	5,609	15,027
පෙබරවාරි	20,476	21,527	24,882	19,025	16,360	5,185	15,129
මාර්තු	16,918	25,150	24,680	8,949	10,751	5,465	15,013
අප්‍රේල්	10,815	19,703	18,873	5,429	5,166	5,678	2,513
මැයි	19,079	24,351	27,514	24,023	10,097	8,257	13,447
ජූනි	19,359	23,260	23,504	19,425	18,384	8,182	2,659
ජූලි	19,750	25,184	8,673	20,005	10,437	8,250	0
අගෝස්තු	20,875	22,151	11,318	6,669	5,538	11,237	20,011
සැප්තැම්බර්	24,180	25,420	22,770	6,774	5,750	11,412	17,655
ඔක්තෝබර්	23,481	21,732	27,810	24,243	5,854	12,100	23,566
නොවැම්බර්	18,807	24,481	8,993	18,891	5,126	12,528	13,464
දෙසැම්බර්	18,100	18,180	7,822	14,374	5,211	15,246	11,422
එකතුව	**232,434**	**271,525**	**225,665**	**193,435**	**106,535**	**109,149**	**149,906**

***** 2019 වසරේ උද්ගත වූ කෙසෙල් පැල විකෘති ගැටලුවක් හේතුවෙන් ශාක නිෂ්පාදනය සැලකිය යුතු ප්‍රමාණයකින් පහත වැටුණු අතර උප වගා කිරීමේ අදියර (sub culture stages) 11 සිට 6 දක්වා අඩු විය. එය 2020 සහ 2021 වසරවල නිෂ්පාදනයට බල පෑ අතර COVID 19 වසංගත තත්ත්වය ද එයට අහිතකර ලෙස බලපෑවේය. කෙසේ වෙතත්, 2021 දී, වසංගත කාලසීමාව තුළ රසායනාගාර කාර්ය මණ්ඩලය රොස්ටර් පදනම මත වැඩ කළද ඉලක්ක සමඟ වැඩ කිරීම නිසා සුළු ප්‍රගතියක් ඇති විය.

2022 වර්ෂයේ දී, ඉන්ධන අර්බුදය හේතුවෙන් නිෂ්පාදන ඒකකයට පැල විකිණීමේ ගැටලුවකට මුහුණ දීමට සිදු වූ අතර ඒ අනුව මාස කිහිපයක් සඳහා උපක්‍රමශීලීව නිෂ්පාදනය අඩු කළේය.



රූපසටහන 02 : 2016-2022 පැළ නිෂ්පාදනය සංසන්දනය කිරීම

පසුගිය වසර හතක කාලය තුළ එකතු කරන ලද දත්ත අනුව, ජනවාරි සිට අප්‍රේල් දක්වා සහ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ඉහළ ඉල්ලුමක් පවතින කාලපරිච්ඡේද රටාව පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, 2021සහ 2022 දී, COVID 19 වසංගත තත්වයත්, 2022 රට තුළ ඉන්ධන අර්බුදයත් පැළ නිශ්පාදනය කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය.

2022 වසරේ කෙසෙල් පැළ නිෂ්පාදනය සංසන්දනය

සමස්ත නිෂ්පාදනයෙන් 87% ක්ම ඇඹුල් කෙසෙල් පැළ සඳහා වන අතර ඉතිරි 10% සහ 3% කෝලිකුට්ටු මිටි කැවෙන්ඩිෂ් කෙසෙල් ප්‍රභේදය මඟින් නියෝජනය වේ.


පැළ අලෙවිය සැසඳීම

පටක රෝපණ කෙසෙල් පැළ සඳහා ඇති ඉල්ලුම දේශගුණික තත්ත්වය මත රඳා පවතින අතර වර්ෂා කාලවලදී (සැප්තැම්බර් සිට අප්‍රේල්) ඉහළම ඉල්ලුමක් සහ වියළි කාලවල දී (මැයි සිට අගෝස්තු) අඩු ඉල්ලුමක් වාර්තා වී ඇත. වර්ෂා රටාව වගාව කෙරෙහි සෘජුවම බලපාන අතර ගොවීන් වර්ෂා කාලවල දී පටක රෝපණ කෙසෙල් පැළ විශාල ප්‍රමාණයක් වගා කරයි. මෙම කාලය තුළ විශේෂයෙන් දෙසැම්බර් සහ අප්‍රේල් උත්සව කාලය තුළ කෙසෙල් කැන් සඳහා අධික ඉල්ලුමක් පවතින බැවින් එම කාලය ඉලක්ක කර ගනිමින් ගොවීන් කෙසෙල් වගාවේ නිරත වේ. එමනිසා, මෙවැනි හිතකර දේශගුණික සාධක සහ වෙළෙඳ පොලේ ඉල්ලුම සලකා බලමින් ගොවීන් පටක රෝපණ කෙසෙල් පැළ මිලදී ගනී. කෙසේ වෙතත්, 2022 දී, ඉන්ධන අර්බුද තත්ත්වය තුල පැළ අලෙවිය සැලකිය යුතු ලෙස අඩු කිරීම කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය.

වගු අංක 20 : පසුගිය වසර හත තුළ පැළ අලෙවිය සැසඳීම (සංඛ්‍යාව)

මාසය	2016	2017	2018	2019	2020	2021	2022
ජනවාරි	21,738	17,980	17,759	3,851	27,222	5,551	16,392
පෙබරවාරි	17,950	22,141	12,738	9,704	526	2,712	8,312
මාර්තු	14,924	22,536	26,232	2,344	4,292	5,048	7,916
අප්‍රේල්	13,721	21,467	15,259	11,524	19,668	5,617	7,967


මැයි	12,830	19,652	18,968	4,923	7,434	5,785	14,800
ජූනි	13,527	20,780	6,489	6,211	10,956	6,222	1,149
ජූලි	11,490	20,576	11,049	7,008	14,276	6,348	2,100
අගෝස්තු	19,465	21,097	13,454	15,425	9,106	6,820	8,712
සැප්තැම්බර්	18,837	20,877	7,697	21,701	5,791	7,384	6,062
ඔක්තෝබර්	22,040	22,302	19,692	5,988	5,169	8,514	8,326
නොවැම්බර්	17,327	21,137	19,349	12,744	2,810	5,759	20,996
දෙසැම්බර්	20,884	20,530	14,405	8,027	4,658	7,212	11,285
එකතුව	**2,04,733**	**2,51,075**	**1,83,091**	**109,450**	**111,908**	**72,972**	**114,017**



රූප සටහන 03: 2016-2022 වර්ෂ තුල පැළ අලෙවිය සැසඳීම

වගු අංක 21 : අලෙවි කරන ලද පැළ සංඛ්‍යාව අනුව පැළ අලෙවිය සැසඳීම– 2022


විස්තරය	පැළ සංඛ්‍යාව
පැළ අලෙවිය 100>	7,579
පැළ අලෙවිය 100<	106,800



රූප සටහන 04: 2022 වර්ෂයේ පැළ අලෙවිය

වගු අංක 22 : ප්‍රභේද අනුව පැළ අලෙවිය - 2022

ප්‍රභේදය	පැළ සංඛ්‍යාව
ඇඹුල්	100,552
කෝලිකුට්ටු	11,497
කැවැන්ඩිස්	1,968



රූප සටහන 05: ප්‍රභේද අනුව පැළ අලෙවිය


2022 වර්ෂය තුළ පටක රෝපිත කෙසෙල් පැළ අලෙවියෙන් මිලියන 10.1 ක ආදායමක් උපයා ගැනීමට ආයතනයට හැකි විය. ක්ෂේත්‍රය තුළ රෝග වැළඳීමේ හැකියාව අඩු මට්ටමක පැවතීම හේතුවෙන් ඉහළ ඉල්ලුමක් සහිත ප්‍රභේදය ඇඹුල් කෙසෙල් වූ අතර වසර පහක කාලයක් දක්වා ඉහල ඉපයීම් ශක්‍යතාවක් පවත්වාගෙන තිබේ. දෙවන පරම්පරාවේදී ඇතිවන දරුණු පැනමා රෝගය හේතු කොට ගෙන තනි පැළ කළමනාකරණ ක්‍රමය යටතේ ගොවීන් කෝලිකුට්ටු කෙසෙල් වගා කරනු ලබයි. මීට කැවෙන්ඩිෂ් නැමැති කෙසෙල් ප්‍රභේදය තෙත් කලාපය සඳහා පමණක් නිර්දේශ කල හැකි අතර, ඒ සඳහා අඩු ඉල්ලුමක් පවතින අතර ඉතාමත් සීමිත තෙත් කලාපීය ගොවීන් පිරිසක් සඳහා ආයතනය විසින් පහසුකම් සලසනු ලබයි.

පටක රෝපිත කෙසෙල් සඳහා පවතින ඉල්ලුම සාම්ප්‍රදායිකව නිෂ්පාදිත පැළ සඳහා පවතින ඉල්ලුමට වඩා ඉහල මට්ටමක පවතින අතර, දිගුකාලීන ලාභදායිත්වය සහ රෝගවලට භාජනයවීම අඩු වීම හේතු කොට ගෙන ඇඹුල්

කෙසෙල් සඳහා පවතින ඉල්ලුම වැඩිවිය. ආයතනය සමග සම්බන්ධව කටයුතු කරන ගොවීන්ගෙන් බහුතරයක් (64%) නියෝජනය කරනුයේ ඉහළ මිලදී ගැනීමේ හැකියාවක් පවතින ගොවීන් වන අතර මිල දී ගැනීමේ හැකියාව අඩු මට්ටමක පවතින ගොවීන් ආයතනය සමඟ සම්බන්ධ වී ඇත්තේ ඉතා අඩු ප්‍රමාණයකි (36%).

වගු අංක 23: 2022 වර්ෂයේ ගොවීන්ගේ මිලදී ගැනීමේ හැකියාව

ගොවීන්ගේ මිලදී ගැනීමේ හැකියාව	ගොවීන් සංඛ්‍යාව
පැළ 100 කට වඩා වැඩියෙන් මිලදී ගත් ගොවීන් සංඛ්‍යාව	114
පැළ 100 කට වඩා අඩුවෙන් මිලදී ගත් ගොවීන් සංඛ්‍යාව	204




රූප සටහන 06: 2022 වර්ෂයේ ගොවීන්ගේ මිලදී ගැනීමේ හැකියාව

ආයතනය මගින් අඩු මිල ගණන් යටතේ දේශීය ගොවීන්ට කෙසෙල් පැළ ලබාදෙන අතර ලංකාවේ දුරස්ථ ප්‍රදේශ නියෝජනය කරමින් ගොවීන් රැසක් ආයතනය සමඟ සම්බන්ධව කටයුතු කරයි. ආයතනයේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය විසින් එම වගාවන් විධිමත්ව නියාමනය කරමින් ඔවුන්ට අවශ්‍ය උපදෙස් සහ මගපෙන්වීම ලබා දේ. පටක රෝපණ කෙසෙල් පැළ වගා කරන ගොවි ප්‍රජාව රටපුරා ව්‍යාප්ත කිරීම සඳහා ආයතනයේ ක්ෂේත්‍ර නිලධාරීන් ක්‍රමානුකූලව ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කරන ලදී.

පටක රෝපණ කෙසෙල් පැළ සම්බන්ධ නිෂ්පාදන ක්‍රියාවලිය

පටක රෝපණ තාක්ෂණය යනු අපුති තත්වයන් යටතේ කෘතිම මාධ්‍ය උපයෝගී කර ගනිමින් වෛරස් වලින් තොර දුහිතෘ ශාක (මාතෘ පටක) නිෂ්පාදනය කිරීමයි. එම නිසා තාක්ෂණය විශේෂිත වන අතර එබැවින් මාතෘ පටක පිහිටුවීමේ සිට දැඩිකිරීම ආරම්භ කරන තෙක් වන සියළුම ක්‍රියා කාරකම් සඳහා දක්ෂ එමෙන්ම නිපුණතාවයෙන් හෙබි සේවක පිරිසක් අවශ්‍ය වේ. දර්ශීය ලෙස, පටක රෝපණ තාක්ෂණය ප්‍රධාන පියවරයන් පහක් ඔස්සේ සිදුකරණු ලබන අතර, එනම්, නිරෝගී හා දිරිමත් මාතෘ ශාක වරණය (තෝරා ගැනීම), කෘතිම පෝෂණ මාධ්‍යක් තුළ මාතෘ ශාක කොටස් පිහිටු වීම, අංකුර ජනන අවධිය, මුල් වර්ධන අවධිය හා පැළ දැඩි කිරීමේ අවධියයි. අග්‍රස්ථ විභාජක රෝපණය මගින් කෙසෙල් පැළ නිෂ්පාදනය ආයතනය තුළ සිදුකරන අතර නිෂ්පාදනයේ ගුණාත්මය හා විකෘති තත්ව අඩු කිරීම සඳහා උපායමාර්ගික පියවරයන් ගනු ලබයි. ඉතා උසස් තත්වයේ සම්මත පරාමිතීන් ජීවානුහරණ ක්‍රියාවලි සඳහා යොදාගනු ලබන අතර උපවගා මට්ටම් (sub culture stages) 8 ක උපරිම ප්‍රමාණයක් භාවිතා කරනු ලැබේ. ක්‍රමවත් හා පරිපූර්ණ ලෙස දත්ත වාර්ථා තැබීම තුළින් අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවකදී අදාල මාතෘ පටකය පිළිබඳව සියළුම විස්තර පහසුවෙන් ලබාගත හැකිය. සේවක පිරිසගේ යෝග්‍යතාවය සහ ධාරිතාවය මත නිවරදි ලෙස ඔවුන් සුදුසු නිෂ්පාදන අවස්ථාවේ පිහිටුවා ඇත.



රූප සටහන 07: පටක රෝපණ කෙසෙල් පැළ සම්බන්ධ නිෂ්පාදන ක්‍රියාවලිය

3. පර්යේෂණ සහ නවෝත්පාදන

පර්යේෂණ මාතෘකා වල අදහස වෙනස් විය හැකි බැවින් එම මාතෘකා සිංහලට පරිවර්තනය නොකරන ලදී.

2022 දී සිදු කළ ප්‍රකාශන

Journal Full Papers

1. Gunathilake DMCC and Senadeera W, (2022) Effect of Commercial Level Modified Atmospheric Storage for Paddy (Oryza sativa). Journal of COJRR COJ Reviews and Research, 4(1), 1-5 DOI: 10.31031/COJRR.2022.04.000578

2. Jeyavaran, A., **Bandusekra, B. S**., Sivakumar, K., & Gunathilake, C. (2022). Vermicompost – a Better Organic Manure in Integrated Plant Nutrient System for *Vigna radiata* (Mung Bean). *Journal of Agro-technology and Rural Sciences*, *2*(2), 23–29. DOI: http://doi.org/10.4038/atrsj.v2i2.44

3. **Chandimala U.R., Gunathilake D.M.C.C., Vidanapathirana N.P., Rifnas L.M.** (2022). Perception of Cultured Meat among Sri Lankan Community. Journal of Agro-technology & Rural Sciences; 1(2), pp.21-26 https://uciars.cmb.ac.lk/wp-content/uploads/2017/06/ATRS-Vol-1-Issue-2- January-2022-with-DOI.pdf

4. **Chandimala U.R**., Rajawardhana D.U., Lakshman P.L.N. and Hewajulige, I.G.N. (2022). Isolation and Characterization of Yeasts from Locally Available Foods. Journal of Agro-technology & Rural Sciences; 2(2), pp.17-22 http://doi.org/10.4038/atrsj.v2i2.43

5. **Rifnas, L. M**. Vidanapathirana, N. P., Silva, T. D., Dahanayake, N., Subasinghe, S., Weerasinghe, S., Nelka, S. A. P., Rohanadeera, H. and Madushani, W. G. C. (2022). Effect of gamma radiation on morphological changes and vegetative growth in Sunflower (*Helianthus annuus* L.). *Journal of Agricultural Sciences, 16(2), pp.25–34. DOI: http://doi.org/10.4038/agrieast.v16i2.114*

6. Najah, M.F.A., Sutharsan, S. and **Rifnas, L.M.** 2022. Effects of different fertilizers on growth and yield of okra (*Abelmoschus esculentus*) cv. Haritha in Ampara district of Sri Lanka. *International Journal of Biology, Pharmacy and Allied Sciences.* 10 (12): 563-576.

7. Manasar, A. L., Sutharsan, S., **Rifnas, L. M.** and Iqbal, S. L. (2022). Effects of mulching on growth and yield of Okra (*Abelmoschus esculentus*) cv. Haritha. *International Journal of Advance and Innovative Research*. 9(3):119-125.

8. **Nelka, S.A.P.,** Vidanapathirana, N.P., Dahanayake, N., Subasinghe, S., Silva, T.D., Weerasinghe,S., Rifnas, L.M., Rohanadeera, H., Madushanka, W.C.M.S., & Dhushane, S. (2022). Effect of gamma irradiation on seed germination, survivability and growth performances of *Calotropis gigantia* (Vara). International Journal of Minor Fruits, Medicinal and Aromatic Plants, Vol 8 (1), 40-46

9. **N P Vidanapathirana**. Study on antagonistic effect of spent *Pleurotus* mushroom substrate. International Journal of Botany Studies, Volume 7, Issue 9, 2022, Pages 25-28

10. **N P Vidanapathirana**. Evaluation of *Glycosmis pentaphylla* (Dodampana) plant extract as a source of insect repellent in radish (*Raphanus sativus*). International Journal of Agriculture and Plant Science, Volume 4, Issue 2, 2022, Pages 80-83

11. **N.P. Vidanapathirana**, S. Subasinghe, K. Sunil, K.G. Ketipearachchi, A.J.M.C.M. Siriwardana, B.S. Bandusekara (2022). Growth and yield performances of turmeric (curcuma longa) grown in dry zone of Sri Lanka as affected by planting space, growing media and shade, *Journal of Agro-technology and Rural Sciences 1 (2), 27-31*

12. **Vidanapathirana, N. P.** (2022). Effects of Different Organic Applications on Growth and Yield of *Raphanus sativus* (Raddish). *Journal of Agro-technology and Rural Sciences*, *2*(2), 11–16. DOI: http://doi.org/10.4038/atrsj.v2i2.42

13. **Vidanapathirana, N.P**., Tharanga, S. J. and Siriwardana, A. J. M. C. M. (2022), Effects of Cinnamon (Cinnamomum zeylanicum) powder extract against the pest of Radish (*Raphanus raphanistrum* Subsp. Sativus) International Journal of Minor Fruits, Medicinal and Aromatic Plants. Vol. 8 (1): 61-64.

14. Dodampe, I. C., **Rifnas, L. M.,** Madushani, W. G. C. and Weerasinghe, S. S. (2022). Development of Eco-friendly Smart Bio-food Wrapper using Undersized *Heliconia bihai* leaves. *International Journal of Minor Fruits, Medicinal and Aromatic Plants.* 8(2): 86-90. (Short communication)

Conference full papers

1. Ketipearachchi, K.G., Vidanapathirana, N.P., Subasinghe, S.& Silva, T.D.(2022) Geographical Distribution and Morphological Characterization of Tropical Almond (*Terminalia catappa L.*) in Southern Province, Sri Lanka. SLIIT International Conference on Advancement of Science & Humanities (SICASH), pP261-265

2. **Siriwardena B. P.**, Vidanapathirana N. P., Ketipearachchi K. G., Rajasekara L. R. W. D. M., (2022). Social and Economic Effects of the Cultivation of *Solanum Virginianum*; A Case Study in Anamaduwa DS Division, Sri Lanka. Proceedings of SLIIT International Conference on Advancements in Sciences and Humanities, (11) October, Colombo, 256 - 260.

Abstract Publications

1. Gunathilake D. M. C. C. 2022 Manufacturing of turmeric powder using the turmeric grown in semi-arid zone of Sri Lanka, Proceedings of the 3rd National Symposium on Agro- Technology and Rural Sciences, The University of Colombo Institute for Agro-Technology and Rural Sciences, Hambantota, Sri Lanka.

2. **Chandimala U.R**., Jayamanne V.S., Dhushane S. (2022). Impact of Covid-19 Pandemic on Access to Foods, Dietary Habits and Nutrient Intake of Adults in Sri Lanka. Proceedings of 3rd National Symposium on Agro-technology & Rural Sciences, University of Colombo Institute for Agro-Technology & Rural Sciences, Sri Lanka, pp.18 https://uciars.cmb.ac.lk/wpcontent/uploads/2017/06/Proceeding-NSATRS-2022.pdf

3. **LM Rifnas**, NP Vidanapathirana, TD Silva, N Dahanayake, S Subasinghe, SS Weerasinghe, WGC Madushani and SAP Nelka. (2022). Effects of gamma irradiation on the performances of Acalypha hispida (Cat's tail plant*). Proceedings of National Symposium on Floriculture Research (NaSFloR).* Pp. 02.

4. Gallage K.Y., **Weerasinghe S**., **Chandimala U.R.**, Weerathunga H. (2022). Extraction of Yellow Colorant from the Peel of Banana (Musa spp.) and Determination of Carotenoids. Proceedings of 3rd National Symposium on Agro-technology & Rural Sciences, University of Colombo Institute for Agro-Technology & Rural Sciences, Sri Lanka, pp.24 https://uciars.cmb.ac.lk/wpcontent/uploads/2017/06/Proceeding-NSATRS-2022.pdf

5. PG Samarawickrama, SL Nawarathna, S Subasinghe and NP Vidanapathirana (2022), Growth and yield performances of evolvulus alsinoides. linn (visnukkranthi) as affected by different methods of irrigation and weed management, 3rd National Symposium on Agro-Technology and Rural Sciences – 2022, University of Colombo Institute for Agro-Technology and Rural Sciences – Sri Lanka, 10.

6. Samarasinghe S.P.A.K, **Chandimala U.R**. and **Gunathilake D.M.C.C.** (2022). Development of a Plant-based Milk Using Tropical Almond (Terminalia catappa L.) Nuts. Proceedings of 1st Annual Research Session, Faculty of Technology, Eastern University, Sri Lanka. http://www.esn.ac.lk/fte/porcee2022

7. **Siriwardena, B. P**., Warnasooriya, R. W. M. R. L., Senarathne, S. M. A. C. U., Vidanapathirana, N. P., Ketipearachchi, K. G., (2022) Development of Nutritious Curry Cubes by Using Mung Bean (Vigna radiata) and Cowpea (Vigna unguiculata), Proceedings of the 3rd National Symposium on Agro-Technology and Rural Sciences (NSATRS). 28th June 2022. University of Colombo Institute for Agro Technology and Rural Sciences, Sri Lanka, Pp 19.

8. **P. Siriwardena.,** K. G. Ketipearachchi., L. R. W. D. M. Rajasekara., (2022) Farmer issues on *Solanum Virginianum* (Katuwelbatu) Cultivation, Proceedings of the 1st Annual Research Session - 2022, Faculty of Technology, EUSL. 06th October 2022. Faculty of Technology Eastern University, Sri Lanka, Pp 43.

9. **Siriwardena B. P.**, Abeywickrama L. M., Sandika A. L., Vidanapathirana N. P., (2022) Freshmen's perceptions of blended learning in higher education; A case of University of Colombo Institute for Agro-Technology and Rural Sciences, Proceedings of the 22nd

Conference Postgraduate Research(IPRC), Faculty of Graduate Studies, University of Kelaniya, Sri Lanka,, Pp 07.

10. K. G. Ketipearachchi, S. Subasinghe, N. P. Vidanapathirana, T. D. Silva (2022) Geographical Distribution and Morphological Characterization of Tropical Almond (*Terminalia catappa* L.) in Hambantota District, Sri Lanka, Annual Research Session - 2022, Faculty of Technology, EUSL (ARSFOT-2022) Pp 41

Book Chapters

1. Hemathilaka, D.M.K.S. and Gunathilake D.M.C.C. 2021 "Agricultural productivity and food supply to meet increased demands" In Future Foods – Global Trends, Opportunities, and Sustainability Challenges (pp 539 -551) Academic Press publications by Elsevier (ISBN: 978-0-323-91001-9) https://doi.org/10.1016/B978-0-323-91001-9.00016-5

2. Hemathilaka, D.M.K.S. and Gunathilake D.M.C.C. 2021 "High-productive agricultural technologies to fulfill future food demands: Hydroponics, aquaponics, and precision/smart agriculture" In Future Foods – Global Trends, Opportunities, and Sustainability Challenges (pp 555-567) Academic Press publications by Elsevier (ISBN: 978-0-323-91001-9) https://doi.org/10.1016/B978-0-323-91001-9.00018-9

නව නිපැයුම් / නවෝත්පාදන

1. **"ඒකාබද්ධ වී-මත්ස්‍ය ගොවිතැන (Integrated rice-fish farming systems)"** තුල මිරිදිය ධීවර කටයුතු සඳහා මත්ස්‍ය සරණාගත පොකුණ

නවීන තාක්ෂණික ක්‍රමවේදයක් තුළ ඒකාබද්ධ වී-මත්ස්‍ය ගොවිතැන ශ්‍රී ලංකාවේ වියළි කලාපයට අලුත්ම දැකිමක් වේ. මෙම ක්‍රියාදාමයේ ඇති ප්‍රධානතම බාධකය වන්නේ වියළි කාලවලදී හෝ වී අස්වැන්න නෙලීමෙන් පසු කුඹුර තුල මාළු නඩත්තු කිරීමේ තිබෙන දුෂ්කරතාවයයි. මෙම කාලසීමාව තුල, වර්ෂාව ලැබෙන තුරු හෝ ඒකාබද්ධ වී - මත්ස්‍ය ගොවිතැන තුලින් වී වගාව ආරම්භ වන තෙක් මත්ස්‍යයින්, මත්ස්‍ය සරණාගත පොකුණ තුල නඩත්තු කළ හැකිය. මෙම සොයා ගැනීම සිදුකරන ලද්දේ ආයතනයේ අධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජික එච්.කේ.ආර්.එස්. කුමාර මහතා සහ ශිෂ්‍ය පර්යේෂණ සහකාරවරයකු විසිනි.



2. ඉදුණු කෙසෙල් ලෙලි උපයෝගි කරගෙන ස්වභාවික කහ වර්ණකය නිස්සාරණය කිරීම

ආහාර සඳහා අඩංගු කරන කෘත්‍රිම වර්ණක අඩංගු සංයෝග වෙනුවට ස්වභාවික කහ වර්ණකය නිස්සාරණය කර ඇත. ඇඹුල් කෙසෙල් ලෙලි වලින් ස්වභාවික කහ වර්ණය නිස්සාරණය කර ගැනීමේ ඉහල විභව තාවයක් ඇත. එසේම මෙය කෘෂිකාර්මික අපද්‍රව්‍යයක් ලෙස බැහැර කිරීමට වඩා කෙසෙල් ලෙලි භාවිත කිරීම ඉතාමත් සඵලදායි ක්‍රමයක් ලෙස හඳුනාගත හැකිය. අධ්‍යයන කාර්යය මණ්ඩලයේ

සාමාජිකයින් වන යු.ආර්. වන්දිමාලා මෙනවිය සහ ආචාර්ය සුජාතා වීරසිංහ මහත්මියගේ මගපෙන්වීම මත පර්යේෂණ ශිෂ්‍යයෙකු වන කේ.වයි. ගාල්ලගේ මහත්මිය විසින් මෙය සොයා ගන්නා ලදි.

3. **අන්නාසි පැළ සඳහා රසායනික පොහොර යෙදීමට මෙවලමක් නිර්මාණය කිරීම**

ආන්නාසි ශාකයේ කටු සහ තියුණු උල් වූ පත්‍ර ඇති බැවින් හානියක් නොවී පොහොර දැමීම තරමක් අපහසුය. එම නිසා පොහොර යෙදීමේ කාර්යක්ෂමතාවය අඩුවන අතර, මෙම දුෂ්කරතාවය හේතුවෙන් පොහොර නාස්තිය වැඩි වේ. මෙම බාධකය මහහරවා ගැනීමට ශාකයේ මුලට පොහොර පහසුවෙන්, ඵලදායි හා කාර්යක්ෂමව යෙදීම සඳහා මෙම මෙවලම සකස් කර ඇත. මෙම මෙවලම පරිශීලනය කරන වගාකරුවන්ට ඉතාමත් හිතකාමී, අඩු වියදම් සහ පහසුවෙන් භාවිතා කල හැකි උපාංගයකි. අධ්‍යයන කාර්යය මණ්ඩලයේ එල්.එම්. රිෆ්නාස් මහතාගේ සහ ආචාර්ය සුජාතා වීරසිංහ මහත්මියගේ මගපෙන්වීම මත පර්යේෂණ ශිෂ්‍යයෙකු වන එන්. අහමද් රිස්නි විසින් මෙය නිර්මාණය කරන ලදි.



4. **කෙසෙල් වගාකරුවන් සඳහා “Smart bunch manager” නිර්මාණය කිරීම**

කෙසෙල් වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය මෙහෙයුම් කරුණු තුනක් සම්පූර්ණ කල යුතු වේ. ඒවා නම් de-belling, de-handing සහ bunch covering වේ. මෙම උපකරණය භාවිතා කිරීමෙන් මෙම මෙහෙයුම් තුන එකවර සිදුකළ හැකිය. එම නිසා මෙම උපකරණය **“Smart bunch manager” ලෙස හඳුන්වයි.** මෙම උපකරණය හැසිරවීමට, ශ්‍රම අවශ්‍යතා අවම කිරීමට, අඩු පිරිවැයකින් නිර්මාණය කිරීමට හැකිවීම නිසාවෙන් අවසානයේ කෙසෙල් කැනේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට මෙහෙවින් උපකාරී වේ. අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සාමාජික බී.පී. සිරිවර්ධන මහතාගේ සහ ආචාර්ය සුජාතා වීරසිංහ මහත්මියගේ මගපෙන්වීම යටතේ පර්යේෂණ ශිෂ්‍යයෙකු වන ධම්මික කුමාර විසින් මෙය නිර්මාණය කරන ලදි.



5. **ලාටෙක්ස් කැට ගැසීමේ කුඩා ටැංකිය**

රබර් කර්මාන්තයේ රබර් කිරි කැට ගැසීම සඳහා බහාලුම් යොදා ගැනේ. ඒ සඳහා රදවනයන් ලෙස කුඩා ඇලුමිනියම් තැටි බහුලව යොදා ගැනීම කුඩා ව්‍යාපාරිකයන් විසින් සිදුකරනු ලැබේ. කෙසේ වුවත්, ඒ සඳහා වන අධික මිල, වැඩි ශ්‍රමයක් සහ ඉඩකඩ අවශ්‍ය වන නිසා ඉතාමත් අඩු කාර්යක්ෂමතාවයක් පවතී. එයට විසඳුමක් ලෙස කුඩා පරිමාණ කර්මාන්ත ඉලක්ක කර ගනිමින් ආයතනය විසින් රබර් කිරි කැට ගැසීමේ කුඩා ටැංකියක් නිර්මාණය කර ඇත. අධ්‍යයන කර්යය මණ්ඩලයේ කේ.ජී. කැටිපේආරච්චි

මහත්මියගේ සහ ආචාර්ය එන්.පී. විදානපතිරණ මහත්මියගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ පර්යේෂණ ශිෂ්‍යයෙකු වන එස්.වී.පී.ටී. ඩිල්ෂාන් මහතා විසින් මෙය නිර්මාණය කර ඇත.





6. **පලතුරු මැස්සන්ගේ හානියෙන් ආරක්ෂා කර ගැනීම සඳහා කෙසෙල් කදේ කෙඳි වලින්, පේර ගෙඩිය ආවරණය කළ හැකි ආවරණයක් නිර්මාණය කිරීම**

සාමාන්‍යයෙන්, පේර ගෙඩිවලට පලතුරු මැස්සන්ගේ දැඩි හානියක් එල්ල වන අතර එම නිසා පේර ගෙඩිය සඳහා ආවරණයක් යෙදීම තුලින් හානිය වලක්වා ගත හැකිය. මෙම පලතුරු ආවරණය කිරීම සඳහා බහුලව යොදා ගනු ලබන්නේ පොලිතීන් ආවරණයි. එය ජෛව හායනයට ලක් නොවන නිසා ගැටලුවක් වී තිබේ. එබැවින් ස්වභාවික තන්තු වලින් සකස් කල පළතුරු ආවරණයක් හදුන්වා දීම වැදගත් වේ. ඒ අනුව අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සාමාජිකයින් වන කේ.ජී. කැටිජේආරච්චි මහත්මියගේ සහ ආචාර්ය සුජතා වීරසිංහ මහත්මියගේ මගපෙන්වීම යටතේ පර්යේෂණ ශිෂ්‍යාවක වන සමීරා දිල්ෂානි මෙනවිය විසින් ස්වභාවික තන්තු වලින් නැවත භාවිතා කළ හැකි පළතුරු ආවරණයක් නිපදවන ලදි.



7. **පැපොල් සහ කෝමාරිකා සාරය යොදාගෙන සබන් නිෂ්පාදනය කිරීම**

විශේෂයෙන් හොදින් ඉදුණු පැපොල් වල පසු අස්වනු හානිය 40% ක් පමණ වේ. එමනිසා පරිභෝජනයට ගන්නා පලතුරු ප්‍රමාණයෙන් ඕබ්බට වැඩිපුර ඉදුණු පලතුරු ප්‍රයෝජනවත් ආකාරයෙන් භාවිතා කිරීම උචිත වේ. එසේම කෝමාරිකා යනු වයස්ගත වීම වළක්වන විටමින් A නිපදවන ස්වභාවිකව වගා කළ හැකි ඖෂධ පැළෑටියකි. එම නිසා පැපොල් සහ කෝමාරිකා වල අතිරික්ත ප්‍රමාණය යොදාගෙන සබන් නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍යයක් ලෙස භාවිතා කලහැකිය. සාමාන්‍යයෙන්, වෙළඳපොලේ ඇති සබන් සහ රූපලාවණ්‍ය භාණ්ඩ සඳහා රසායනික සංයෝග සහ කෘතිම ප්‍රති-ක්ෂුදු ජීවී කාරක අඩංගු කර ඇත. මෙම නිෂ්පාදන භාවිතය නිසා සෞඛ්‍ය ගැටලු ඇතිවිය හැකිය. විශේෂයෙන්ම නිතර සමේ කැසීම ඇති විය හැකිය. පැපොල් සහ කෝමාරිකා අඩංගු සබන් තුලින් සමට සිනිදු සහ මෘදු ගතිය ඇති කරයි. මෙම සබන් නිෂ්පාදනය අවම යෙදවුම් වලින් නිපදවිය හැකි අතර ගෘහස්ථ මට්ටමින් මෙම කර්මාන්තය සිදුකල හැකිය. අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ඒ.ජේ.එම්.සී.එම්. සිරිවර්ධන මහතාගේ සහ ආචාර්ය ඩී.එම්.සී.සී. ගුණතිලක මහතාගේ මගපෙන්වීම යටතේ පර්යේෂණ ශිෂ්‍යයෙකු වන එම්.ජේ.එම්. ජේස්ලි මහතා විසින් මෙය නිපදවන ලදි.



8. **කෙසෙල් කොළ මටුලු යොදාගෙන කෙසෙල් වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා ආවරණයක් නිර්මාණය කිරීම**

කෙසෙල් කැන් වල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා පොලි-සැක් බෑග්, කඩදාසි බෑග් සහ සිදුරු රහිත පොලිතීන් බෑග් වලින් ආවණය කිරීම සිදුකරනු ලැබේ. කෙසේ වෙතත්, ස්වභාවිකව දිරාපත් වන සහ නැවත භාවිතා කළ හැකි කෙසෙල් කොල සහ පොල් මටුලු උපයෝගි කරගෙන හරිත ආවරණයක් ලෙස බෑග් නිෂ්පාදනය කල හැකි අතර එය පහසු හා ලාභදායි වේ. අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සාමාජිකයින් වන කේ.ජී. කැටිපේආරච්චි මහත්මියගේ සහ ආචාර්ය සුජාතා වීරසිංහ මහත්මියගේ මගපෙන්වීම මත පර්යේෂණ ශිෂ්‍යාවක වන ඩබ්.ඩී. විදානගමගේ මහත්මිය විසින් මෙම බෑග් නිර්මාණය සිදුකරන ලදි.



4. පුහුණු, වැඩමුළු සහ කාර්ය මණ්ඩල සංවර්ධනය

2022 වර්ෂය තුළ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් පුහුණු වැඩසටහන් කිහිපයකට සහභාගී වී ඇත.

වගු අංක 24: අධ්‍යයන කාර්ය මණ්ඩලය සහභාගී වූ වැඩසටහන්

අංක	සේවකයාගේ නම	තනතුර	වැඩසටහන සඳහා සහභාගී වූ දිනය	සහභාගී වූ වැඩසටහන්
1	එස්.ඒ.පී. නෙල්කා මහත්මිය	පාඨමාලා සම්බන්ධීකාරක	2022.11.01-2022.11.03	UNESCAP - එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසම මගින් ආසියා සහ පැසිපික් කාන්තා ව්‍යවසායකයින් සඳහ පුහුණුව
2	එස්.එල්. නවරත්න මහත්මිය	පාඨමාලා සම්බන්ධීකාරක		
3	එච්.කේ.එස්.එන්. කුමාරි මහත්මිය	විද්‍යාගාර සහායක		
4	ඒ.ඩි.පි. ද සොයිසා මහත්මිය	සහකාර මූල්‍යාධිකාරී	2022.09.14-2022.09.16	පොදු ප්‍රසම්පාදනයේදි ලංසු ඇගයීම

5	ඒ.ඩි.පි. ද සොයිසා මහත්මිය	සහකාර මූල්‍යාධිකාරී	2022.07.28	SLFRS 15 - ගණුදෙනුකරුවන්ගේ සම්බන්ධතා තුලින් ලැබෙන ආදායම

5. නවීකරණය කිරීම් සහ ඉදිකිරීම් ව්‍යාපෘති

පහත වගු අංක 25 මඟින් ආයතනයේ දැනටමත් ආරම්භ කර ඇති ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය නිරූපණය කෙරේ.

වගු අංක 25: නවීකරණය කිරීම් සහ ඉදිකිරීම් ව්‍යාපෘති

අංකය	ව්‍යාපෘති නාමය	වෙනත් කරුණු
2019 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ ව්‍යාපෘති		
01	ඉංජිනේරු වැඩ ඒකකය ඉදි කිරීම	ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 7.89 (VAT සහිතව) කොන්ත්‍රාත්කරු: විජේසිංහ ඉදිකිරීම් සමාගම භෞතික ප්‍රගතිය: 100% මූල්‍ය ප්‍රගතිය :100 %
02	බාහිර විදුලි පද්ධතිය ස්ථාපිත කිරීම	ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 9.99 (VAT සහිතව) කොන්ත්‍රාත්කරු: සන්පවර් ඉංජිනියරින් පුද්ගලික සමාගම භෞතික ප්‍රගතිය: 100% මූල්‍ය ප්‍රගතිය : 100%
03	එළු ගාල ඉදි කිරීම	ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 5.45 (VAT සහිතව) කොන්ත්‍රාත්කරු: චන්දන එන්ටර්ප්‍රයිසස් භෞතික ප්‍රගතිය: 100% මූල්‍ය ප්‍රගතිය : 100%
2022 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ ව්‍යාපෘති		
01	කුකුළු ගෘහයක් ඉදිකිරීම	ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 7.9 (VAT සහිතව) කොන්ත්‍රාත්කරු: ආයතනයේ සේවකයින් භෞතික ප්‍රගතිය: 50% මූල්‍ය ප්‍රගතිය : 28%
02	පටක රෝපණ විද්‍යාගාරයේ යෝජිත කාමර කොටස් කිරීම	ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 10.8 (VAT සහිතව) කොන්ත්‍රාත්කරු: වී.කේ. ඉදිකිරීම් සමාගම භෞතික ප්‍රගතිය: 75% මූල්‍ය ප්‍රගතිය : 56%
03	ජල පිරිපහදු (RO) පද්ධතිය (500LTR/H)	ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 5.45 (VAT සහිතව) කොන්ත්‍රාත්කරු: ඇක්වා ප්ලස් සොලුෂන් සමාගම භෞතික ප්‍රගතිය: 95% මූල්‍ය ප්‍රගතිය : 0%

6. මූල්‍ය

6.1 මූල්‍ය ප්‍රගතිය

වගු අංක 26 : පුනරාවර්තන වියදම් විස්තර

විෂය	2022 (රු.)	2021 (රු.)
පෞද්ගලික පඩිනඩි	86,921,328.00	75,582,791.25
ගමන් වියදම්	56,895.00	86,466.12
සැපයුම්	6,777,743.89	3,818,709.02
නඩත්තු	1,287,087.96	1,353,142.92
ගිවිසුම්ගත සේවා	26,663,639.91	18,677,394.67
වෙනත්	24,028,430.94	8,911,868.15
මුළු එකතුව	**145,735,126.38**	**108,430,372.13**

වගු අංක 27 : ප්‍රාග්ධන වියදම් විස්තර

විෂය	2022 (රු.)	2021 (රු.)
ගොඩනැගිලි සහ ව්‍යුහයන් අත්පත් කරගැනීම සහ වැඩි දියුණු කිරීම්	-	38,563,126.37
ගොඩනැගිලි සහ ව්‍යුහයන් පුනරුත්ථාපනය	9,313,712.05	46,136,943.00
වාහන	-	4,899,999.00
රසායනාගාර සහ ඉගැන්වීම	488,888.00	120,670.00
පිරියත යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	943,544.95	1,011,270.00
ගෘහ උපකරණ	31,499.00	595,578.00
කාර්යාල උපකරණ	6,972,953.40	803,520.00
ලී බඩු සහ සවි කිරීම්	1,908,219.62	236,115.00
මෘදුකාංග	-	695,000.00
මුළු එකතුව	**19,658,817.02**	**93,062,221.37**

වගු අංක 28 : ව්‍යාපෘති වියදම් විස්තර (දේශීය/ විදේශීය අරමුදල්)

නම	මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.	2022 වර්ෂයේ වියදම රු.	2022.12.31 දිනට සමුච්චිත වියදම රු.	භෞතික ප්‍රගතිය % (2022)
2019 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ ව්‍යාපෘති				
ඉංජිනේරු වැඩ ඒකකය ඉදි කිරීම	7,891,359.00	1,051,331.55	8,535,264.70	100%
බාහිර විදුලි පද්ධතිය ස්ථාපිත කිරීම	9,995,800.00	3,714,607.16	8,550,057.16	100%
එළු ගාල ඉදි කිරීම	5,454,840.51	910,673.60	3,817,906.20	100%
2022 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ ව්‍යාපෘති				
කුකුළු ගෘහයක් ඉදිකිරීම	7,938,036.75	2,163,996.00	2,163,996.00	50%
පටක රෝපණ විද්‍යාගාරයේ යෝජිත	10,790,080,90.	6,025,022.50	6,.025,022.50	75%
උප එකතුව	**23,341,999.51**	**13,865,630.81**	**29,092,246.56**	
මුළු එකතුව		**13,865,630.81**	**29,092,264.56**	

වගු අංක 29 : මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (ඉපැයූ ආදායම්)

ආදායම් මූලාශ්‍රය	2022 වර්ෂයේ ප්‍රතිපාදන රු.	2022 වර්ෂයේ එකතු කිරීම් රු.	(හිඟය)/අතිරික්තය රු.
IARS - සහතික පත්‍ර පාඨමාලා	36,646,000.00	27,829,632.50	(8,816,367.50)
පටක රෝපිත කෙසෙල් පැළ අලෙවිය	16,000,000.00	20,287,104.00	4,287,104.00
වෙනත් ආදායම්	1,135,000.00	6,601,653.13	5,466,653.13
මුළු එකතුව	**53,781,000.00**	**54,718,389.63**	**937,389.63**

වගු අංක 30 : මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය

විෂය	සූත්‍රය	එක් සිසුවකු සඳහා වන වියදම් (රු.) 2022	එක් සිසුවකු සඳහා වන වියදම් (රු.) 2021	එක් සිසුවකු සඳහා වන වියදම් (රු.) 2020	එක් සිසුවකු සඳහා වන වියදම් (රු.) 2019
එක් සිසුවකු වෙනුවෙන් දරන පුනරාවර්තන වියදම	පුනරාවර්ථන වියදම්/ සිසුන් ගණන	109,407.77	115,474.30	156,174.10	125,517.26
එක් සිසුවකු වෙනුවෙන් දරන ප්‍රාග්ධන වියදම	ප්‍රාග්ධන වියදම්/ සිසුන් ගණන	13,484.36	99,107.79	233,948.07	214,065.48
මුළු එකතුව		**122,892.13**	**214,582.09**	**390,122.17**	**339,582.74**

6.2 ලෝක බැංකුව අරමුදල් සපයන ව්‍යාපෘති

ව්‍යාපෘතියේ නම: ලෝක බැංකු අරමුදල් සහිත නවෝත්පාදන වාණිජකරණය වැඩිදියුණු කිරීමේ (ICE) ව්‍යාපෘතිය

ව්‍යාපෘති මාතෘකාව : ජෛව තාක්ෂණය තුළින් දේශීය විසිතුරු ශාකවල සෞන්දර්යාත්මක අගයන් වැඩිදියුණු කිරීම

ව්‍යාපෘතිය පිළිබඳ කෙටි විස්තරයක්:

වාණිජ වගාවන් සඳහා හඳුන්වාදීම සඳහා තෝරාගත් විසිතුරු ශාක විශේෂවලින් ආකර්ශනීය විකෘති වර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. එබැවින්, පර්යේෂණ කණ්ඩායම අදහස් කළේ සමහර තෝරාගත් නොසලකා හරින ලද විසිතුරු ශාක වලින් විකෘති අභිජනනය හරහා වැඩිදියුණු කළ සහ ආකර්ෂණීය වර්ග නිෂ්පාදනය කිරීමට ය. සලකා බලන ලද ශාක විශේෂ වූයේ; Jasminum officinale (සමන් පිච්ච), Catharanthus roseus, Allamanda cathartica, Murraya paniculata, Dendrobium maccarthiae, Calotrophis gigantea, Acalypha hispida, Helianthus annuss, Osbeckia octandra.

එපමණක් නොව, මෙම ව්‍යාපෘතියට අමතරව තවත් ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමු කරන ලදි.

1. නැවුම් කෙසෙල් ව්‍යාජ කඳන් වලින්, තවාන් පැල සිටුවීම සඳහා ජෛව පෝච්චි නිර්මානය කිරීම
2. ජෛව පෝච්චි නිර්මානයට අතින් ක්‍රියාකරන යන්ත්‍රයක් සැදීම
3. කෙසෙල් කොළ වලින් සුභුරු ආහාර දවටනයක් නිර්මාණය කිරීම
4. කෙසෙල් කොළ වලින් සාදන ලද ජෛව පිගන්
5. කෙසෙල් කොළ වලින් පිගන් සැදීම යන්ත්‍රයක නිපදවීම

ඉහත සඳහන් නව නිපැයුම් 05 යෝජිත ව්‍යාපෘති වැඩසටහන් සමග සෘජුව සම්බන්ධ නොවේ. ව්‍යාපෘතියේ ප්‍රතිඵලයක් ලෙස පැලෑටි ඇති කිරීම සඳහා පරිසර හිතකාමී භාජන නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කරන ලද

ව්‍යාජ කඳන් වලින් ඔබ්බට ගොස් කෙසෙල් ශාකයේ අපද්‍රව්‍ය භාවිතා කරමින් ඔවුන් අතිරේක නිෂ්පාදන ලෙස නිර්මාණය කළහ.

ව්‍යාපෘතියේ ඉලක්ක/අරමුණු:

ඉලක්ක : වැඩි සැලකිල්ලක් නොදක්වන දේශීය විසිතුරු ශාක විශේෂ මත පදනම්ව වැඩිදියුණු කරන ලද ආකර්ෂණීය විසිතුරු ශාක වර්ග ඇති කිරීම

අරමුණු :

1. තෝරා ගැනීම, දෙමුහුන් කිරීම සහ විකෘති අභිජනනය හරහා අවධානයට ලක් නොවූ නමුත් වැදගත් මල් විශේෂවල ආකර්ෂණීය ප්‍රවේශයන් වර්ධනය කිරීම
2. වාණිජ හවුල්කරුවන්ගේ සහයෝගීතාවයෙන් දියුණු ප්‍රවේශයන් ජනප්‍රිය කිරීම සහ වාණිජකරණය කිරීම.

ව්‍යාපෘතියේ කාලසීමාව: අවුරුදු 3 යි

ව්‍යාපෘති වටිනාකම (මිලියන) -වසර අනුව/වෙනත් ආකාරයකින්: මිලියන 40

<u>2022.12.31 වන දිනට ව්‍යාපෘතියේ ප්‍රගතිය</u>

වගු අංක 31 : ව්‍යාපෘතියේ KPI ලැයිස්තුව සහ 2022 දෙසැම්බර් 01 වන විට දැනටමත් ලබාගෙන ඇති ප්‍රගතිය

No	KPI	Total Promised	Total achieved
1	Number of working papers published	-	-
2	Number of communications (abstract) <u>accepted</u>	8	8
3	Number of papers <u>presented in</u> national conferences/symposia	4	1
4	Number of papers <u>presented in</u> international conferences/symposia	0	0
5	Number of research publications <u>published in</u> peer reviewed national journals	4	2
6	Number of research publications <u>published in</u> peer reviewed internationally indexed journals	3	3
7	Number of research publications as books or monographs <u>published by</u> reputed national publishers	2	1
8	Number of research publications as books or monographs <u>published by</u> reputed international publishers	-	-
9	Number of national patents <u>accepted</u>	4	2
10	Number of international patents <u>accepted</u>	-	-
11	Number of industrial designs <u>accepted</u>	-	-
12	Number of national copyrights applications <u>accepted</u> (e.g. software)	2	2
13	Number of international copyright applications <u>accepted</u> (e.g. software)	-	-
14	Number of national trademarks <u>accepted</u>	-	-
15	Number of international trademarks <u>accepted</u>	-	-
16	Number of Patent Cooperation Treaty (PCT) <u>accepted</u>	-	-
17	Number of license agreements <u>signed</u>	-	-
18	Number of assignments of IP <u>signed</u>	-	-
19	Number of products <u>in the market</u>	5	7

20	Number of industry-university linkages (MOU or agreements) for research commercialization	5	3
	Total	**16**	**14**

වගු අංක 32 : වෙළඳපොලේ ඇති නිෂ්පාදන ගණන

වෙළඳපොලේ ඇති නිෂ්පාදන ගණන	1. *Allamanda cathartica* and *Jasminum officinale* plants with a propagation technique and a specific potting media. (Charles Roses plant nursery and Canal corner flower gardens) sales- average 200 plants per month in each nursery 2. Bio pots in terms of "Bio coins" derived from Banana pseudo stems to raise nursery plants . (Walawa Agro-Products) sales average 7000 per month 3. *Acalypha hispida* mutants with multi coloured inflorescence and *Acalypha hispida* plants as dwarf potted indoor plants. average 200 plants per month (Priyankara Gardens Plant Nursery) 4. *Jasminum officinale* mutant as a dwarf bush (Mithuru Sri Plant Nursery) sales average 100 plants per month 5. *Catheranthus roseus* muted plant with flowers having twisted petal and bicolor. (Mithuru Sri Plant Nursery) sales average 100 plants per month 6. A best accession of *Murraya paniculata* identified through existing germplasm. (Floriaade Agro Products) sales average 100 plants per month 7. Other products- Banana food wrappers- (Mr Suneth Damsiri) sales 50,000 wrappers per week

වගු අංක 33 : පිළිගත් ජාතික පේටන්ට් බලපත්‍ර ගණන

පිළිගත් ජාතික පේටන්ට් බලපත්‍ර ගණන	Patents submitted on 2022 1. A technique to induce mutation in Acalypha hispida (Cat's tail) plants – 22164 2. Rapid propagation technique for ornamental plant Allamanda cathartica (Rukkathana) – 22165
පිළිගත් ජාතික ප්‍රකාශන හිමිකම් අයදුම්පත් ගණන (උදා. මෘදුකාංග)	1. A database on morphological variations and other information of *Murraya paniculata* germplasm in Sri Lanka. http://www.murraya.uciars.com/ 2. A database on morphological variations and other information of *Allamanda cathartica* germplasm in Sri Lanka. http://www.allamanda.uciars.com/

වගු අංක 34 : වාණිජකරණ පර්යේෂණ සඳහා කර්මාන්ත - විශ්වවිද්‍යාල සම්බන්ධතා (MOU හෝ ගිවිසුම්) ගණන

වාණිජකරණ පර්යේෂණ සඳහා කර්මාන්ත - විශ්වවිද්‍යාල සම්බන්ධතා (MOU හෝ ගිවිසුම්) ගණන	1. Improvement of aesthetic values of indigenous ornamental plants through bio-technology - with Canal Corner Flower Gardens 2. Improvement of aesthetic values of indigenous ornamental plants through bio-technology - with Charles Roses Plant Nursery 3. Bio plate making machine – Indurusiri Furniture /Walpola Gamage Chandrasena.

නව සොයාගැනීම් සහ නිර්දේශ

සොයාගැනීම්

1. **Mutants** in cats tail plant – Plants having Pink, White, blossoms having no blooms ,
2. **Mutants** in Vinka rosea – With streaked petals
3. **Calotropis gigantea with mottled** leaves.
4. Correct **maturity stage** of Rukkattana plantlets for subjecting radiation treatment to achieve successful mutants or LD 50 survival?
5. The appropriate **radiation dosage** for maximum % of survival of Rukattana plants after subjecting for irradiation treatments.
6. **Shoot tips** as the best planting material for propagation of Rukkatthana and Saman pichcha
7. **Development of Tissue culture protocols** for Vinka Rosea, Rukkathana, Etteriya and Saman pichcha
8. Best **potting media** of coir dust : sand 1:1 for propagation of Rukathana shoot tips.
9. **Hardwood cuttings** as the best planting material for propagation of Cat's tail plant.
10. **Morphological variations** in Rukattana, and Atteria based on phenotypic plasticity
11. **Better accessions producing attractive flowers** of Rukatthana and Atteria
12. **Bio pots** for raising nursery plants with fresh banana pseudo- stems.
13. Assembled **a manually operated machine** for fabricating bio pots with Banana pseudo stems.

***"Banana coins" a smart eco friendly container** with dried banana stems to raise nursery plants. **("**කෙසෙල් කාසි" තවාන් පැල ඇති කිරීම සඳහා වියළි කෙසෙල් කඳන් සහිත ස්මාර්ට් පරිසර හිතකාමී බහාලුමක්**)**

<u>Outcomes</u>

1. පහත සඳහන් දෑ පිහිටුවීම,
    a. Etteriya, Jasminum, Vinka rosea, Germplasm හි ජාන බැංකුවක්
    b. පටක රෝපණය සඳහා මව් ශාක ගබඩා කිරීම
    c. අංග සම්පූර්ණ ජෛව තාක්ෂණ රසායනාගාරයක්
    d. හරිතාගාර දෙකක්
2. Availability of a potted plant of cat's tail.
3. වාණිජ කරණය සඳහා අවබෝධතා ගිවිසුම
4. පේටන්ට් බලපත්‍ර සඳහා ඉදිරිපත් කිරීම
    a. Muted accession of Cat's tail plant
    b. Shoot tips and potting media in relation to propagation of Rukatthana
    c. Eco friendly containers as Bio coins for raising nursery plants.
5. මෙතෙක් ලේඛනගත තොරතුරු ලෙස නොතිබූ රුක්කත්න සහ ඇට්ටේරියා සඳහා ශාක විස්තර කිරීම් ගොඩ නැගීම
6. අනාගත පර්යේෂකයන් සඳහා ලේඛණගත තොරතුරු ලෙස ඇට්ටේරියා සහ රුක්කත්න පිළිබඳ තොරතුරු ලබාගැනීමේ හැකියාව
7. පාශ්චාත් උපාධි අධ්‍යයන අවස්ථා තුනක් සඳහා අවස්ථා උදා වීම
8. තෝරාගත් ශාක පිළිබඳ භූගෝලීය ව්‍යාප්තිය, රූප විද්‍යාත්මක විචලනය සහ කෘෂි විද්‍යාත්මක තොරතුරු ඇතුළු දත්ත සමුදා මෘදුකාංගයක් නිර්මාණය - ප්‍රකාශන හිමිකම් යෙදුම තුල ඇතුලත් කරනු ලැබේ.
9. Student startup – Bio coins production. මෙම ආරම්භය ශ්‍රී ලංකාවේ 2022 ගෝලීය ව්‍යවසායකත්ව සතිය සැමරීම සඳහා ICATA සමඟ එක්ව AHEAD මෙහෙයුම් විසින් සංවිධානය කරන ලද විශ්වවිද්‍යාල ශිෂ්‍ය ආරම්භක තරගයේ පළමු ත්‍යාගය දිනා ගත්තේය.

ව්‍යාපෘතියට දැනට බලපා ඇති අභියෝග සහ බලපෑම් සිදුකල හැකි සීමාවන් සහ ගැටළු

1. ඇති වූ අභියෝගාත්මක තත්ත්වයන්
    a. කොවිඩ් වසංගත තත්ත්වය (ආයතනවල ක්‍රියාකාරිත්වයට බාධා, ගමන් සීමා කිරීම්, රසායනාගාර ක්‍රියාකාරකම් සහ ක්ෂේත්‍ර කටයුතු අඩපණ වීම)
    b. රට තුල ඉන්ධන අර්බුද තත්ත්වයක් ඇති වීම
2. භාණ්ඩ මිළදී ගැනීමේ දුෂ්කරතා
3. නිතර විදුලිය විසන්දි වීම නිසා රසායනාගාර කටයුතු අඩාල වීම

7. තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය උපාය මාර්ගික කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේදී තිරසාර සංවර්ධන අරමුණු ඉටු වන ආකාරයට සකස් කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව 2021-2025 වර්ෂ සඳහා සකස් කල උපාය මාර්ගික කළමනාකරණ සැලැස්මේ සහ 2022 ක්‍රියාකාරී සැලැස්ම පහත සඳහන් අරමුණු ස්ථාපිත කර ඇත්තේ පරිසරයට අවම ඍණාත්මක බලපෑමක් ඇති වන ආකාරයට සහ පරිසරය ආරක්ෂා වන අයුරිනි.

අරමුණ 01 : අත්‍යවශ්‍ය ගුණාංගයන්ගෙන් හෙබි උපාධිදාරීන් බිහි කිරීම ඉහළ නැංවීම
අරමුණ 02 : වැඩි දියුණු කළ ව්‍යාපාරිකමය හවුල් සම්බන්ධතා සහ අන්තර්ජාතික සහයෝගීතාවය
අරමුණ 03 : වැඩි දියුණු කළ ශාස්ත්‍රීය පැතිකඩ (academic profile) සහ පර්යේෂණ හා ව්‍යාප්තියේ බලපෑම
අරමුණ 04 : වැඩි දියුණු කළ යටිතල පහසුකම් හා පහසුකම්
අරමුණ 05 : වැඩිදියුණු කළ පාලනය සහ මූල්‍ය කළමනාකරණය/විනය සහ මූල්‍ය යැපීම අඩු කිරීම

UCIARS යනු කෘෂිකර්මාන්තය පදනම් කරගත් ආයතනයක් වන අතර එහි කෘෂිකාර්මික පිළිවෙත් තුළ පරිසරය ආරක්ෂා කිරීම සහ ප්‍රජාව සඳහා කෘෂිකර්මාන්තය ආකෘතිකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

ඒ අනුව 2022 වර්ෂය තුල දී ආයතනය විසින් පරිසරය ආරක්ෂා කර ගැනීම සහ තිරසාර සංවර්ධනය වෙනුවෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග පහත පරිදි සාරාංශ කොට දැක්විය හැකිය.

1. සෑම කෙනෙකුටම ඉතා සාධාරණ සහ දැරිය හැකි පාඨමාලා ගාස්තුවක් යටතේ ජාතික විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමේ අවස්ථාව මහ හැරුණු ගොවි ප්‍රජාවට මෙන්ම උසස් පෙළ සමත් සිසුන් සඳහා ද කෘෂි තාක්ෂණ උපාධිය පිරිනැමීම.

2. ආයතනය ගාස්තු අයකිරීමේ පාඨමාලා පවත්වන බැවින්, ආයතනය විසින් UCIARS නේවාසිකාගාරයේ සිසුන් සඳහා ඉතා අඩු දෛනික ගාස්තු/මාසික ගාස්තුවකට නවාතැන් ලබා දෙන අතර එමඟින් සියලුම සිසුන්ට පිරිවැය දැරිය හැකි වේ.

3. උපාධිය හැදෑරීමට වයස් බාධක නොමැති බැවින්, එය ජීවිත කාලය පුරාම ඉගෙනීමේ සංකල්පය සහතික කරයි.

4. සූර්ය බලශක්ති භාවිතය (විදුලිය ඉතිරි කර ගැනීම සඳහා අලි වැටෙහි සහ එළිමහන් ආලෝක පද්ධතියෙහි සූර්ය පැනල සවි කර ඇත).

5. කාර්යාල කටයුතුවලදී කඩදාසි භාවිතය අඩු කිරීම (ඊමේල් වැඩිපුර භාවිතා කිරීමෙන්) සහ ඒක පාර්ශවීය කඩදාසි (one side papers) නැවත භාවිතා කිරීම සහ බොහෝ රැස්වීම් අන්තර්ජාලය හරහා පැවැත්වීම.

6. ආයතනයේ සුභසාධක සමිති ආපන ශාලාව හරහා සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට පෝෂණ ආහාර සාධාරණ මිලකට ලබා දීම.

7. ආයතනයේ LMS පරිපාලකයින් විසින් LMS හි පවතින ලිපිගොනු ප්‍රතිව්‍යුහගත කර කොළඹ විශ්ව විද්‍යාලයේ පද්ධතිය තුළ ඇති ගොනු තදබදයට පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි යාවත්කාලීන කරන ලදී.

8. පුද්ගලයන් සහ ආයතනය පිළිබඳ අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට ඉක්මන් ප්‍රවේශයක් ලබා දීමෙන් සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට සහාය වීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) හඳුන්වා දෙන ලදී. මෙම හැඳින්වීම වර්තමානයේ අතිශය සීමිත කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාවක් විසින් උර දී ඇති කඩිනම් සහ නිවැරදි පරිපාලන කටයුතු සිදු කිරීම සඳහා අතිමහත් සහයෝගයකි.

9. UCIARS ගොවිපල බහුකාර්ය නිෂ්පාදන ඒකකයක් වන අතර එය උපාධි අපේක්ෂකයින් සඳහා ප්‍රායෝගික අවස්ථා ලබා දෙයි, විද්වතුන් සඳහා පර්යේෂණ අවස්ථා ලබා දෙයි, ගොවීන් සහ ව්‍යවසායකයින් සඳහා නවීන තාක්ෂණ ප්‍රදර්ශන ඒකකයක් ලෙස ක්‍රියා කරන අතර එය ආයතනයට ආදායම් උපයා දෙයි.

10. ආයතනය සහ ගොවි ප්‍රජාව අතර ද්වි-මාර්ග සන්නිවේදන යාන්ත්‍රණයක් ඇති කිරීමේ අරමුණින් UCIARS වෙත අනුබද්ධ තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලදී. කෘෂිකාර්මික තොරතුරු ව්‍යාප්ත කිරීම, ආයතනය මගින් ජනනය කරන ලද තාක්ෂණික සෘජු පරිවර්තනය, ගොවීන් මුහුණ දෙන තාක්ෂණික ගැටලු විසඳීම සහ කෘෂි කර්මාන්තය ආශ්‍රිත නව අත්දැකීම් ගොවීන්, ව්‍යවසායකයින්, පෞද්ගලික අංශය සහ සිසුන් සමඟ බෙදා ගැනීම මෙම විශේෂිත ඒකකයේ අරමුණ විය.

11. සිසුන්ගේ සහ ආයතනයේ කාර්යය මණ්ඩලයේ පිරිසිදු පානීය ජල අවශ්‍යතාවය සැපයීම වෙනුවෙන් ජල පිරිපහදු (RO) පද්ධතියක් ස්ථාපනය කරන ලදි.

පරිසරය සුරැකීම සහ තිරසාර සංවර්ධනය සඳහා ඉදිරියේදී ගත යුතු පියවර පහත පරිදි සාරාංශ කළ හැක.

1. ආයතනයේ අක්කර 40ක ගොවිපළේ පූර්ණ සංවර්ධනයෙන් පසු කාබනික ගොවිතැන සහ බෝග වගාව වාණිජ වශයෙන් සංවර්ධනය කිරීම තුළින් ප්‍රජාවට කාබනික ආහාර අලෙවි කිරීම තුළින් සෞඛ්‍ය හා පෝෂණය වැඩිදියුණු කිරීම.

2. කෘෂි තාක්ෂණික පර්යේෂණ හරහා කෘෂි ව්‍යවසායකත්වය සඳහා නව තාක්ෂණයන් හඳුන්වා දීම.

3. සමස්ත සංවිධානයටම සූර්ය බලශක්තිය හඳුන්වා දීමෙන් බලශක්තිය ඉතිරි කිරීමට සැලසුම් කරයි. එහි පළමු පියවර ලෙස නව පටක රෝපණ විද්‍යාගාරය සඳහා Solar PV පද්ධතියක් පිහිටුවීමට සැලසුම් කර ඇත.

4. සමස්ත ආයතනය සඳහා ජල පිරිපහදු තාක්ෂණය හඳුන්වා දීමට සැලසුම් කර ඇත. මෙමගින් පානීය ජලය පිටතින් ලබාගැනීමේ පිරිවැය අවම වීමෙන් ජලය සංරක්ෂණය වේ.

5. භෞමික පරිසර පද්ධති ආරක්ෂා කළ හැකි පාංශු සංරක්ෂණ වගාවන් හඳුන්වාදීම වැඩි කිරීම

6. ආයතන පරිශ්‍රය තුළ (ගොවිබිම් ඇතුළුව) සියලුම අත්‍යවශ්‍ය ප්‍රදේශවලට අන්තර්ජාල ප්‍රවේශය ලබා දීම සහ ආයතනයේ සිසුන්ට සහ සේවකයින්ට නවීන තාක්ෂණය සඳහා ප්‍රවේශය ලබා දීම.

7. ආයතනයේ පරිපාලන හා උත්සව කටයුතු වලදී පරිසරය දූෂණය වීම හැකිතාක් වළක්වා ගැනීම.

8.හරිත පරිසරයක් නිර්මාණය කිරීම සඳහා හැකිතාක් ආයතනය තුළ කෘෂි-ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල දී ගස් සිටුවීමට සිසුන් යොමු කිරීම.

9. බලශක්ති හා ජල සම්පත් ආර්ථික වශයෙන් භාවිතා කිරීම සහ ඌරන් පෝෂණය කිරීම සඳහා අපතේ යන සියලුම ආහාර භාවිතා කිරීම.

10. කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට ප්‍රමාණවත් පරිදි නවාතැන් පහසුකම් සැපයීම.

11. මාසික විදුලි බිල ඉතිරි කර ගැනීම සඳහා බලශක්ති බවට පරිවර්තනය කිරීම සඳහා ජීව වායු ඒකකයක් හඳුන්වා දීම

අවසාන ගිණුම

2022

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

2023/02/27.

නියෝජ්‍ය විගණකාධිපති,

විගණකාධිපති දෙපාර්තමේන්තුව,

නො: 306/72,

පොල්දුව පාර,

බත්තරමුල්ල.

මහත්මයාණනි,

මූල්‍ය ප්‍රකාශන - 2022

පහත සඳහන් ප්‍රකාශයන් සමඟ 2022 වසර සඳහා කොළඹ විශ්ව විද්‍යාලීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ අවසාන ගිණුම් මේ සමඟ ඉදිරිපත් කරමි.

01. 2022.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශ
02. 2022.12.31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා නිෂ්පාද හා වෙළෙඳාම පිළිබඳ ප්‍රකාශය
03. 2022.12.31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධ පිළිබඳ ප්‍රකාශය
04. 2022.12.31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා ස්කන්ධයෙහි වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශ
05. 2022.12.31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශ
06. වගකීම පිළිබඳ ප්‍රකාශ
07. මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

ස්තූතියි

මහාචාර්ය එම්. ඒ. ඒ.ඩී. අම්පිටියාවත්ත
අධ්‍යක්ෂ
කොළඹ විශ්ව විද්‍යාලීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

කොළඹ විශ්ව විද්‍යාලය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

වගකීම් පිළිබඳ ප්‍රකාශය

පිටු අංක 01 සිට 05 දක්වා පිටුවල ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 06 සිට 20 දක්වා පිටුවල සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්ගේ අත්‍යවශ්‍ය කොටසක් සාදයි. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලදුව අතර ඔවුන් අත්සන් කොට ඇත.

මහාචාර්ය එම්. ඒ. ඒ.ඩී. අම්පිටියාවත්ත
අධ්‍යක්ෂ
කොළඹ විශ්ව විද්‍යාලය
කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

කළමනාකාරිත්ව මණ්ඩලයේ සාමාජිකයින්

නම		අත්සන
එච්. පී. සුමනසේකර මහතා	දිස්ත්‍රික් ලේඛම්,දිස්ත්‍රික් ලේඛම් කාර්යාලය, හම්බන්තොට	
ආචාර්ය එන්. විදානපතිරණ	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/අංශ ප්‍රධානී කොළඹ විශ්ව විද්‍යාලය,කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය	

පටුන

පිටුව

01.හැඳින්වීම 41-42

02. මූල්‍ය ප්‍රකාශන - මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ 43

03. මූල්‍ය ප්‍රකාශන - විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය,නිෂ්පාදන වියදම් ගණනය කිරීම 44-47

04. ස්කන්ධයෙහි වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශ 48

05. මූල්‍ය ප්‍රකාශන - මුදල් ප්‍රවාහ ප්‍රකාශ 49-50

06. මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන් 51-67

හැඳින්වීම

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය ස්ථාපිත කිරීම තුළින් තොරතුරු තාක්ෂණය සහිත කෘෂි තාක්ෂණය පිළිබඳ නවීන දැනුම ඇති කිරීම තුළින් කීර්තිමත් රැකියාවක් ලෙස ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය නගා සිටුවීම සඳහා ශ්‍රී ලංකා රජය පැත්තෙන් සහතික කරන යුගයක් සඳහා පෙරමුණ ගෙන ඇත.

කොළඹ විශ්ව විද්‍යාලීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය (මෙහි මින්මතු ආයතනය ලෙස හඳුන්වන) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 24 අ වගන්තිය සහ 18 වගන්තිය යටතේ සහ 2008 අංක 02 දරන කොළඹ විශ්ව විද්‍යාලීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන පනත යටතේ වයස, අවකාශය, කාලය සහ අධ්‍යාපනික පසුබිම වැනි සීමාවන් හරහා කෘෂිකාර්මික/ගොවි ප්‍රජාවට උසස් අධ්‍යාපනය සඳහා අවස්ථාවන් ලබාදීම සඳහා ඉගෙනුම පිළිබඳ මිශ්‍රිත දුරස්ථ රටාව සහිත ආයතනයක් ලෙස පිහිටුවන ලදී. 24 අ වගන්තිය යටතේ නියෝගය 2008 අගෝස්තු මස 23 දින සිට ක්‍රියාත්මක විය.

විශ්ව විද්‍යාල කොමිෂන් සභාව විසින් මෙම ආයතනය 2000 දී කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත හම්බන්තොට වැලිගත්ත මාගම්පුර කෘෂි තාක්ෂණික හා ප්‍රජා සේවා මධ්‍යස්ථානයේ ස්ථාපිත කරන ලදි. ආයතනය කොළඹ සිට කි.මී. 250 ක් ඈතින් කොළඹ කතරගම මහා මාර්ගයට ඉතා සමීපව පිහිටා ඇත. විශ්ව විද්‍යාල පර්යේෂකයින් විසින් අවසාන පරිශීලකයින් වෙත සෘජුවම තාක්ෂණය/දැනුම සහ දැනුම් හැකියාව හුවමාරු කිරීම සහ කලාපය තුළ කෘෂිකර්මය සහ කෘෂි කර්මාන්තයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම පිණිස ප්‍රජාව සමඟ සමීප සහයෝගී සම්බන්ධතා ගොඩ නඟන ලද ආයතනයකි. වසර කිහිපය අනුව බලන කළ මධ්‍යස්ථානයේ ඉතිහාසය 1998 දක්වා ඈතට දිවයයි.

කෘෂිකර්මය හා කෘෂි තාක්ෂණය, කෘෂි තාක්ෂණය හා ග්‍රාමීය විද්‍යා පුහුණුව පිළිබඳ උසස් අධ්‍යාපනය තුළ දැනට යෙදී සිටින පුද්ගලයින් වෙත දැනුම ලබාදීම, ප්‍රවර්ධනය කිරීමට සහ සංවර්ධනය කිරීමට මෙම ආයතනයට බලය ඇත.උසස් අධ්‍යාපනයේ බිහිදොර වෙත ඇතුළුවීමට කිසි දිනක සිහින නොදුටු ගොවි ප්‍රජාවගේ අභියසට මිශ්‍රිත ඉගෙනුම් ආකෘතියක් තුළින් අධ්‍යාපනය ලබාදෙමින් වෙනස්වන පුද්ගල සහ සමාජය අවශ්‍යතා සහ පහසුකම් සපයනු ඇත. මොවුන්ට උසස් අධ්‍යාපනය ලබාගැනීමට අපේක්ෂාවන් සහ හැකියාව තිබුනද, ඔවුන්ගේ පුද්ගලික, පවුලේ හෝ ආර්ථික පසුබිම් හේතු කොට ගෙන අවස්ථාවන් භාවිතා නොකරයි. ඇතුළත්වීමේ අවශ්‍යතා සහ පාඨමාලා තෝරා ගැනීමේ නම්‍යතාවය සහිත බැවින්, ග්‍රාමීය දිළිඳු අංශවල ආධුනිකයින් වෙත පහසු අවස්ථාවක, ස්ථානයකදී අධ්‍යාපනය ලබාගැනීම සහ ඔවුන්ගේ අධ්‍යාපනික, වෘත්තීමය සහ සමාජීය අපේක්ෂාවන් අවබෝධ කර ගැනීම සඳහා නවීන තොරතුරු සන්නිවේදනය භාවිතා කරමින් ගුණාත්මක ඉහළ අධ්‍යාපනය ලබාගැනීමට මේ මගින් හැකි වන බව ආයතනය පෙන්වා දේ.

සමාජය සමඟ කටයුතු කිරීම සඳහා ආයතනයේ කැමැත්ත සහ බැඳීම ආයතනික පර්මාර්ථ, උපායමාර්ගික සැලසුම් සහ ඉගෙනුම් සහ ඉගැන්වීම ක්‍රියාවලි පිළිබඳ පැහැදිලි ප්‍රකාශයන්ගෙන් තහවුරු කෙරේ.

සංවිධානය සහ කළමනාකරණය

අධ්‍යාපන ක්‍රමය ප්‍රභූ පිරිසෙන් සාමාන්‍ය ජනයා වෙතටත්, ඉගෙනීම මත අවධාරණයෙන් ඉගෙන ගැනීම කෙරෙහි අවධාන යොමු කිරීම වෙතටත් මාරු වෙමින් පවත්නා බැවින්, සිසුන් වඩාත් වැදගත් ක්‍රියාකාරුවන් - එනම් ප්‍රාථමික සේවාලාභීන්, පාරිභෝගිකයින් සහ ආධුනිකයින් බවට පත්වී ඇත. එවැනි නව කාර්යභාරයන් සහ ඔවුන් නියෝජනය කරන නව අභියෝග මෙහෙයවීම සඳහා සුදුසු සංවිධානාත්මක සහ කළමනාකාරිත්ව යාන්ත්‍රණ ස්ථාපිත කිරීම් මෙම ඉගැන්වීම සඳහා අවශ්‍ය කෙරේ. සංවිධාන සටහන මගින් ආයතනයේ සංවිධාන ව්‍යුහය පෙන්නුම් කරයි.

පරිපාලන සංවිධානය

ආයතනයේ ප්‍රධානියා අධ්‍යක්ෂවරයෙක් වන අතර ඔහු ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන අධ්‍යාපන නිලධාරී මෙන්ම ගිණුම් නිලධාරියාද වේ. එමෙන්ම අධ්‍යක්ෂ ආයතනයේ කළමනාකාරිත්ව මණ්ඩලයේ, අධ්‍යාපනික පාලක මණ්ඩලයේ සහ සියලුම අධ්‍යයන මණ්ඩලවල නිල බලයෙන් සාමාජිකයෙක් වන අතර අධ්‍යක්ෂක මණ්ඩලයේ සියලුම රැස්වීම්වලදී මූලිකත්වය දරයි. අධ්‍යක්ෂක ශාස්ත්‍රීය මණ්ඩලයේ සාමාජිකයෙක් ද වන අතර ආයතනයේ අධ්‍යාපනික කාර්යසාධනය පිළිබඳ ශාස්ත්‍රීය මණ්ඩලවෙත උපදෙස් ලබා දේ. කළමනාකාරිත්ව මණ්ඩලය ආයතනයේ අධ්‍යාපනික සහ විධායක මණ්ඩලය වේ. ආයතනයට විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය ස්වාධීනත්වය ඇති අතර කළමනාකාරිත්ව මණ්ඩලය මුදල් සඳහා වගකීමට බැඳී සිටී. අධ්‍යක්ෂ යටතේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක් සිටී. අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආයතනයේ නිලධාරීන් වේ.

කළමනාකාරිත්ව මණ්ඩලය වෙනුවෙන් පනතේ විධිවිධාන, ආඥාපනත හෝ වෙනත් යම් ලේඛණ විධිමත්ව අනුගමනය කෙරෙන බව සහතික කිරීම අධ්‍යක්ෂගේ රාජකාරියකි. එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂගේ රාජකාරියක් වන අතර ආයතනය තුළ විනය පවත්වා ගැනීම සඳහා ඔහු වගකීමට බැඳී සිටී.

අධ්‍යාපනික සංවිධානය

ආයතනයට උපදෙස් දීම, ආයතනයේ පුහුණුව, පර්යේෂණ සහ විභාග පාලනය කිරීමේ සහ පොදු උපදෙස් ලබාදීමේ බලය අධ්‍යක්ෂ මූලිකත්වය දරන අධ්‍යාපනික පාලක මණ්ඩලය සතුය.

පර්යේෂණ උසස් උපාධි, අභ්‍යන්තර අධ්‍යාපනික වැඩසටහන්, බාහිර සහ ව්‍යාප්ති වැඩසටහන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ විසින් මූලිකත්වය ගන්නා අධ්‍යයන මණ්ඩල තුනක් ඇත. අධ්‍යයන මණ්ඩලවලට ආයතනයට උපදෙස් දීම, ආයතනයේ පුහුණුව, පර්යේෂණ සහ විභාග පාලනය කිරීමේ සහ පොදු උපදෙස් ලබාදීමේ බලය ඇත.

ශික්ෂණය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු තුනක් ඇත. ඒවා නම් (1) කෘෂි-තාක්ෂණය, (2) ආහාර තාක්ෂණය සහ (3) ව්‍යවසායකත්ව, කෘෂි-ව්‍යාපාර සහ ග්‍රාමීය විද්‍යාව වේ. සෑම අධ්‍යයන දෙපාර්තමේන්තුවක්ම ප්‍රධානියෙක් විසින් මෙහෙයවන ලැබේ.

මධ්‍යස්ථාන තුනක් එනම් කෘෂි ව්‍යාපාර සහ කර්මාන්ත කුටිය, විද්‍යා උයන, ව්‍යාප්ති වැඩසටහන් සම්බන්ධීකාරක විසින් මෙහෙයවයි.

ආයතනය සහ සහයෝගී හවුල්කාර ආයතන සහ විශ්ව විද්‍යාලවල පීඨ සහ සහය කාර්ය මණ්ඩලය ඉගෙනුම් විෂය සංවර්ධනය කිරීම, අධ්‍යයන පාඨමාලා/වැඩසටහන් ලබාදීම සහ සහයෝගය දීම මගින් සහය ලබා දේ.

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

කොළඹ විශ්ව විද්‍යාලය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට		2022	2021
		රු	රු
වත්කම්			
ජංගම වත්කම්			
බැංකු ශේෂය	සටහන -1	3,436,393	1,973,732
තොගය	සටහන - 2	11,670,374	7,247,711
ආයෝජන මත ලැබිය යුතු පොළි	සටහන - 3	775,820	281,494
ලැබිය යුතු ණය ගිණුම	සටහන -4	3,039,316	1,987,271
පෙර ගෙවීම් ගිණුම	සටහන -5	417,781	159,822
අත්තිකාරම්		-	-
සජීවී වත්කම්		456,600	265,600
වෙනත් ජංගම වත්කම්	සටහන - 6	8,008,983	1,724,229
කෙටි කාලින ආයෝජන	සටහන - 7	17,699,800	20,999,950
		45,505,068	**34,639,808**
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	සටහන - 8	506,010,480	522,546,165
සජීවී වත්කම්		4,957,650	4,421,000
විලම්භීත වියදම්	සටහන - 9	830,131	1,356,784
ට්‍රාන්ස්ෆෝමරය සඳහා තැන්පතු		500,000	500,000
කෙරීගෙන වැඩ		2,261,496	-
ආයෝජන		-	300,000
		514,559,757	**529,123,949**
මුළු වත්කම්		**560,064,825**	**563,763,757**
වගකීම්			
ජංගම වගකීම්			
උපචිත වියදම්	සටහන - 10	13,428,170	14,872,354
වෙනත් ජංගම වගකීම්	සටහන - 11	10,536,731	69,921
		23,964,901	14,942,276
ජංගම නොවන වගකීම්			
ජංගම නොවන වගකීම්	සටහන - 12	15,309,517	18,868,082
		15,309,517	18,868,082
මුළු වගකීම්		39,274,418	33,810,358
ශුද්ධ වත්කම්/ ස්කන්ධය		**520,790,407**	529,953,399
සමුච්චිත අරමුදල්			
වියදම් කළ ප්‍රාග්ධන දීමනා		225,627,200	234,705,740
වියදම් නොකළ ප්‍රාග්ධන දීමනා		-	-
වියදම් කළ වෙනත් ප්‍රාග්ධන දීමනා		94,229,424	94,259,424
වියදම් නොකළ වෙනක් ප්‍රාග්ධන දීමනා		4,148,980	685,468
සමුච්චිත සංචිත		31,171,572	23,568,389
වෙනත් සංචිත		7,942,779	7,942,779
වියදම් කළ විශේෂ දීමනා		157,670,452	168,791,599
මුළු ස්කන්ධය		**520,790,407**	**529,953,399**

සහතික කළේ
ඒ.ඩී.පී.ද.සොයිසා
සහකාර මූල්‍යාධිකාරී
(කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය)

මහාචාර්ය එම්.ඒ.ඒ.ඩී.අම්පිටියාවත්ත
අධ්‍යක්ෂ (කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය)
කළමනාකාරීත්වය මණ්ඩලය වෙනුවෙන්

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

කොළඹ විශ්ව විද්‍යාලය

මූල්‍ය කාර්යසාධනය සහ වෙනත් විස්තීරණ ආදායම් පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා		2022	2021
		රු.	රු.
පැල විකුණුම් ආදායම		10,158,258	5,892,590
විකුණුම් පිරිවැය	සටහන 13	(21,642,848)	(16,925,243)
දළ ලාභය		**(11,484,590)**	**(11,032,653)**
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන		101,421,000	78,170,000
උපදවන ලද ආදායම්	සටහන - 14	42,739,822	46,987,798
පොළී ආදායම	සටහන - 15	1,820,310	388,461
ක්‍රමක්ෂය		33,957,285	37,333,360
සජීවී වත්කම් නැවත තක්සේරු කිරීම් ලාභය		1,788,279	2,885,800
		170,242,106	**154,003,866**
වියදම්			
පුද්ගලික පඩිනඩි	සටහන -16	(69,361,300)	(63,666,739)
ගමන් වියදම්	සටහන -17	(56,895)	(86,466)
සැපයීම්	සටහන -18	(6,777,744)	(3,818,709)
නඩත්තු වියදම්	සටහන -19	(1,287,088)	(1,353,143)
ගිවිසුම්ගත සේවාවන්	සටහන -20	(26,663,640)	(18,677,395)
අනෙකුත් පුනරාවර්තන වියදම්	සටහන -21	(24,028,431)	(8,911,868)
පාරිතෝෂික		(3,279,285)	(2,624,621)
විලම්බිත වියදම් කපාහැරීම		(526,653)	(526,653)
ක්ෂයවීම්		(35,458,571)	(38,908,920)
ක්‍රමක්ෂය - මෘදුකාංග		(139,000)	(84,500)
		(167,578,607)	**(138,534,472)**
අතිරික්තය/ඌනතාවය		**2,663,499**	**15,469,394**
වෙනත් විස්තීරණ ආදායම්			
තත්‍ය තක්සේරුව මත ලාභ/අලාභ		**6,028,845**	**1,915,792**
දේපළ පිරියත හා උපකරණ තක්සේරු කිරීම්		**-**	**3,364,054**
මුළු විස්තීරණ ආදායම්		**8,692,344**	**20,749,240**

සහතික කළේ
ඒ.ඩී.ජී.ද.සොයිසා
සහකාර මුල්‍යාධිකාරී
(කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය
විද්‍යා ආයතනය)

මහාචාර්ය එම්.ඒ.ඒ.ඩී.අම්පිටියාවත්ත
අධ්‍යක්ෂ (කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය
විද්‍යා ආයතනය)
කළමනාකාරීත්වය මණ්ඩලය
වෙනුවෙන්

පැළ නිෂ්පාදන ඒකකයේ නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම 2022

	රු.			රු.			රු.			රු.
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	මුලු මුදල			කෙසෙල්			කෝමාරිකා			කහ
	2022	**2021**		**2022**	**2021**		**2022**	**2021**		**2022**
අමුද්‍රව්‍යවල පිරිවැය	1,758,014	1,447,106		1,647,497	1,387,090		-	60,016		110,517
වෙනත් සෘජු පිරිවැය/සෘජු කම්කරු	17,543,686	11,916,052		16,440,804	11,728,552		-	187,500		1,102,883
ප්‍රාථමික පිරිවැය	19,301,701	13,363,157		18,088,300	13,115,642		-	247,516		1,213,400
අවසන් කෙරිගෙන වැඩ	170,949	103,016	21,722	170,949	68,970		-	34,045		
අවසන් කෙරිගෙන වැඩ	(130,405)	(170,949)	3,869	(124,834)	(170,949)		-	-	147	(5,571)
මුළු ප්‍රාථමික පිරිවැය	19,342,245	13,295,224		18,134,416	13,013,663		-	281,561		1,207,829
වක්‍ර / පොදු කාර්ය පිරිවැය	3,200,371	3,498,601		2,999,180	3,260,282		-	238,319		201,191

මුළු නිෂ්පාදන පිරිවැය	22,542,616	16,793,824		21,133,595	16,273,944		-	519.880		1,409,020
විකුණුම්	10,158,258	5,892,590		10,063,550	5,867,240		550	25.350		94,158
විකුණුම් පිරිවැය										
2022.01.01 දිනට පැළ	1,429,135	1,560,553	15,729	1,262,260	254,902	6,675	166,875	1.305.651	-	-
එකතු කරන්න: නිෂ්පාදන පිරිවැය	22,542,616	16,793,824	149,906	21,133,595	16,273,944		-	519.880	10,056	1,409,020
	23,971,751	18,354,378		22,395,855	16,528,846		-	1.825.531		1,409,020
පැල 31.12.2022 එකක පිරිවැය	(1,579,450)	(1,429,135)	10,572	(1,579,449.68)	(1,262,260)		-	(166,875)	-	-
ගොවිපලට නිකුත් කිරීම්	749,452.37						166,284.96	-		583,167
මුළු නිෂ්පාදන පිරිවැය	21,642,849	16,925,243		20,816,406	15,266,586		590	1,658,656		825,853
අතිරික්තය/ඌණතාවය	(11,484,591)	(11,032,653)		(10,752,856)	(9,399,346)		(40)	(1,633,306)		(731,695)

යෝගට් නිෂ්පාදන ඒකකයේ මාස **04** ක් සඳහා නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම-**2022**		
	රු.	
2022 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන්	මුලු මුදල
සෘජු ද්‍රව්‍ය පිරිවැය		
මිලදි ගැනුම්		
සීනි	12,141	
කිරි	35,130	
යෝගට් කප්	40,831	
ඉවතලන පිරිවැය - යෝගට් කප්	(5,738)	
අවසන් තොගය		
සීනි	(5,603)	
යෝගට් කප්	(4,771)	71,990
සෘජු කම්කරු		16,342
ප්‍රාථමික පිරිවැය		88,332
වක්‍ර ද්‍රව්‍ය පිරිවැය (තාක්ෂණික යෝගට්, ජෙලි සහ අනෙකුත් ද්‍රව්‍ය)		30,908
මුළු ප්‍රාථමික පිරිවැය		119,240
වෙනත් පිරිවැය (පොදු කාර්ය පිරිවැය ඇතුලත්ව)		
කුඩා අයිතම	8,305	
පාරිභෝජන ද්‍රව්‍ය	1,155	
ස්ටිකර්	5,930	
ඉන්ධන (ගෑස්)	6,780	
විදුලිය -0.1%	5,923	
වෙනත් පිරිවැය	1,300	29,393
මුළු නිෂ්පාදන පිරිවැය		148,633
විකුණුම්		138,970
නිෂ්පාදන පිරිවැය		148,633
ඉවතලන පිරිවැය - යෝගට් කප්		(3,634)
31/12/2022 අවසන් තොගය - 11		(660)
විකුණුම් පිරිවැය		144,339
දළ ලාභය		(5,369)
විකුණුම් පිරිවැය		5,510
අතිරික්තය/ඌණතාවය		(10,879)

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

	වියදම් කල ප්‍රාග්ධන ප්‍රදාන	අනෙකුත් වියදම් කල ප්‍රදාන	අනෙකුත් වියදම් නොකල ප්‍රදාන	එකතු වූ අතිරික්තය	විශේෂ ප්‍රදාන	වෙනත් සංචිත	එකතුව
2022.01.01 දිනටශේෂය	234,705,740	95,145,445	685,468	22,542,960	168,791,599	9,858,571	531,729,782
සත්‍ය තක්සේරුව සංචිත සමුච්චිත අතිරික්තයට මාරු කිරීම				1,915,792		(1,915,792)	
රන් පදක්කම් පරිත්‍යාග අරමුදල		(30,000)	30,000				
ආරම්භක ගැලපුම් සටහන	1,047,354	(886,021)	(49,354)	(1,979,523.69)			(1,867,545)
නැවත එකතු කිරීම්	**235,753,095**	**94,229,424**	**666,113**	**22,479,228**	**168,791,599**	**7,942,779**	**529,862,238**
2022 වසර සඳහා ස්කන්ධයෙහි වෙනස්වීම්							
කාලසීමාව සඳහා හිඟය/අතිරික්තය							-
වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම්			3,702,111	2,663,499			18,865,609
වර්ෂයේ ප්‍රාග්ධන වියදම්	12,500,000						
පාරිතෝෂිතවෙන් කිරීම් ලාභ/අලාභ				6,028,845			6,028,845
ක්‍රමක්ෂය	(22,625,895)		(210,243)		(11,121,146)		(33,957,285)
පුනරාවර්තනත වියදම් මගින් ගලාඑම්			(9,000)				
සජීවී කොටස් ප්‍රත්‍යාගණන							
දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය							
2022.12.31 දිනට ඉදිරියට ගෙන ගිය ශේෂය	**225,627,200**	**94,229,424**	**4,148,980**	**31,171,572**	**157,670,452**	**7,942,779**	**520,799,407**

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය
කොළඹ විශ්ව විද්‍යාලය
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2022	**2021**
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	**රු.**	**රු.**
වසරේ අතිරික්තය	2,663,499	15,469,394
අරමුදල් වෙනස්වීමට සම්බන්ධ නොවූ අයිතම සඳහා ගැලපීම්		
පෙර වසරේ ගැලපීම්		
ක්ෂයවීම්	36,006,293	39,717,793
විලම්බිත වියදම් කපාහැරී මුදල	526,653	526,653
ක්‍රමක්ෂය	(33,957,285)	(37,333,360)
පොළී ආදායම	(1,820,310)	(388,461)
ඉවත් කිරීමේ අලාභ	107,571	
පාරිතෝෂික වෙන්කිරීම්	3,279,285	2,624,621
සජීව වත්කම් තක්සේරුව	(1,788,279)	(2,885,800)
පරිත්‍යාග	55,800	-
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් කටයුතු ශුද්ධ මුදල් ප්‍රවාහය	5,073,227	17,730,839
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම		
තොගය තුළ වැඩිවීම්/අඩුවීම්	(4,422,663)	(2,104,732)
පොළී ලැබීම් වැඩිවීම්/අඩුවීම්		13,960
ලැබිය යුතු ණය වැඩිවීම්/අඩුවීම්	(1,052,046)	(524,190)
ඉදිරියට කල ගෙවීම් වැඩිවීම්/අඩුවීම්	(257,960)	484,030
අත්තිකාරම් වැඩිවීම්/අඩුවීම්		26,000
අනෙකුත් වත්කම් වැඩිවීම්/අඩුවීම්	(6,284,754)	-
වෙනත් සජීව් වත්කම් වැඩිවීම්/අඩුවීම්	(191,000)	-
උපචිත ගෙවීම් වැඩිවීම්/අඩුවීම්	(1,444,185)	3,399,990
අනෙකුත් වගකීම් වැඩිවීම්/අඩුවීම්	10,466,810	41,878
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමෙන් පසු මෙහෙයුම් කටයුතු ශුද්ධ මුදල් ප්‍රවාහය	1,887,430	19,067,775
මෙහෙයුම් කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහය	**1,887,430**	**19,067,775**
ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ		
ස්ථාවර වත්කම් අත්කර ගැනීම වැඩිවීම්/අඩුවීම්	(14,431,657)	(36,336,989)
සජීව් වත්කම් වැඩිවීම්/අඩුවීම්	(382,782)	(1,364,500)
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල්	5,230	
විලම්භිත වියදම් වැඩිවීම්/අඩුවීම්	-	
කෙරිගෙන වැඩ වැඩිවීම්/අඩුවීම්	(2,261,496)	
ආයෝජන වැඩිවීම්/අඩුවීම්	3,600,150	(20,999,950)
වසර සඳහා පොළී ආදායම	1,335,667	175,367
ආයෝජන කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහය	(12,134,888)	(58,526,071)
මූල්‍ය කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ		

පාරිතෝෂික ගෙවීම්	(809,004.90))	
ණය ගැනීම් වැඩිවීම්	-	
ණය ගැනීම් අඩුවීම්	-	(116,666)
ප්‍රාග්ධන වියදම සඳහා රජයේ ප්‍රදාන සහ අනෙකුත් අරමුදල්	12,519,125	25,000,000
මූල්‍ය කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහය	11,710,120	24,883,334
මුදල්වලට සමාන දෑ හි ශුද්ධ වැඩිවීම	**1,462,662**	**(14,574,962)**
කාලසීමාව ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දෑ	**1,973,732**	**16,548,694**
කාලසීමාව අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ	**3,436,393**	**1,973,731**

මූල්‍ය ප්‍රකාශයන්ට සටහන්

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය
කොළඹ විශ්ව විද්‍යාලය

1. **සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති**

1.1. වාර්තාකරන ආයතනය

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය 2008 අංක 02 දරන ආඥාපනත යටතේ සංස්ථාගත කොට ඇති අතර 2008 ඔක්තෝබර් 16 දින ගැසට් කරන ලදී. ප්‍රධාන පරිපාලන හම්බන්තොට නව නගරයේ වැලිගත්ත වේ. කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2022/12/31දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශයන් සකස් කෙරේ.

1.2. සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශයන් ගිණුම්කරණය පිළිබඳ ඓතිහාසික පදනම මත පිළියෙළ කරයි. ඒ අනුව ගනුදෙනු වත්කම් අත්කර ගනු ලැබූ, දරනු ලැබූ දිනයේදී පැවති වටිනාකමට වාර්තා කරන අතර ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය විසින් දක්වා ඇති **ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට** අනුකූලව අරමුදල් ලබා ගනී.

මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා රුපියල් වලින් සකස් කෙරෙන අතර එය ක්‍රියාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වේ. පසුගිය වසරට අදාළ සංඛ්‍යා සහ වාක්‍ය ඛණ්ඩ වර්තමාන වසරේ ඉදිරිපත් කිරීම සමඟ සැසඳීම සඳහා අවශ්‍ය තැන්හිදී නැවත සඳහන් කොට ඇත.

1.3. වත්කම් සහ එහි වටිනාකම් පදනම

1.3.1. දේපල පිරියත හා උපකරණ

ඉඩම ලුණුගම්වෙහෙර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇත. එය 1988 සිට ආයතනය විසින් වසර 30ක බදු පදනමක් මත කුලියට දී ඇත.ගොඩනැගිලි හා ව්‍යුහයන්ගේ වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන ලද වටිනාකම මත පදනම් වී දක්වා ඇත.

දේපල, පිරියත සහ උපකරණ සහ විද්‍යාගාරය හා ඉගෙනුම් උපකරණවලට රජයේ ප්‍රදාන, පර්යේෂණ ප්‍රදාන සහ අභ්‍යන්තරව උපයන ලද අරමුදල්වලින් මිලදී ගත් අයිතම ඇතුළත්ය.

දේපල, පිරියත සහ උපකරණ එහි අහඹු වියදම් සහිතව මිලදී ගැනීමේ පිරිවැයට වාර්තා කෙරේ. වත්කම් දක්වා ඇත්තේ සමුච්චිත ක්ෂයවලින් අඩුකළ පිරිවැයටය.

1.3.2 පසුව සිදුවන වියදම්

පසුව සිදුවන වියදම්වලට වත්කමේ ඉදිරියට යන ප්‍රමාණය හෝ සුදුසු පරිදි වෙනම වත්කමක් ලෙස පිළිගත් අගය ඇතුළත් කෙරේ. එසේ වන්නේ අයිතම හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙනම් සහ අයිතම පිරිවැය සැබැවින්ම මැනිය හැකි නම් පමණි. අනිකුත් සියලුම අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු වියදම් ඒවා දරනු ලබන මුදල් කාලසීමාව තුළ ආදායම් ප්‍රකාශයට අය කෙරේ.

1.3.3 දේපල පිරියත සහ උපකරණ නැවත තක්සේරු කිරීම

වත්කමක් ශූන්‍ය ශුද්ධ වටිනාකමක් වාර්තා කරන විට, SLSPAS 07 - දේපල පිරියත සහ උපකරණ ප්‍රකාරව නැවත තක්සේරු කරන ලද වත්කම්වල සම්පූර්ණ ගණනය කිරීම් සහ නැවත තක්සේරු කළ මුදලෙහි සඳහන් වේ.

1.3.4 ඉඩම් සහ ගොඩනැගිලි අතර නැවත වර්ගීකරණයන් හඳුනා ගන්නා ලද අතර, ඒ අනුව වත්කම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය ද වෙනස් කරන ලදී. වගාව සඳහා ඉඩම සකස් කිරීම සහ ආරම්භ කටයුතු සඳහා ඉඩම සංවර්ධනය කිරීම වෙනුවෙන් උපන් පිරිවැය ඉඩම් යටතේ හඳුනාගෙන ඇත.

ක්ෂය විය හැකි ලෙස නම්කල හැකි ගොඩනැගිලි ව්‍යුහය සහ පුනරුත්ථාපනය කිරීම් ගොඩනැගිලි, ව්‍යුහය හෝ යටිතල පහසුකම් යටතේ වර්ග කර ඇත. එනම් මායිම් වැට සහ වාරි පද්ධති එයට අයත් වේ. තවද සෘජුව ගොඩනැගිලි ව්‍යුහය සහ පුනරුත්ථාපනය ලෙස හඳුනාගත නොහැකි නමුත් ක්ෂය විය හැකි වත්කම් යටිතල පහසුකම් වත්කම් යටතේ වර්ග කර ඇත.

1.3.5 ක්ෂයවීම්

ක්ෂයකිරීම් සියලුම දේපල,පිරියත සහ උපකරණ සහ විද්‍යාගාරය හා ඉගෙනුම් උපකරණ ඒවායේ ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් කාලසීමාව පුරා සරල මාර්ගික ක්ෂයකිරීම මත මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයට අය කරනු ලැබ ඇත.

<u>විස්තරය</u>	<u>ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් කාලසීමාව</u>
ගොඩනැගිලි හා ව්‍යුහ සහ ප්‍රතිව්‍යුහගතකිරීම්/යටිතල පහසුකම්	- වසර 20
නේවාසික ගොඩනැගිල්ල	- වසර 20
සවි කිරීම් සහ ස්ථාපනයන්	- වසර 10
වාහන	- වසර 5
විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ	- වසර 5
ඉලෙක්ට්‍රොනික උපකරණ	- වසර 5
ගෘහභාණ්ඩ උපකරණ	- වසර 10
පරිගණක / කාර්යාලීය උපකරණ	- වසර 10
මෘදුකාංග	- වසර 05
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	- වසර10
පිරියත, යන්ත්‍ර සහ උපකරණ	- වසර10
පොත්	- වසර10
ක්‍රීඩා භාණ්ඩ/සංගීත උපකරණ	- වසර10

භාවිතා කරන කාල සීමාව මත පදනම්ව මිලදී ගත් වර්ෂයේ සිට සහ විකුණුම් වර්ෂය දක්වා ක්ෂයවීම් සපයනු ලැබේ, මිලදී ගත් දිනයේ සිට සම්පූර්ණ ක්ෂයවීම් ලබා දෙනු ලැබේ.

1.3.6 ක්‍රමක්ෂය

රජයේ ප්‍රාග්ධන ප්‍රදාන භාවිතා කරමින් මිලදී ගනු ලැබූ ප්‍රාග්ධන වත්කම් සඳහා ක්ෂයකිරීම් වෙනුවෙන් ක්‍රමක්ෂය වෙන් කර ඇත.

1.3.7 විලම්බිත වියදම්

ලංකා විදුලිබල මණ්ඩලයේ පිරියත ට්‍රාන්ස්ෆෝමරය සඳහා දරන ලද වියදම විලම්බිත වියදමක් ලෙස හඳුනාගෙන ඇති අතර එය සමාන වාරික ලෙස මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයෙන් කපා හරිනු ලැබේ.

1.3.8. තොගය

2022.12.31 දිනට අමුද්‍රව්‍ය සහ පාරිභෝගික භාණ්ඩ, නොනිමි තොගය, පටක රෝපිත කෙසෙල් පැල තොගය අවම පිරිවැයට සහ ශුද්ධ මුදා හැරීමේ වටිනාකමට මනිනු ලැබේ. ශුද්ධ මුදා හැරීමේ වටිනාකම යනු නිම කිරීමේ සහ විකිණීමේ වියදම් පිළිබඳ ඇස්තමේන්තු ගත පිරිවැයයි. තොග ඇගයීමේ ක්‍රමය වන්නේ පෙර ඇතුළු පෙර පිටවීම් ක්‍රමයයි(FIFO)

1.3.9 ලැබිය යුතු දේ

ලැබිය යුතු ඒවා සාක්ෂාත් කර ගැනීමට ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණයන්හි සඳහන් වේ.

1.3.10 පශු සම්පත් සහ අස්වැන්න

මෙහෙයුම් සහ ප්‍රධාන කියාකාරකම්

UCIARS පශු සම්පත් ක්‍රියාකාරකම්වල නිරත වන අතර ආයතනය විසින්ම කළමනාකරණය කරමින් සිටී

ජීව විද්යාත්මක පරිවර්තනය. UCIARS ගවයින් සමඟ කිරි නිෂ්පාදනයේ නිරත වේ, ඌරු පැටවුන් බෝ කිරීම, බිත්තර නිෂ්පාදනය, බ්‍රොයිලර් නිෂ්පාදනය සහ එළු කිරි නිෂ්පාදනය. සතුන් (Bearer Animals) වසරකට වැඩි කාලයක් භාවිතා කරන සතුන් ජංගම නොවන වත්කම් ලෙස දක්වා ඇත.

පශු සම්පත් සාධාරණ වටිනාකමින් විකිණීම සඳහා පිරිවැය අඩුකර මනිනු ලැබේ.පශු සම්පත්වල සාධාරණ වටිනාකම වෙළඳපොළ වටිනාකම මත තීරණය කරනු ලබයි.

2022.12.31 දිනට ඇති සාධාරණ වටිනාකමින් විකිණීම සඳහා පිරිවැය අඩුකර අස්වැන්න හඳුනා ගැනේ

ගොවිපල කළමනාකරු / UCIARS ගොවිපල විසින් සත්‍යාපනය කරන ලද ප්‍රමාණය

වර්ගය	ආරම්භක	උපත්	මිලදී ගැනීම්	විකිණීම්	ඝාතනය කිරීම්	මරණ	අවසාන
ඌරන්	14	39		-33	-3	-4	13
ගවයන්	9	2		-1			10
එළුවන්	25	8				-3	30
30පිටලන කිකිළියන්	415			-300		-53	62
බ්‍රොයිලර්ස්			300	-100			200
ඒකතුව	463	49		-334	-3	-60	115

වර්ගය	ආරම්භක	උපත්	මිලදී ගැනීම්	විකිණීම්	ඝාතන කිරීම්	මරණ	අවසාන	වෙළඳපල මිලට තක්සේරු කිරීම	සාධාරණ අගය වෙනස වීම
ඌරන්	1,440,000	31,200		(26,400)	(577,800)	(3,200)	863,800	1,126,250	262,450
ගවයන්	2,315000	39,600		(39,600)			2,315,000	3,025,000	710,000
එළුවන්	666,000	14,400				(5,400)	675,000	806,400	131,400
පිටලන කිකිළියන්	265,000			(192,000)		(33,920)	39,680	55,800	16,120
බ්‍රොයිලර්ස්			57,000	(19,000)			38,000	400,800	362,800
ඒකතුව	4,686,6000	85,200	57,000	(277,000)	(577,800)	(42,520)	3,931,480	5,414,250	1,482,770

1.3.11 **මුදල් සහ මුදල් සමාන දෑ**

මුදල් සහ මුදල් සමාන දෑ බැංකු ශේෂ වලින් සමන්විත වේ.

1.3.12 **ජංගම වත්කම්**

ශේෂ පත්‍රයේ වර්ගීකරණය කර ඇති ජංගම වත්කම් යනු ශේෂ පත්‍ර දිනයෙන් පසු වසරක් ඇතුළත අයකර ගනු ලබන ඒවා වේ.

1.4 **වගකීම් සහ ඒවායේ තක්සේරු කිරීම්**

1.4.1 පාරිතෝෂික

(අ) 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ ගෙවීම් යටතේ අදාළ අනුපාතයන්ට විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම සිදු කරන අතර මෙම පනත යටතේ පාරිතෝෂික ගෙවීම සඳහා සුදුසුකම් ලැබීමට සේවකයින් විසින් අවම වශයෙන් අවුරුදු 05ක සේවා කාලයක් සම්පූර්ණ කළ යුතුය. සියලුම සේවකයින් සේවාවේ වසර 05ක් නියුක්තව සිටියේයැයි උපකල්පනය කරමින් පළමු වසරේ සේවාව සම්පූර්ණ කිරීමෙන් පසු වෙනස් කිරීම සිදු කෙරේ.

(ආ) පාරිතෝෂිකය ශ්‍රී ලංකාවේ 19 රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කරමින් ආයතනය විසින් ගණන කරනු ලැබේ.

(ඇ) තවද 2021 වසරේ සිට ක ක්‍රියාකාරී තක්සේරුව වෘත්තීය තක්සේරු ආයතනයක් විසින් සිදු කරනු ලැබේ. 2022 වසර සඳහා හෙළිදරව් කිරීම් පහත පරිදි වේ.

<u>නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ (PV-DBO) වර්තමාන වටිනාකමෙහි අය කිරීම</u>

2022 ජනවාරි 01 දිනට PV-DBO සඳහා ප්‍රතිපාදන	=	13,783,079
කාල සීමාව සඳහා පොලී පිරිවැය	=	1,585,054
පසුගිය සේවා වියදම්	=	379,519
කාල සීමාව සඳහා වත්මන් සේවා පිරිවැය	=	1,314,712
කාල සීමාව තුළ හැර ගිය අය සඳහා ගෙවන ලද / ගෙවිය යුතු පාරිතෝෂිකය	=	(809,005)
PV - DBO මත සත්‍ය (ලාභ) / අලාභය	=	(6,028,845)
2022 දෙසැම්බර් 31 දිනට PV - DBO සඳහා ප්‍රතිපාදන	=	10,224,514

ශේෂ පත්‍රයේ සහ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇති මුදල

ශේෂ පත්‍රයේ හඳුනාගෙන ඇති වගකීම්

2022 දෙසැම්බර් 31 වන විට පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	=	10,224,514
2022 දෙසැම්බර් 31 වන විට හඳුනා නොගත් ක්‍රියාකාරී ලාභ / (පාඩු)	=	-
2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ හඳුනාගෙන ඇති වගකීම්	=	10,224,514

ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් වියදම්

පසුගිය සේවා වියදම්	=	379,519
පොලී පිරිවැය	=	1,585,054
වත්මන් සේවා පිරිවැය	=	1,314,712
වහාම හඳුනා ගත් ශුද්ධ ක්‍රියාකාරී (ලාභ) / අලාභය	=	(6,028,845)
ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් වියදම්	=	(2,749,560)

ශේෂ පත්‍රයේ හඳුනාගත් ශුද්ධ වගකීම් වල චලනයන්

2022 ජනවාරි 01 දිනට ශුද්ධ වගකීම විවෘත කිරීම	=	13,783,079
ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් වියදම්	=	(2,749,560)
කාල සීමාව තුළ හැර ගිය අය සඳහා ගෙවන ලද /ගෙවිය යුතු පාරිතෝෂිකය	=	(809,005)
2022 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වගකීම අවසන් කිරීම	=	10,224,514

1.4.2 ජංගම වගකීම්

ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් ශේෂ පත්‍රයේ දින සිට වසරක් ඇතුළත ගෙවීමට නියමිත වගකීම් වේ. අවසාන ප්‍රකාශ සකස් කිරීමේදී දන්නා සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත.

1.4. ආදායම් සහ වියදම

1.4.1. රජයේ ප්‍රදානය සහ වෙනත් ප්‍රදාන

වසර වෙනුවෙන් ලද මුළු ප්‍රාග්ධන ප්‍රදානය රුපියල් මිලිය 12.5 ක් විය. වසරේ මෙහෙයුම් කාර්යයන් සඳහා භාවිතා කොට ඇති පුනරාවර්තන ප්‍රදාන රුපියල් මිලිය 101.42 ක් වූ අතර ආදායම් ප්‍රකාශය තුළ ආදායම් ලෙස හඳුනාගෙන ඇත.
AHED ව්‍යාපෘති වටිනාකමින් වර්ෂය තුළ ලැබුණු අනෙකුත් ප්‍රදානරුපියල් මිලිය 3.6 කි.

1.4.2. ආදායම් හඳුනාගැනීම

(අ) රජයේ ප්‍රදාන (පුනරාවර්තන)
රජයේ පුනරාවර්තන වියදම් ලැබෙන කාලසීමාව තුළ හඳුනාගනී

(ආ) පාඨමාලා ගාස්තු
2021 දක්වා පාඨමාලා ගාස්තු උපදේශන කාලසීමාව තුළ හඳුනාගනී. වෙනත් මුදල් කාලසීමාවක් සඳහා එවැනි වෙන්කිරීමක් සිදු කිරීමට ප්‍රමාණවත් තොරතුරු ලබාගත නොහැකි අවස්ථාවක, මුදල් පදනම මත ආදායම් ලෙස ගාස්තු හඳුනාගනී

මූල්‍ය ප්‍රකාශනයන්හි වැඩිදියුණු කිරීම සලකා බලා රජයේ විගණකවරයාගේ සහ විගණන කම්ටුවේ නිර්දේශ මත පාඨමාලා ගාස්තු ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය උපචිත පදනමට වෙනස් කරන ලද අතර එය 2022 සිට අදාළ වනු ඇත.

උපචිත ගිණුම්කරණයේ ලක්ෂණයක් වන ආදායම් හඳුනාගැනීමේ මූලධර්මයට අනුව, මුදල් ලැබෙන විට නොව උපයාගත් කාලපරිච්ඡේදය තුළදී ආදායම් ප්‍රකාශය මත ආදායම් හඳුනා ගැනීම අවශ්‍ය වේ. උපලබ්ධි යන්නෙන් අදහස් කරන්නේ පාරිභෝගිකයාට භාණ්ඩ හෝ සේවා ලැබී ඇති නමුත් භාණ්ඩය හෝ සේවාව සඳහා ගෙවීම පසුව බලාපොරොත්තු වන බවයි. පිළිවෙළින් සපයා ඇති හෝ ඉටු කර ඇති භාණ්ඩ හෝ සේවා සඳහා ඉපැයූ ආදායම් ලෙස ගිණුම් ගත වේ.

ආදායම් හඳුනාගැනීමේ මූලධර්ම ආවරණය කිරීම සඳහා නිසි තොරතුරු නොමැතිකම හේතුවෙන් 2021 වර්ෂය තුළ බිල්පත් / උපයාගත් ආදායම හඳුනා ගැනීමට අපට නොහැකි විය. පාරිභෝගිකයා/ශිෂ්‍යයන් සමඟ ඇතිකරගත් ගිවිසුම සහ කාර්ය සාධන බැඳීම මගින් උපයාගත් සැබෑ ආදායම කාලෝචිත ලෙස හඳුනා ගැනීමට නොහැකි විය.

1. අධ්‍ය වාරයේ ලියාපදිංචිය සිදු කර නොමැති අතර 2022 සිට එම කටයුත්ත ආරම්භ කරන ලදී. තොරතුරු ලබා ගත හැක්කේ මූලික අදියර ලියාපදිංචිය සඳහා පමණි.
2. අත්හැරීමේ අනුපාතය 50%ට ආසන්න විය.
3. එසේම ආයතනයට නිසි මාර්ගගත ගෙවීම් පද්ධතියක් නොතිබූ අතර ආයතනයට භාර නොදුන් ලදුපත් හිඟ ශේෂයක් ලෙස ද දක්වා ඇත. දැන් අපි මාර්ගගත ගෙවීම් පද්ධතියක් පවත්වාගෙන අතර හඳුනා නොගත් ආදායම විශාල ලෙස අඩු කර ඇත.

ඉහත දුර්වලතා 2022 තුළ විසඳා ඇති අතර අනාගත මූල්‍ය වර්ෂ සඳහා උපචිත පදනම දිගටම පවතිනු ඇත. ඉහත ප්‍රායෝගික තත්ත්වයන් හේතුවෙන් ආදායම් හඳුනාගැනීමේ මූලධර්ම සපුරා නොමැති බැවින් ප්‍රතිපත්තිමය වෙනසක් ඉදිරියේදී අදාළ වනු ඇත.(prospectively)

(ඇ) නේවාසිකාගාර ගාස්තු ආදායම
නේවාසිකාගාර ගාස්තු ආදායම 2021 දක්වා මුදල් පදනම ලෙස හඳුනාගෙන ඇත. නේවාසිකාගාර වාර්තා යාවත්කාලීන කර අදාළ වගකිවයුතු කාර්ය මණ්ඩලය බඳවා ගත් බැවින්, බිල්පත්/උපයා ඇති ආදායම හඳුනාගෙන පිළිවෙළින් උපචිත පදනම මත ආදායම හඳුනාගනු ලැබේ.

(d) ආයෝජන ආදායම
ආයෝජනයෙන් ලැබෙන පොලී ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කෙරේ.

1.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා "වක්‍ර ක්‍රමය" භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කර ඇත. මුදල් සහ මුදල් සමාන මුදල් බැංකු ශේෂයන්ගෙන් සමන්විත වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 2022

සටහන - 01	**2022**	**2021**
බැංකු ශේෂය	**රු.**	
හම්බන්තොට ලංකා බැංකුවේ පැල විකිණිම් රැස්කිරීමේ ගිණුම - 87319817	123,729	632,796
හම්බන්තොට මහජන බැංකුවේ පැල විකිණිම් රැස්කිරීමේ ගිණුම - 007-1001-4-6432005	-	-
හම්බන්තොට මහජන බැංකුවේ සහතිකපත් පාඨමාලා රැස්කිරීමේ ගිණුම - 007-1001-3-0005888	1,736,754	282,320
හම්බන්තොට මහජන බැංකුවේ රජයේ ප්‍රදාන(ප්‍රාග්ධන/පුනරාවර්තන) ගිණුම - හම්බන්තොට මහජන බැංකුව 007-1001-2-0005006	210,371	881,141
හම්බන්තොට මහජන බැංකුවේ ගොවි භාරකාර අරමුදල - 007-1001-3-0012515	52,495	12,495
හම්බන්තොට මහජන බැංකුවේ වැටුප් ජංගම ගිණුම - 007-1003-2-6432005	-	-
හම්බන්තොට මහජන බැංකුවේ පුනරාවර්තන වියදම් ගිණුම 007-1002-3-6432005	1,313,045	164,980
	3,436,393	1,973,732

සටහන - 02	**2022**	**2021**
තොග	**රු.**	
අමුද්‍රව්‍ය හා කොහුබත්	112,712	3,283
නොනිමි වැඩ කෙසෙල් පැල	130,405	136,904
නිමි වැඩ කෙසෙල් පැල	1,579,450	1,262,260
කෝමාරිකා පැල	0	166,875
යෝගට් නිෂ්පාදනය හා ගොවිපල තොග	272,796	6,550
ලිපි ද්‍රව්‍ය	3,201,755	1,186,291
රසායනික ද්‍රව්‍ය	693,223	924,315
විදුලි සහ දෘඩාංග	1,604,940	1,110,603
පාරිභෝගික භාණ්ඩ හා වීදුරු උපකරණ	3,955,293	2,450,631
ඉන්ධන තොග	119,800	
	11,670,374	7,247,711

සටහන - 03	**2022**	**2021**
	රු	
ලැබිය යුතු පොළිය	**-**	
ලැබිය යුතු පොළිය -REPO		1,753
ගොවි භාරකාර අරමුදල් ණය	67,900	68,400
මාස 3 කෙටි කාලීන ආයෝජන පොලී	-	192,231
ස්ථාවර තැන්පතු පොලී	707,920	19,110
	775,820	281,494

සටහන - 04	2022	2021
ණය ගිණුම	රු.	
ගොවි භාරකාර අරමුදල් ණය	617,890	634,820
ආපදා ණය	2,421,426	1,352,451
	30,393,16	1,987,271

සටහන - 05	2022	2021
පෙරගෙවුම් ගිණුම	රු.	
රක්ෂණ	103,690	40,338
වෙනත් ගිවිසුම්ගත සේවා	314,091	119,484
	417,781	159,822

සටහන - 06	2022	2021
වෙනත් ජංගම නොවන වත්කම්	රු.	
ආපසු ගෙවිය යුතු තැන්පතු	200,000	75,000
ලැබිය යුතු ආදායම් -	102,900	
UPF/විශ්‍රාම වැටුප්/ETF ලැබිය යුතු	914,679	914,679
වෙනත් ලැබියයුතු	394,725	
ලැබියයුතු පාඨමාලා ආදායම	3,495,534	
ලැබියයුතු නේවාසිකාගාර ගාස්තු	2,901,145	734550
	8,008,983	1724229

සටහන - 07	2022	2021
ආයෝජන කෙටි කාලීන	රු.	
ආරම්භක ශේෂය	21,299,950	300,000
ආපසු ගැනීම් ස්ථාවර වත්කම්වත්කම්	(7,300,000)	
ආපසු ගැනීම් භාණ්ඩාගාර බිල්පත් ආයෝජන	(4,999,950)	
ආපසු ගැනීම් REPO ආයෝජන	(689,200,000)	
එකතු කිරීම් භාණ්ඩාගාර බිල්පත් ආයෝජන	-	4,999,950
එකතු කිරීම් REPO ආයෝජන	673,200,000	16,000,000
එකතු කිරීම් ස්ථාවර වත්කම්වත්කම්	24,699,800	-
අවසාන ශේෂය	17,699,800	21,299,950

සටහන - 06

ජංගම නොවන වත්කම් - පළමු වගුව

විස්තරය	විදුලි උපකරණ	නේවාසිකාගාර ව්‍යාපෘතිය	ගොඩනැගිලි හා ව්‍යුහ	ගොඩනැගිලි හා ව්‍යුහ අලුත්වැඩියා	වෙනත් යටිතල පහසුකම් වත්කම්	මෝටර් රථ හා උපකරණ	විද්‍යාගාරය සහ තාක්ෂණික උපකරණ	පිරියත, යන්ත්‍ර සහ උපකරණ	සංගීත භාණ්ඩ	මුලු ගණන
ජංගම නොවන වත්කම 2022/01/01 දිනට ශේෂය	311,816	222,422,928	300,568,554	56,488,183		11,076,270	4,728,249	6,500,892	373,925	602,470,817
ආරම්භක තොග - යටිතල පහසුකම්			(2,000,000)		11,503,457					9,503,457
ආරම්භක තොග - වර්ගීකරණ මාරුකිරීම්			12,315,851	(19,231,886)						(6,916,035)
ආරම්භක ශේෂ ගැලපීම්			(32,334)	(89,964)						(122,298)
	311,816	222,422,928	310,852,071	37,166,333	11,503,457	11,076,270	4,728,249	6,500,892	373,925	604,935,941
එකතුකිරීම්/ වැඩිදියුණු කිරීම්	-	-		9,313,712			488,888	943,545		10,746,145
වත්කම් තක්සේරු කිරීම										
ප්‍රාග්ධන ප්‍රදාන										
වෙනත් ප්‍රදාන										
බැහැරකිරීම්										

2022/12/31 දිනට මුළු ගණන	311,816	222,422,928	310,852,071	46,480,045	11,503,457	11,076,270	5,217,137	7,444,437	373,925	615,682,086
ක්ෂය සඳහා වෙන්කිරීම ක්ෂය කිරීමේ අනුපාතය	20%	5%	5%	5%	5%	20%	20%	10%	10%	90%
2022/01/01 දිනට ශේෂය	211,110	78,144,597	44,916,180	4,174,928		3,994,651			120,677	131,562,142.60
ආරම්භක ශේෂ ගැලපීම්			1,709,853	(445,409)						1,264,444.03
කාණ්ඩ සමග වෙනස් කිරීම්			(200,00)	(197,837)	397,837					
ප්‍රතිදාන සඳහා ක්ෂය ඉවත්කිරීම			(1,617)	(4,498.19)						(6,114.90)
	211,110	78,144,597	46,424,417	3,527,184	397,837	3,994,651			120,677	132,820,472
බැහැරකිරීම්										
වසරේ ක්ෂය කිරීම්	37,400	11,121,146	15,542,604	1,858,317	575,173	1,711,530	1,011,779	711,961	37,393	32,607,301.64
2022/12/31 දිනට ශේෂය	248,510	89,265,743	61,967,020	5,385,500	973,010	5,706,181	1,011,779	711,961	158,069	165,427,773
ශුද්ධ පොතේ වටිනාකම - 2022/12/31	63,306	133,157,185	248,885,051	41,094,545	10,530,447	5,370,0899	4,205,358	6,732,476	215,856	450,254,313

ජංගම නොවන වත්කම් - දෙවන වගුව

විස්තරය	ගෘහස්ත උපකරණ	කාර්යාලීය උපකරණ	ගෘහභාණ්ඩ හා සවිකිරීම්	ක්‍රීඩා භාණ්ඩ	පොත්	ඇසුරුම් ද්‍රව්‍යකාංග	ඉඩම් සඳහා මූලික වියදම්	වගු II න් ගෙන ආ එකතුව	වගු I න් ගෙන ආ එකතුව	මුලුගණන
ජංගම නොවන වත්කම										
2022/01/01 දිනට ශේෂය	1,172,238	8,133,976	20,161,628	222,000	643,498	695,000	22,394,006	53,422,346	602,470,817	53,422,346
ආරම්භක තොග - යටිතල පහසුකම්	(4)							(4)	9,503,457	9,503,453
ආරම්භක තොග - වර්ගීකරණ මාරුකිරීම්							(2,490,842)		(6,916,035)	(6,916,035)
ආරම්භක ශේෂ ගැලපීම්				-	-		-	0	(122,298)	(122,298)
	1,172,234	8,133,976	20,161,628	222,000	643,498	695,000	19,903,164	50,931,500	604,935,941	50,931,500
එකතුකිරීම්/ වැඩිදියුණු කිරීම්	31,499	6,972,953	1,908,220	-	-			8,912,672	10,746,145	19,658,817
වත්කම් තක්සේරු කිරීම										
ප්‍රාග්ධන ප්‍රදාන										
වෙනත් ප්‍රදාන										
බැහැරකිරීම්		(56,760)	(111,841)					(168,601)		(168,601)
2022/12/31 දිනට මුළු ගණන	1,203,733	15,050,169	21,958,007	222,000	643,498	695,000	19,903,164	59,675,571	615,682,086	675,357,657
ක්ෂය සඳහා වෙන්කිරීම ක්ෂය කිරීමේ අනුපාතය	10%	10%	10%	10%	10%	20%				
2022/01/01 දිනට ශේෂය				88,982.47	346,928.57	84,500.00	-	520,411.04	131,562,142.6	132,082,554
ආරම්භක ශේෂ ගැලපීම්									1,264,444.03	1,264,444
කාණ්ඩ සමග වෙනස් කිරීම්										
ප්‍රතිදාන සඳහා ක්ෂය ඉවත්කිරීම									(6,114.9)	(6,115)

				88,982.47	346,928.57	84,500		520,411,04	132,820,471,73	133,340,882.77
බැහැරකිරීම්										
වසරේ ක්ෂය කිරීම්	120,071	1,025,848	2,027,525	22,200	64,350	139,000		3,398,993.61	32,607,301.64	36,006,295.25
2022/12/31 දිනට ශේෂය	120,071	1,025,848	2,027,525	111,182	411,278	223,500		3,919,404.65	165,427,773	169,347,178.02
ශුද්ධ පොතේ වටිනාකම - 2022/12/31	1,083,662	14,024,321	19,930,482	110,818	232,220	471,500	19,903,164	55,756,166.11	450,254,313	506,010,479

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

කොළඹ විශ්ව විද්‍යාලය

මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් - 2022 (ඉතිරි කොටස)

සටහන - 09	2022	2021
විලම්බිත වියදම්	රු.	
ට්‍රාන්ස්ෆෝමරය - ලංකා විදුලි බල මණ්ඩලය	259,860	519,720
විදුලි උපකරණ	570,271	837,064
	830,131	1,356,784

සටහන - 10	2022	2021
උපචිත වියදම්	රු.	
විදුලිය	618,026	281,468
ජලය	24,846	47,822
අන්තර්ජාල සම්බන්ධතා	737,278	592,185
සේවක අර්ථ සාධක අරමුදල	-	74,709
නිවාඩු දින දීමනා	24,098	-
දේශීය ගමන් වියදම්	25,610	6,250
ඉන්ධන හා ලිහිසි තෙල්	-	17,175
දුරකථන	27,,829	27,979
විශ්ව විද්‍යාල අර්ථ සාධක අරමුදල	-	799,011
අතිකාල	102,857	72,319
කුළියට ගැනීම / ප්‍රවාහන	-	62,890
පිරියත. යන්ත්‍ර හා උපකරණ (මූලික)	-	73,441
විභාග ගාස්තු	195.334	273,270
උපදේශන ගාස්තු	515,363	123,551
වෙනත් ගිවිසුම්ගත සේවා	-	102,831
ආරාධිත දේශන ගාස්තු	193,500	111,000
වැඩමුලු හා සම්මන්ත්‍රණ	-	-
පවිත්‍රතා කටයුතු සේවා	1,510,932	844,483
මුද්‍රණ හා ප්‍රචාරණ	124,890	-
ආරක්ෂක සේවා	460,350	371,963
පුහුණුවන්නන්ගේ ගෙවීම් VTA	9,500	19,500
උපාධි පාඨමාලා සඳහා වියදම්	3,806	69,530
පාරිභෝගික භාණ්ඩ හා ලිපි ද්‍රව්‍ය	-	22,500
පරිභෝගික හා වීදුරු භාණ්ඩ	-	209,832
පරිවර්තන ගාස්තු	62,580	6,063
පාරිභෝගික විදුලි හා දෘඪාංග උපකරණ	-	114,317
සත්ව පාලන කටයුතු	152,450	285,696
ගොවිපල සංවර්ධන වියදම් - කෙසෙල්	-	53,825
ගොවිපල සංවර්ධන වියදම් - ෙදලුම්	166,400	-
ගොවිපල හා වාරිමාර්ග වියදම්	130,000	145,825
වෙනත් පුනරාවර්තන වියදම්	-	34,150
උත්සව සහ සමාරම්භක වියදම්	-	8,400
විශේෂ සේවා සැපයීම්	131,500	73,000
වාහන (අලුත්වැඩියා කිරීම්)	21,050	131,630

බලපත්‍ර සහ රක්ෂණ ගෙවීම්	114,893	847
ක්ෂේත්‍ර වියදම්	1,750	2,000
ෆෝටෝ කොපී , වායුසමීකරණ හා සෝපාන අලුත් වැඩියා	10,010	7,000
විගණන ගාස්තු	336,000	672,000
ලිපි ද්‍රව්‍ය	2,197	1,830
පාරිභෝගික භාණ්ඩ හා වීදුරු උපකරණ වියදම්	-	6,445
පැල විකුණුම් වියදම්	3,825	1,488
ගොඩනැගිලි හා ව්‍යුහ (අලුත්වැඩියා කිරීම්)	227,500	-
බිම්මල් ව්‍යාපෘතිය	-	1,400
විද්‍යාගාර අලුත්වැඩියා	-	680
විශ්‍රාම වැටුප්	-	242,598
EDCS	-	910
වෙනත් තෙල් දීමනා	-	1,886
ජාල ද්‍රව්‍ය	4,500	-
නිල ඇඳුම් සඳහා වියදම්	99,710	-
දුම්රිය බලපත්‍ර	5,075	-
සාදමින් පවතින ඌරු මඩුව	97,500	-
යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම්	-	4,090,596
ගොඩනැගිලි හා ව්‍යුහ	552,546	2,571,290
මෘදුකාංග	-	59,250
ජල පිරිපහදු පද්ධතිය	1,641,027	-
පුනරුත්ථාපනය සහ දිගු කිරීම	1,647,663	-
වාරිමාර්ග පද්ධතිය	286,025	-
උපචිත වැටුප් වියදම්	3,159,753	2,155,519
	13,428,170	14,872,354

සටහන - 11	2022	2021
වෙනත් ජංගම වගකීම්	රු.	
ගෙවිය යුතු බදු	8,880	49,858
ණය-සේවක	7,389	7,389
වෙනත් වගකීම්	33,081	7,025
ලංසුව - ආරක්ෂාව (ගෙවිය යුතු)	106,580	-
අත්තිකාරම් ගෙවීම් - පාඨමාලා ගාස්තුව	10,099,191	-
අත්තිකාරම් ගෙවීම් - නේවාසිකාගාර ගාස්තුව	28,300	5,650
හදුනාගත නොහැකි ආදායම	253,310	-
	10,536,731	69,921

සටහන - 12	2022	2021
ජංගම නොවන වගකීම්	රු.	
ගොවි භාරකාර අරමුදල	75,003	75,003
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	10,224,514	13,783,079
ආපසු ගෙවන තැන්පතු	10,000	10,000
නැවත ගෙවිය යුතු - UOC(කොළඹ විශ්ව විද්‍යාලය) ප්‍රදාන	5,000,000	5,000,000
	15,309,517	18,868,082

සටහන - 13 - පිරිවැය ගණන කිරීමේ සටහන් - මූලික පිරිවැය-අමුද්‍රව්‍ය පිරිවැය

1,758,014 1,447,106

විස්තරය	2022		2021	
	රසායනික ද්‍රව්‍ය	කොහුබත්	රසායනික ද්‍රව්‍ය	කොහුබත්
ආරම්භක තොගය	125,836.82	3,282.50	210,671.24	157,846.00
විද්‍යාගාරයට සහ තවාන් අංශයට නිකුත් කිරීම්	669,577.26	1,237,500.00	549,907.80	657,800.00
අවසන් තොගය	(165,470.36)	(112,712.00)	(125,836.82)	(3,282.50)
නිෂ්පාදන අමුද්‍රව්‍ය සඳහා පිරිවැය	629,943.72	1,128,070.5	634,742.22	812,363.50

නිෂ්පාදන පුද්ගලික වැටුප් විස්තර

විස්තරය	2022	2021
පුද්ගලික පඩි නඩි හා වැටුප් - නිෂ්පාදන ඒකකය	15,294,841	10,261,454
විශ්ව විද්‍යාල අර්ථ සාධක අරමුදල නිෂ්පාදන ඒකකය	922,553	712,665
විශ්‍රාම වැටුප් නිෂ්පාදන ඒකකය	951,484	666,166
සේවක භාරකාර අරමුදල නිෂ්පාදන ඒකකය	374,808	275,766
	17,543,686	11,916,052

වක්‍ර පිරිවැය/වෙනත් පොදු කාර්ය පිරිවැය

විස්තරය	2022	2021
දුරකථන 5%	15,734	14,222
ජලය 40%	403,057	469,487
විදුලිය 30%	1,184,538	1,067,599
අලුත්වැඩියා වියදම්	90,570	87,754
දෘඩ සහ පාරිභෝජන ද්‍රව්‍ය	1,070,676	936,351
විද්‍යාගාර උපකරණ ක්ෂය	408,722	848,914
වෙනත් වක්‍ර වියදම්	27,075	74,274
	3,200,371	3,498,601

සටහන -14	2022	2021
උපයාගත් ආදායම්	රු.	
සහතික පත්‍ර පාඨමාලාව - කෘෂි තාක්ෂණික ආයතනය	27,829,633	41,077,942
වෙනත් ආදායම්	684,053	811,119
වෙනත් පැළ විකුණුම්	10,128,846	3,337,294
යෝගට් විකුණුම්	138,970	-
නේවාසික ගාස්තු	3,958,320	1,761,443
	42,739,822	46,258,898

* පාඨමාලා ආදායමේ සහ නේවාසිකාගාර ගාස්තු ආදායමේ සැලකිය යුතු වෙනස්කම් වලට හේතුව මුදල් පදනමේ සිට උපචිත පදනම වෙත මාරු වීම වේ.

සටහන - 15	2022	2021
පොලී ආදායම්	රු.	
ආපදා ණය පොළිය	86,829	69,137
Repo ආයෝජන පොළි	155,827	108,344
වෙනත් ආයෝජන පොළි	1,577,653	210,981
	1,820,310	388,461

සටහන - 16	2022	2021
පුද්ගලික පඩිනඩි	රු.	
වැටුප් හා වේතන	61,204,981	55,629,177
සේවක අර්ථ සාධක අරමුදල	504,756	778,690
විශ්ව විද්‍යාල අර්ථ සාධක අරමුදල	3,432,985	3,440,584
විශ්‍රාම වැටුප්	2,001,478	1,998,899
සේවක භාරකාර අරමුදල	1,347,640	1,214,086
අතිරේක වැඩකළ දින ගෙවීම්	56,498	37,314
අනිකාල දීමනා	812,963	567,989
	69,361,300	63,666,739

සටහන - 17	2022	2021
ගමන් වියදම්	රු.	
විදේශීය	-	-
දේශීය	56,895	86,466
	56,895	86,466

සටහන - 18	2022	2021
සැපයුම්	රු.	
යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ	940,434	261,390
ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	2,041,251	1,130,166
නිල ඇඳුම්	752,570	480,296
ඉන්ධන හා ලිහිසි තෙල්	2,424,172	1,202,685
පාරිභෝජන ද්‍රව්‍ය හා වීදුරු භාණ්ඩ	204,128	416,421
වෙනත්	351,562	305,575
රසායනික ද්‍රව්‍ය	63,627	22,175
	6,777,744	3,818,709

සටහන - 19	2022	2021
නඩත්තු වියදම්	රු.	
පිරියත යන්ත්‍ර හා උපකරණ	406,793	520,304
මෝටර් වාහන	324,246	565,956
ගොඩනැගිලි හා ව්‍යුහ	488,605	139,510
වෙනත්	67,444	127,373
	1,287,088	1,353,143

සටහන - 20	2022	2021
ගිවිසුම්ගත සේවා	රු.	
ප්‍රවාහනය	2,020,546	1,110,845
තැපැල් හා විදුලි සන්නිවේදන	4,481,232	3,801,121
විදුලිය	4,732,227	2,491,063
ජලය	1,612,229	704,230
ආරක්ෂක සේවා	4,863,594	3,768,350
පිරිසිදු කිරීමේ සේවා	6,411,016	5,051,523
වෙනත් සේවා	1,135,230	737,541
මුද්‍රණය හා ප්‍රචාරණය නාදිය	1,407,567	1,012,722
	26,663,640	18,677,395

සටහන - 21	2022	2021
වෙනත් පුනරාවර්තන වියදම්	රු.	
ආරාධිත දේශන ගාස්තු	284,700	790,500
විශේෂ සේවා - අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා කමිටු රැස්වීම	803,482	845,400
වැඩමුළු, සම්මන්ත්‍රණ	67,660	25,000
බැංකු ගාස්තු	267,609	166,700
සහතික පත්‍ර පාඨමාලා වියදම් UCIARS	568,518	444,269
විනෝදාස්වාද වියදම්	80,568	53,088
කාර්ය මණ්ඩල සංවර්ධනය	203,625	-
ගොවිපල හා ජල කළමණාකරන වියදම්	8,516,659	1,813,835
විභාග වියදම	2,461,877	526,586
සත්ව පාලනය	7,179,571	1,852,687
බලපත්‍ර හා රක්ෂණ ගාස්තු	342,667	847
බැහැර කිරීමේදී පාඩුව	107,571	3,826
කහ පර්යේෂණ සඳහා වියදම්	-	42,550
පර්යේෂණ සම්මන්ත්‍රණ (Sympossium) වියදම්	109,950	87,954
පුහුණු දීමනාව	1,044,150	170,000
විගණන ගාස්තු	336,000	336,000
උපදේශන ගාස්තු	861,373	123,551
පරිත්‍යාග	55,800	398,230
වෙනත්	586,804	689,906
යෝගට් නිෂ්පාදන වියදම්	149,848	-
	24,028,431	8,370,929

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. | SPCG/HM/C/FA/IARS/05/2022/01 | ඔබේ අංකය உமது இல. Your No. | දිනය திகதி Date | 2023 මැයි 25 දින

සභාපති,
කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.7,790,020 ක් වූ ලැබිය යුතු පාඨමාලා ගාස්තු ගිණුම්ගත කර නොතිබුණු අතර එම දෝෂය සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කර නොතිබුණු බැවින් ලැබිය යුතු ගිණුම් සහ සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රාග්ධන ප්‍රදාන හා AHEAD ව්‍යාපෘතිය මගින් ලැබී තිබුණු රු.16,202,111 ක ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුල හඳුනා ගැනීම හා මැනීම සිදුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී ස්ථාවර වත්කම් හා ජීව තොග මිලදී ගැනීම් රු.12,871,027ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්හි මුදල් ගලායාම් යටතේ එම අගය රු.14,814,439 ක් ලෙස දක්වා තිබීමෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්හි මුදල් ගලායාම් රු.1,943,411 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ගොඩනැගිලි සංවර්ධන ගිණුමෙන් (Building & Structures Rehabilitation) ගොඩනැගිලි ගිණුමට හා වෙනත් යටිතල පහසුකම් ගිණුමට (Other Infrastructure) මාරු කර තිබුණු වත්කම් ක්ෂය නොකිරීම හා ක්ෂය කිරීමේදී නිවැරදි ක්ෂය රේටය අනුගමනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය රු.750,694 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයෙහි 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේ දී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවා ද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි

සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වා ගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (අ) ඡේදයේ දැක්වෙන නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයන්ට යොමුව	නිරීක්ෂණය
1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය	අධ්‍යයන කටයුතු වලට අදාළ විභාග ප්‍රතිඵල මාස 03 ක් ඇතුළත නිකුත් කළ යුතු වුවද 2021 හා 2022 වර්ෂවල පවත්වා තිබුණු විභාග 13 ක ප්‍රතිඵල නිකුත් කිරීමේ ප්‍රමාද කාලය දින 26 සිට දින 360 ක් දක්වා කාල පරාසයක් ගෙන තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර නොමැති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

2.3 අනෙකුත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂයේදී කෙසෙල් හා කහ පැළ නිෂ්පාදනය කිරීම සඳහා රු.16,808,314ක පිරිවැයක් දරා තිබුණු අතර එම පිරිවැය ආවරණය වන පරිදි අලෙවි මිල තීරණය නොකිරීම හේතුවෙන් එම පැළ අලෙවි කිරීමෙන් රු.6,651,276 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ආ) 2014 හා 2015 වර්ෂවලදී ගොවීන්ගේ භාරකාර අරමුදල මඟින් ශිෂ්‍යයින්ට ලබාදී තිබුණු ණය මුදල් වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.685,790 ක ණය ගෙවීම ශිෂ්‍යයින් පැහැර හැර තිබුණි.

(ඇ) 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කෘෂි තාක්ෂණවේදී උපාධි පාඨමාලාව සඳහා බඳවා ගත් ශිෂ්‍යයින් 1637 කින් ශිෂ්‍යයින් 458 ක් එනම් මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 28 ක් පාඨමාලාව හැර ගොස් තිබූ අතර ශිෂ්‍යයින්ට ආර්ථික අපහසුතා පැවතීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

මුල්‍ය විගණනය - 2022
විගණකාධිපති වාර්තාව

ඔබගේ අංකය- SPCG/HM/C/FA/IARS/05/2022/01

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

විගණන වාර්තා වේ ඡේද අංකය	විගණන විමසුමෙහි සඳහන් කරුණ	විගණන විමසුම සඳහා පිළිතුරු
1.	**මූල්‍ය ප්‍රකාශන** **----------**	
1.2	**තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම** **----------**	
(අ)	ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.7,790,020 ක ලැබිය යුතු පාඨමාලා ගාස්තු ගිණුම්ගත කර නොතිබුණු අතර එම දෝෂය සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කර නොතිබුණු බැවින් ලැබිය යුතු ගිණුම් සහ සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන් මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	එකඟ නොවේ. 2022 මුල්‍ය වර්ෂයේ අවසන් දිනට හිමිකම් සහ ලැබියයුතු පාඨමාලා ගාස්තු නිවරදීව ගිණුම් ගත කර ඇත. **2021 වර්ෂය** 2021 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශය තුළ 1.4.2. අදායම් හඳුනාගැනීම් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම්(Accounting policy for Revenue recognition) අනුව ආයතනය විසින් පාඨමාලා ගාස්තු මුදල් පදනමට ගිණුම් ගත කරන බව අනාවරණය කර තිබූ අතර 2021 වර්ෂය වනතුරු නිවැරදිව අදාළ ගිණුම් කරන ප්‍රතිපත්තියට අනුකූලව ගිණුම් ගත කර තිබුණි. අදාල ප්‍රතිපත්තියට අනුව ලැබියයුතු අදායම් ගිණුම් ගත නොකරන අතර මුදලින් ලැබීම් පමණක් ගිණුම් ගත කරයි. මුදල් පදනමට ගිණුම් තැබීම සම්බන්ධයෙන් පහත හේතු කාරණා 2021 විගණන වාර්තාව තුළින් පහත පරිදි හෙළිදරව් කර තිබිණි. පාඨමාලා ගාස්තු එකතු කිරීම සඳහා ආයතනය සතුව වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන යන අතර සියලුම ශිෂ්‍ය ගාස්තු එම ගිණුමට බැර වේ.

		ශිෂ්‍යන් විසින් කරනු ලබන සෘජු තැන්පතු බැංකු පත්‍රිකා මගින් හඳුනාගනු ලැබේ. එලෙස හඳුනා ගත නොහැකි තැන්පතු බැංකු සැසඳුම් ප්‍රකාශය මගින් හඳුනා ගනු ලැබේ. එම නිසා ශිෂ්‍යන් විසින් ගෙවීම් කරනු ලැබුවද එවැනි තැම්පතු ශිෂ්‍යන්ගේ ලැබිය යුතු අගයන් ලෙස වාර්තා වේ. කොරෝනා වසංගත තත්වයත් සමඟ රට තුල ඇතිවූ ව්‍යසනකාරී සමාජීය සහ ආර්ථික වටපිටාව මත බැංකු පත්‍රිකා ආයතනය වෙත ලබාදීමට නොහැකි වීම හේතුකොට විශාල ප්‍රමාණයක් එලෙස ලැබිය යුතු ලෙස සටහන් විය. එම මුදල් වර්ෂය අවසානයේදී රිසිට් පතක් මගින් ආයතනයේ පොත් වලට ඇතුලත් කල අතර එලෙස මුදල් ලැබී තිබියදී ලැබිය යුතු ලෙස සටහන් කිරීමෙන් යථාර්ථවාදී නොවන ආදායම් ප්‍රමාණයක් සටහන් වනු ඇත. **අධ්‍යන වාරය ලියාපදිංචි නොකිරීම** දැනට ආයතනය තුල 2022 අධ්‍යන වාරය ලියාපදිංචි කිරීම සම්බන්දයෙන් කටයුතු කරන අතර 2021 වර්ෂයේ එම තොරතුරු නොලැබීම නිසා නිවැරදි ශිෂ්‍ය සංඛ්‍යාව හා ඔවුන්ගේ තොරතුරු නොමැතිව නිවැරදි උපචිත තීරණය කළ නොහැකි වීම. **පාඨමාලාව හැර යන තිබූ ප්‍රතිශතය** පාඨමාලාව හැර යන තිබූ අතර එහි ප්‍රතිශතය 50% ආසන්න වන අතර එවැනි තත්වයක් තුළ යථාර්තවාදී අගයන් නිර්ණය කල නොහැකි වීම. තවද ගිණුම් ගත කල යුතු බවට දක්වා ඇති රු.7,790,020 අගය තුළ මුලික ඇතුළත් වීම් (First intake) විස්තර අනුව සියලු ශිෂ්‍යන්ගෙන් අයවිය යුතු අගයන් ඇතුළත් වේ. එම අගය තුළින් අදාළ වර්ෂය වනවිට සනාථ කරගත් තොරතුරු පදනම් වී නොමැති නිසා එම අගයන් වාර්තා කර නොමැත. **2022 වර්ෂය.** 2021 වර්ෂයේ විගණකගේ නිර්දේශ මත පාඨමාලා ගාස්තු ගිණුම් තැබීමේ ප්‍රතිපත්තිය මුදල් පදනමේ සිට උපචිත පදනමට වෙනස් කිරීමක් සිදුකල අතර ඒ සම්බන්ධයෙන් 1.5.2. (b) හි අනාවරණය කර තිබේ. 2022 වර්ෂයේ සිට නිවැරදිව

		උපචිත පදනමට ගිණුම් ගත කර ඇති අතර 2022 මූල්‍ය වර්ෂයට හිමිකම් සහ ලැබිය යුතු පාඨමාලා ගාස්තු නිවැරදිව ගිණුම් ගත කර ඇත. විගනකගේද එකගතාවය මත හා ප්‍රායෝගික හා තාක්ෂණික නොගැලපීම් මත හෙළිදරව් කිරීම් වලද දක්වා ඇති පරිදි ගිණුම් කරන ප්‍රතිපත්තිය අනුගමනය කිරීම 2022 වර්ෂයේ සිට (Prospectively) සිදු කරන අතර ඒ සම්බන්ධ පැහැදිලි කිරීම් ප්‍රතිපති හෙළිදරව් කිරීම් වල දක්වා ඇති අතර පහත එම කරුණු නැවත ගොනු කරනු ලැබේ. *2021 වර්ෂය සඳහා ආදායම් හඳුනා ගැනීමේ ප්‍රතිපත්ති (Revenue Recognition principles) ආවරණය වීමට ප්‍රමාණවත් තොරතුරු නොමැති වීම නිසා උපයාගත් ආදායම් (Earned income) නිවැරදිව ගණනය කල නොහැකි වීම. ගණුදෙනුකරු / ශිෂ්‍යන් සමඟ ඇති කර ගත් ගිවිසුම්(Contract with customers) සහ Performance obligations හඳුනාගත නොහැකිවීම මත කාලානුරූපීව නිවැරදි ආදායම ගණනය කළ නොහැකිවීම. පහත ප්‍රායෝගික හා තාක්ෂණික නොගැලපීම් ඒ සම්බන්ධයෙන් ගොනු කළ හැක. 1. 2022 වර්ෂය වන තෙක් අධ්‍යන වාරය ලියාපදිංචි නොකිරීම හා ශිෂ්‍යන් පාඨමාලාවට ඇතුලත් වීම සම්බන්ධයෙන් පමණක් තොරතුරු පැවැතීම. 2. පාඨමාලාව හැර යන තිබූ අතර එහි ප්‍රතිශතය 50% ආසන්න වන අතර එවෙනි තත්වයක් තුළ යථාර්තවාදී අගයන් නිර්ණය කල නොහැකි වීම. 3. මාර්ගගත ගෙවීම් ක්‍රමයක් නොමැතිවීම සහ බැංකු තැන්පතු පත ආයතනය වෙත ලැබෙන තුරු ලැබියයුතු ලෙස සඳහන් වීම. **LKAS 08 හි නිර්දේශ** තවද LKAS 08 හි (Limitations on retrospective application) 25 අනු අංකය යටතේ ප්‍රයෝගික තත්වයන් මත සමුච්චිත අගයන් ගණනය කළ නොහැකි අවස්ථාවක පවත්නා වර්ෂයේ සිට (Prospectively) ගිණුම් කරන ප්‍රතිපත්තීන් අනුගමනය කිරීම සහ වෙනස් කිරීම් සිදු කිරීම සම්බන්ධයෙන් වූ නිර්දේශ උපුටා ගන්නා ලදි.

(ආ)	සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රාග්ධන ප්‍රදාන හා AHEAD ව්‍යාපෘතිය මගින් ලැබී තිබුණු රු.16,202,111ක ප්‍රදාන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුල හඳුනා ගැනීම හා මැනීම සිදුනොකර තිබුණි.	ඔබගේ ප්‍රකාශය හා එකඟ වේ. 2023 ගිණුම් වර්ෂයේ නිවැරදි මූල්‍ය ප්‍රකාශන ඉදිපත් කරනු ලැබේ.
(ඇ)	සමාලෝචිත වර්ෂය තුලදී ස්ථාවර වත්කම් හා ජීව තොග මිලදී ගැනීම් රු12,871,027 ක් වුවද මුදල් ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්හී මුදල් ගලායාම් යටතේ එම අගය රු.14,814,439 ක් ලෙස දක්වා තිබීමෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්හී මුදල් ගලායාම් රු.1,943,411 ක වැඩියෙන් දක්වා තිබුණි.	ඔබගේ ප්‍රකාශය හා එකඟ වේ. 2023 ගිණුම් වර්ෂයේ නිවැරදි මූල්‍ය ප්‍රකාශන ඉදිපත් කරනු ලැබේ.
(ඈ)	ගොඩනැගිලි සංවර්ධන ගිණුමෙන් (Building & Structures Rehabilitation) ගොඩනැගිලි ගිණුමට හා වෙනත් යටිතල පහසුකම් ගිණුමට (Other Infrastructure) මාරු කර තිබුණු වත්කම් ක්ෂය නොකිරීම හා ක්ෂය කිරීමේදී නිවැරදි ක්ෂය රේටය අනුගමනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය රු.750,694 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	ඔබගේ ප්‍රකාශය හා එකඟ වේ. 2023 ගිණුම් වර්ෂයේ නිවැරදි මූල්‍ය ප්‍රකාශන ඉදිපත් කරනු ලැබේ.
2.	**වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව** ---------- -	
2.2.2	**නීතිරීති/ විධානයන්ට යොමුව** ----------	
	1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අධ්‍යන කටයුතු වලට අදාළ විභාග ප්‍රතිඵල මාස 03 ක් ඇතුළත නිකුත් කළ යුතු වුවද 2021 හා 2022 වර්ෂවල පවත්වා තිබුණු විභාග 13 ක ප්‍රතිඵල නිකුත් කිරීමේ ප්‍රමාද කාලය දින 26 සිට දින 360 ත් දක්වා කාල පරාසයක් ගෙන තිබුණි.	මේ වන විට නියමිත කාලයට (මාස 03 ක් ඇතුළත) විභාග ප්‍රතිඵල නිකුත් කරනු ලබයි.
2.3	**අනෙකුත් කරුණු** ----------	
(අ)	සමාලෝචිත වර්ෂයේදී කෙසෙල් හා කහ පැළ නිෂ්පාදනය කිරීම සඳහා රු.16,808,314 ක පිරිවැයක් දරා තිබුණු අතර එම පිරිවැය ආවරණය වන පරිදි අලෙවි මිල තීරණය නොකිරීම හේතුවෙන් එම පැළ අලෙවි කිරීමෙන් රු.6,651,276 ක පාඩුවක් සිදු වී තිබුණි.	ඔබගේ නිරීක්ෂණ සමඟ එකඟවෙමි. කොවිඩ් 19 වසංගතය පැවති 2021 වර්ෂයේදී කහපැල නිෂ්පාදනය ආරම්භ කළ අතර, එවකට නිෂ්පදනය සඳහා ඇති ඉල්ලුම මත (පිටරටින් කහ ආනයනය සීමා කිරීම නිසා) නිෂ්පාදනය සිදුකර ගෙන යන ලදී. නමුත් 2022 වර්ෂයේදී කහපැල සඳහා ඇති ඉල්ලුම සාපේක්ෂව ඉතා අඩු වූ අතර, නිෂ්පාදනයන් අලෙවි කර ගැනීමේ දුෂ්කරතාවයන්ට මුහුණදීමට සිදුවූ නිසා අලෙවි ආදායම අඩුවීම සිදුවිය.

		2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේදී කෙසෙල් පැල නිෂ්පාදනය හා අලෙවි ආදායම සැලකිය යුතු ප්‍රතිශතයකින් වැඩිකර ගැනීමට පටක රෝපණ තාක්ෂණ අංශය සමත්විය. 2022 වර්ෂයේ තුන්වන කාර්තුවේදී පමණ ඇති වූ ඉන්ධන අර්බුදය මත ගැණුම්කරුවන් පැල මිලදී ගැනීම සඳහා නොපැමිණි අතර, එම නිසා අලෙවි ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය. එබැවින් කෙසෙල් පැල තුලින් වූ පාඩුව අවම කිරීම සඳහා පැලයක විකුණුම් මිල රුපියල් 10.00 කින් වැඩි කිරීම හා නිෂ්පාදනය වැඩි කිරීමට වර්තමානයේදී කටයුතු කෙරෙමින් පවතී.
(ආ)	2014 හා 2015 වර්ෂවලදී ගොවීන්ගේ භාරකාර අරමුදල මඟින් ශිෂ්‍යයින්ට ලබාදී තිබුණු ණය මුදල් වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.685,790 ක ණය පැහැර හැර තිබුණි.	ඒ සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ග ගෙන තිබුණි. **1.** ණය මුදල් නොගෙවා පැහැර හැර සිටි ශිෂ්‍යන් සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ නීති අංශය හරහා විගණන කමිටු නිර්දේශ ප්‍රකාරව Letter of Demands යොමු කරන ලදි .(ලිපි දිනය - 2022.03.04) **2.** රටෙහි එවකට පැවති තත්වය මත කොළඹ විශ්වවිද්‍යාලයේ නීති අංශය වෙත අදාළ ණය මුදල් නොගෙවා පැහර හැර සිටි ශිෂ්‍යන් සිදු කරන ලද ඉල්ලීම් මත විගණන කමිටු නිර්දේශ හා කළමණාකරන මණ්ඩලයේ අනුමැතිය මත මාස 06 ක සහන කාලයක් ලිඛිතව දැනුම් දෙන ලදී.(ලිපි දිනය - 2022.06.06) **3.** මාස 06 ක සහන කාලය ඉක්මයාමෙන් පසු ණය මුදල් නොගෙවා පැහර හැර සිටි ශිෂ්‍යන් සඳහා ණය නැවත ගෙවීම් සැලැස්ම ඉල්ලීම් කරමින් අවසන් නිවේදනයක් විගණන කමිටු නිර්දේශ ප්‍රකාරව යොමු කරන ලදි.(ලිපි දිනය - 2023.01.25)
(ඇ)	2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කෘෂි තාක්ෂණවේදී උපාධි පාඨමාලාව සඳහා බඳවා ගත් ශිෂ්‍යයින් 1637 කින් ශිෂ්‍යයින් 458 ක් එනම් මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 28 ක් පාඨමාලාව හැර ගොස් තිබූ අතර ශිෂ්‍යයින්ට ආර්ථික අපහසුතා පැවතීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.	පාඨමාලාව හැරයාමට ප්‍රධාන හේතුව ලෙස හඳුනාගෙන ඇත්තේ ආර්ථික අපහසුතා හේතුවෙන් පාඨමාලා ගාස්තු ගෙවීමට නොහැකි වීමයි.

ඔබගේ විමසුම සඳහා කරන ලද ඉහත දැක්වෙන සියලු පැහැදිලි කිරීම් නිවැරදි බවට මා විසින් පුද්ගලිකව සහතික කරමි.

මහාචාර්ය එම්.ඒ.ඒ.ඩී. අම්පිටියාවත්ත
අධ්‍යක්ෂ
කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය